වෙළුම I

# තන්මණ නගර සංවර්ධන සැලැස්ම

2019 - 2030



# හක්මන නගර සංවර්ධන සැලැස්ම

# 2019-2030

## වෙළුම I

නාගරික සංවර්ධන අධිකාරිය
“සෙත්සිරිපාය”
බත්තරමුල්ල
2019

# ලේඛන තොරතුරු

වාර්තාවේ මාතෘකාව : හක්මන නගර සංවර්ධන සැලැස්ම

සැලසුම් කලාප මායිම් (ප්‍රකාශයට පත් කරන ලද) : හක්මන නාගරික සංවර්ධන ප්‍රදේශය

ගැසට් අංකය : 1286/07

පාර්ශවකරුවන් : හක්මන නාගරික සංවර්ධන ප්‍රදේශය තුළ ජීවත් වන ජනතාව, හක්මන නගරය වෙත පැමිණෙන ජනතාව හා අදාල ආයතන

ඉදිරිපත් කරන ලද දිනය : 2019.07.26


ලේඛනයේ තත්ත්වය : අවසාන සැලැස්ම

ලේඛන ඉදිරිපත් කිරීමේ තොරතුරු

| පිටපත් අංකය | විස්තර | ඉදිරිපත් කල දිනය | නිකුත් කිරීම සඳහා අනුමැතිය |
|---|---|---|---|
| 1 | කෙටුම්පත | 2019.07.26 | |
| 2 | අවසාන | 2019.07.31 | |

මෙම වාර්තාව, බලයලත් පාර්ශවයන් විසින් නිකුත් කරනු ලබන අතර වාර්තාවේ සඳහන් අරමුණු සඳහා පමණක් භාවිතා කල යුතුය. මෙම වාර්තාවේ සඳහන් කරුණු වෙනත් පාර්ශවයන් විසින් හෝ වෙනත් අරමුණක් වෙනුවෙන් භාවිතා කිරිම සම්පූර්ණයෙන්ම තහනම් වේ. මෙම වාර්තාවේ සඳහන් කරුණු වෙනත් පාර්ශවයක් විසින් හෝ වෙනත් අරමුණක් වෙනුවෙන් යොදාගෙන ඇතිවන ප්‍රතිවිපාක සම්බන්ධයෙන් අධිකාරිය වගකියනු නොලැබේ. එමෙන්ම මෙම වාර්තාවේ සඳහන් දත්ත හෝ තොරතුරු වෙනත් පාර්ශවයක් වෙත ලබා ගැනිම හෝ වෙනත් අරමුණක් සඳහා යොදා ගැනිම මඟින් ඇතිවන බලපෑම් සම්බන්ධයෙන්ද අධිකාරිය වගකියනු නොලැබේ. මෙම වාර්තාව තුළ රහසිගත තොරතුරු ඇතුළත් වන අතර එය බුද්ධිමය දේපලක් වේ. බලයලත් පාර්ශවයේ අනුමැතියක් නොමැතිව වෙනත් පාර්ශවයක් වෙත ලබාදිම සපුරා තහනම් වේ.

# ගරු අමාත්‍යතුමාගේ පණිවුඩය



1978 හි අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරී පනත යටතේ නාගරික සංවර්ධන අධිකාරිය පිහිටුවනු ලැබූ අතර පසුගිය වසර 40 පුරාවටම නාගරික සංවර්ධන අධිකාරිය නාගරික ප්‍රදේශවල සැලසුම් සහගත නාගරික සංවර්ධනයක් සඳහා දායකත්වය සපයනු ලබයි. මෙම මොහොත වන විට නාගරික සංවර්ධන අධිකාරිය තම ගමන් මගෙහි තවත් එක් සන්ධිස්ථානයක් පසුකරමින් පුළුල් සංවර්ධන සැලසුම් දකුණු කලාපයේ සෑම නාගරික සංවර්ධන ප්‍රදේශයක් සඳහාම සකස් කිරීම සඳහා කටයුතු කොට ඇත.

මෙම සංවර්ධන සැලැස්ම මනා දැක්මක් ඔස්සේ සකස් කර ඇති අතර, ප්‍රදේශයේ ජනතාවට පමණක් නොව සමස්ථ ශ්‍රී ලාංකිකයින්ටම ප්‍රයෝජනවත් වන පරිදි පවතින සම්පත් විවිධ උපාය මාර්ග ඔස්සේ භෞතික ආර්ථික, සමාජයීය, හා පාරිසරික ප්‍රතිලාභ උපරිම අයුරින් ළඟාකර ගැනීමට හැකිවන සේ සකස් කිරීමට විශේෂ අවධානය යොමුකර තිබේ.

මෙම සංවර්ධන සැලැස්ම සකස් කිරීම සඳහා වෘත්තීයවේදීන්, විශේෂඥයන්, පාර්ශවකරුවන් හා ප්‍රජාවගේ පුළුල් උපදේශනය සමඟින් නවීන තාක්ෂණික ක්‍රමවේදයන් යොදාගෙන ඇත. ඒ අනුව, සභාපතිතුමා, අධ්‍යක්ෂ ජනරාල්, සැලසුම් කණ්ඩායම හා නොයෙක් ආකාරයේ මෙම කාර්ය සාර්ථක කර ගැනීමට උපකාර කල නාගරික සංවර්ධන අධිකාරියේ සියලුම නිලධාරීන්ගේ සේවය මම අගය කරමි. තවදුරටත් අදාල පළාත් පාලන ආයතන, රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතන හා සාමාන්‍ය ජනතාවගේ සහයෝගය හා දායකත්වය එක සමාන අයුරින් මෙම කාර්ය උදෙසා යෙදවීම තුලින් හක්මන සංවර්ධන සැලැස්ම සාර්ථකව ක්‍රියාත්මක කර ගැනීමට මග සැලසෙනු ඇත.

**පාඨලී චම්පික රණවක**
මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය

"සුහුරුපාය"
බත්තරමුල්ල.
2019............. දින

# ගරු සභාපතිතුමාගේ පණිවුඩය



වර්තමානය වන විට නාගරික සංවර්ධන අධිකාරිය ශ්‍රී ලංකාවේ නාගරික සැලසුම් සකස් කිරීමට හා එම සැලසුම් ක්‍රියාත්මක කිරීමට ඇති ප්‍රධානතම ආයතනය වන අතර නාගරික පරිසරය ගුණාත්මක ලෙස කළමණාකරනය කිරීමේ වගකීමද එසේම පැවරී ඇත. 1978 වර්ෂයේදී මෙම ආයතනය ස්ථාපිත කිරීමේ පරමාර්ථය වී ඇත්තේ ඒකාබද්ධ සැලසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම තුලින් නාගරික ප්‍රදේශවල හා එහි ජනතාවගේ පොදු යහපැවැත්ම ප්‍රවර්ධනය හා නියාමනය කිරීමයි.

1982 අංක 4 දරණ සංශෝධිත පනතෙහි 08 "අ" (1) දරණ වගන්තිය ප්‍රකාරව අමාත්‍යවරයා විසින් නාගරික සංවර්ධන ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශයන්හි සංවර්ධන සැලසුම් සකස් කිරීම අත්‍යාවශ්‍ය කරුණක්ව ඇත. හක්මන නාගරික සංවර්ධන ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස නාගරික සංවර්ධන අධිකාරිය හක්මන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙහි භෞතික, ආර්ථික, සාමාජීය හා පාරිසරික කරුණු සැලකිල්ලට ගෙන හක්මන නගර සංවර්ධන සැලැස්ම සකස් කර ඇත.

මෙම සැලැස්ම ක්‍රියාත්මක කිරීමේදී, අපගේ ගමන් මාර්ගය සුමට නොවන අතර, අභියෝග පිරුණු, අවිනිශ්චිතයන්ගෙන් සැදි විෂම බලාපොරොත්තුවලින් අපවිත්‍ර වූ කටුක ගමන් මාර්ගයක් බව අප අමතක කර නොමැත. නාගරික සංවර්ධන අධිකාරිය වර්තමානයේ අවශ්‍ය පද්ධති, මෙවලම්, හා ක්‍රමෝපායන් තුලින් සන්නද්ධව අභියෝගයන් සඳහා මුහුණ දීමටත්, අවිනිශ්චිතභාවයට ඔරොත්තු දීම තුලින් හක්මන නාගරික සංවර්ධන ප්‍රදේශය "හරිත නිම්නයේ නිවහන" බවට පත් කිරීම අධිෂ්ඨානය වී ඇත.

මෙම පුළුල් කාර්ය සාර්ථකව ඉටු කර ගැනීම සඳහා කැපවීමෙන් හා වෙහෙස මහන්සි වී වැඩකටයුතු කරන නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් කණ්ඩායම හා නන් අයුරින් සහයෝගය දැක්වූ සැමට මාගේ හෘදයාංගම කෘතවේදීත්වය පිරිනැමීම සඳහා මෙය අවස්ථාවක් කර ගන්නා අතර මෙම සැලසුම ක්‍රියාත්මක කිරීම සඳහා මේ හා සමාන සහයෝගය ඉදිරියටත් බලාපොරොත්තු වෙමි.

ආචාර්ය ජගත් මුණසිංහ
සභාපති, නාගරික සංවර්ධන අධිකාරිය.

2019 ................ දින

# ප්‍රාදේශීය සභා සභාපතිතුමාගේ පණිවුඩය



නාගරික සංවර්ධන අධිකාරිය මගින් හක්මන නාගරික සංවර්ධන ප්‍රදේශය සඳහා සංවර්ධන සැලැස්මක් පිළියෙල කිරිම පිළිබඳව මාගේ කෘතඥතාවය ප්‍රථමයෙන් ප්‍රකාශ කර සිටින අතර, එමඟින් හක්මන නාගරික සංවර්ධන ප්‍රදේශයට අනන්‍ය වූ ලක්ෂණ ආරක්ෂා වන පරිදි, විශේෂයෙන් පාරිසරික සම්පත් රැකගැනීමට ගෙන ඇති උත්සාහය සහ ඒ තුලින් ප්‍රදේශයේ ජනතාවට උපරිම ප්‍රතිලාභ ලබාගත හැකි පරිදි කටයුතු කර තිබීම ප්‍රශංසනීය වේ.

මෙම සංවර්ධන සැලැස්ම සකස් කිරිමේදී පොදු මහජනතාව නියෝජනය කරමින් අප විසින් ඉදිරිපත් කරන ලද යෝජනා හා අදහස් පිළිබඳව ද අවධානය යොමුකර තිබීම මා අගය කරන අතර, සැලැස්ම ක්‍රියාත්මක කිරීම තුලින් 2030 වර්ෂය වන විට හක්මන නගරය භෞතික, ආර්ථික, සාමාජීය හා පාරිසරික වශයෙන් විධිමත්ව නගා සිටුවමින් නිකසළ හරිත පුරවරයක් කරා අප යන ගමනට ඔබ ගෙන ඇති ප්‍රයත්නය පිළිබඳව මා ඇතුළු අප ප්‍රාදේශීය සභාවේ සුභාශිංෂණ පළකර සිටිමි.

සභාපති

ප්‍රාදේශීය සභාව

හක්මන.

2019.03.28 දින

# පූර්විකාව

වර්තමානයේදී හක්මන නගරය හා තදාසන්න නගර වල ඇතිවන සංවර්ධනය හේතුවෙන් පැනනගින අභියෝගයන්ට මුහුණ දීම සඳහා විධිමත් සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය මතුවී ඇත. ඒ අනුව, වර්තමානයේ හක්මන නගරය තුළ පවතින ආර්ථික, සමාජීය හා පාරිසරික තත්ත්වය සැලකිල්ලට ගෙන පවත්නා නීලහරිත පරිසරය ආරක්ෂා කර ගනිමින් නේවාසික නගරයක් ලෙස විධිමත් සංවර්ධනයක් කරා ළඟාවිය හැකි අයුරින් මෙම සැලැස්ම සකස් කොට ඇත.

එම සැලැස්ම සඳහා 1978 අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරී පනතට සංශෝධනයක් ලෙස ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ පාර්ලිමේන්තුව මඟින් සම්මත වූ 1982 අංක 04 දරණ නාගරික සංවර්ධන අධිකාරී පනතේ 08 "අ" (1) හා (2) දරණ වගන්ති ප්‍රකාරව නීතිමය පදනම සපයා ඇත.

එම පනතෙහි 08 "ඊ" වගන්තිය ප්‍රකාර හක්මන නාගරික සංවර්ධන ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම මහානගර හා බස්නාහිර සංවර්ධන ගරු අමාත්‍යතුමා විසින් අනුමත කරන ලද අතර, එම සැලැස්ම 1978 අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරී පනතේ අංක 03 දරණ වගන්තිය ප්‍රකාරව ගරු ඇමතිතුමා විසින් 2003 අප්‍රේල් 29 දින අංක 1286/7 දරණ අති විශේෂ ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත් කරන ලද හක්මන නාගරික සංවර්ධන ප්‍රදේශය සඳහා .................. දින සිට බල පැවැත්වේ.

සංවර්ධන සැලැස්මේ මූලිකාංග වල අවශ්‍ය සංශෝධනයන් කිරීමට නාගරික සංවර්ධන අධිකාරී බලයට යටත්ව 2030 වර්ෂය දක්වා මෙම සංවර්ධන සැලැස්ම වලංගු වේ. සංවර්ධන සැලැස්ම වෙළුම් 02කින් සමන්විත වේ. පළමු වෙළුමේ අන්තර්ගතය වන්නේ හක්මන නාගරික ප්‍රදේශයේ වර්තමාන තත්ත්වය සහ යෝජිත සංවර්ධන සැලැස්ම සමඟ එයට අන්තර්ගත දැක්ම, අරමුණු, පරමාර්ථ හා උපක්‍රම සහ ඊට අදාළ කලාපීකරණ නියමතාවන් වේ. දෙවන වෙළුමෙහි අන්තර්ගත වන්නේ සැලසුම් හා ගොඩනැගිලි නියමතාවන්ය. එම නියමතාවන් සංවර්ධන කටයුතු විධිමත් කිරීම හා අනවසර ඉදිකිරීම් පාලනය කිරීමේ උපක්‍රමයක් ලෙස යොදා ගැනෙනු ඇත.

**කේ.ජී. කළ්‍යාණි ඉන්දිකා**
නියෝජ්‍ය අධ්‍යක්ෂ (සැලසුම්)
නාගරික සංවර්ධන අධිකාරිය,
මාතර දිස්ත්‍රික් කාර්යාලය.

# ස්තුතිය

හක්මන නාගරික සංවර්ධන ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම නාගරික සංවර්ධන අධිකාරියේ මාතර දිස්ත්‍රික් කාර්යාලය මඟින් සිදුකරන ලද ව්‍යාපෘතියකි. මෙම සැලැස්ම සම්පාදනය කිරීමේදී අවශ්‍ය රාජ්‍ය දායකත්වය, මඟපෙන්වීම, අවශ්‍ය පහසුකම් හා සහයෝගය ලබාදුන් ගරු මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමාට නාගරික සංවර්ධන අධිකාරිය වෙනුවෙන් විශේෂ ස්තූතිය පිරිනමන අතර, මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් විසින් මෙම සැලැස්ම සාර්ථක කරගැනීමට විවිධාකාරයෙන් දක්වන ලද සහයෝගය වෙනුවෙන් අපගේ කෘතඥතාවය පිරිනමනු ලැබේ.

හක්මන ප්‍රාදේශීය සභාවේ ගරු සභාපති ඩබ්.පී. ක්‍රිෂාන් අනුරාධ ප්‍රේමරත්න මැතිතුමා ප්‍රමුඛ ප්‍රාදේශීය සභා මන්ත්‍රීන් හා නිලධාරීන්ද, හක්මන ප්‍රාදේශීය ලේකම් ඇතුළු ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩලය විසින්ද මෙම සැලැස්ම පිළියෙල කිරීමේදී දක්වන ලද සහයෝගය ස්තූති පූර්වකව සිහි කරමු.

මෙම සැලැස්ම සාර්ථක කරගැනීම සඳහා රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනවල නිලධාරීන් විසින් අප වෙත ලබාදුන් සහයෝගයද මහඟු පිටුවහලක් වූ බවට අප සිහිපත් කරමු.

තවද, මෙම සැලැස්ම සම්පාදනය කිරීමේදී තම කාලය හා විශේෂඥ දැනුම ලබාදුන් නාගරික සංවර්ධන අධිකාරියේ ගරු සභාපති, ජගත් මුණසිංහ මහතාට හෘදයාංගම ස්තූතිය පිරිනමන අතරම, නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් එස්.එස්.පී. රත්නායක මහතාට, අතිරේක අධ්‍යක්ෂ ජනරාල් කේ.ඒ.ඩී. චන්ද්‍රදාස මහතාට, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම්) ඩී.එම්. රණතුංග මහතාට, සංවර්ධන සැලැස්ම සම්පූර්ණ වනතුරු ඒ සඳහා නිරන්තර සහයෝගය ලබාදුන් මෙම අධිකාරියේ දකුණු පළාත් අධ්‍යක්ෂ කේ.එච්.එම්.ඩබ්.කේ. අබේරත්න මහතාට, සංවර්ධන සැලසුම් අංශයේ අධ්‍යක්ෂ ලලිත් විජයරත්න මහතාට සැලසුම් කණ්ඩායමේ විශේෂ කෘතඥතාවය පිරිනැමේ.

එමෙන්ම, මෙම සැලැස්ම සාර්ථකව නිම කිරීමට නන් අයුරින් සහයෝගය දැක්වූ නාගරික සංවර්ධන අධිකාරියේ සංවර්ධන සැලසුම් අංශය, භූගෝලීය තොරතුරු පද්ධති අංශය සහ පරිසර භූදර්ශන හා පහසුකම් කළමනාකරණ අංශය ඇතුළු අප වෙත සහාය දැක්වූ අනෙකුත් සියලුම සේවක මහත්ම මහත්මීන්ටද අපගේ විශේෂ ස්තූතිය පිරිනැමේ. තවද, මෙම සැලැස්ම සකස් කිරීම සඳහා නන් අයුරින් සහයෝගය ලබාදුන් මාතර දිස්ත්‍රික් කාර්යාලයේ කාර්ය මණ්ඩලයේ සියලු දෙනාටම අපගේ විශේෂ ස්තූතිය පිරිනැමේ.

**කේ.ජී. කළ්‍යාණි ඉන්දිකා**
නියෝජ්‍ය අධ්‍යක්ෂ (සැලසුම්)
නාගරික සංවර්ධන අධිකාරිය,
මාතර දිස්ත්‍රික් කාර්යාලය

# පටුන


ලේඛන තොරතුරු ..... ii

ගරු අමාත්‍යතුමාගේ පණිවුඩය..... iii

ගරු සභාපතිතුමාගේ පණිවුඩය ..... iv

ප්‍රාදේශීය සභා සභාපතිතුමාගේ පණිවුඩය ..... v

පූර්විකාව..... vi

ස්තුතිය..... vii

සිතියම් ලේඛනය..... x

වගු ලේඛනය ..... xi

රූප සටහන් ලේඛනය..... xii

පළමු කොටස..... xiii

1. හැඳින්වීම ..... 1

1.1. සංවර්ධන සැලැස්මේ පසුබිම ..... 1

1.2. සැලසුම් කණ්ඩායම ..... 1

1.3. විෂය පථය ..... 3

1.4. සැලසුම් ක්‍රියාවලිය..... 4

2.0 මූලික අධ්‍යයනය ..... 6

2.1. අධ්‍යයන කලාපය ..... 6

2.2. සැලසුම් සන්දර්භය හා වර්තමාන තත්ත්වය..... 8

2.3. සැලසුම් ප්‍රදේශය නිර්ණය කිරීම ..... 14

2.3.1. ක්‍රියාකාරී ප්‍රදේශය ..... 14

2.3.2. භූගෝලීය ලක්ෂණ ..... 15

2.3.3. පරිපාලන ප්‍රදේශය..... 15

3. සංවර්ධන සැලැස්මෙහි අවශ්‍යතාවය ..... 17

දෙවන කොටස..... 19

4. සංවර්ධන සැලසුම් රාමුව..... 23

4.1. දැක්ම..... 23

4.2. දැක්මේ ප්‍රකාශනය..... 24

4.3. අරමුණු ..... 25

4.4. පරමාර්ථ ..... 25

5. ශක්තීන්, දුර්වලතා, අවස්ථා හා තර්ජන විශ්ලේෂණය ........ 26

6. සංවර්ධන සැලැස්ම ........ 44

**6.1.** සංකල්පිත සැලැස්ම ........ 44

6.2. යෝජිත ඉඩම් පරිහරණ සැලැස්ම ........ 46

6.3. භෞතික හා සාමාජීය අපරව්‍යුහ පහසුකම් සංවර්ධන උපක්‍රම ........ 51

**6.3.1.** යෝජිත සේවා සැලැස්ම ........ 51

6.3.2 යෝජිත ප්‍රවාහන සැලැස්ම ........ 56

6.3.3 යෝජිත ජල සැපයුම ........ 60

6.3.4 යෝජිත විදුලි සැපයුම ........ 61

6.3.5 මලාපවහනය හා ජලාපවහනය ........ 63

6.3.6 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය ........ 63

6.4 යෝජිත ආර්ථික සංවර්ධන උපක්‍රම ........ 66

6.5 පාරිසරික තිරසර උපාය මාර්ග ........ 71

6.5.1 සංරක්ෂණ ප්‍රදේශ ........ 71

**6.5.2.** භූදර්ශන කළමනාකරණ උපක්‍රම ........ 73

6.5.3. හක්මන නාගරික ප්‍රදේශයේ යෝජිත ආපදා අවම කිරීමේ සැලැස්ම ........ 73

6.5.4 හක්මන නාගරික ප්‍රදේශය සඳහා වන යෝජිත පොදු එළිමහන් විනෝද කටයුතු පිළිබඳ සැලැස්ම .... 73

6.5.5 කෘෂිකාර්මික සැලැස්ම ........ 78

6.6. සංස්කෘතික හා උරුමයන් කළමනාකරණ උපාය මාර්ග ........ 79

**6.7** ක්‍රියාත්මක කිරීමේ උපක්‍රම ........ 80

6.7.1 උපාය මාර්ගික ව්‍යාපෘති හා අනෙකුත් ව්‍යාපෘති ........ 81

6.7.2 ආයතනික රාමුව ........ 105

ඇමුණුම් ........ 107

ඇමුණුම අංක 01 ........ 108

ඇමුණුම අංක 02 ........ 109

ඇමුණුම අංක **03** ........ 112

ඇමුණුම අංක 04 ........ 115

# සිතියම් ලේඛනය

සිතියම් අංක 01: අධ්‍යයන ප්‍රදේශය : හක්මන නාගරික සංවර්ධන ප්‍රදේශය - 2017 ........................................... 7
සිතියම් අංක 02 : ජාතික භෞතික සැලැස්ම 2050 ........................................................................................ 10
සිතියම් අංක 03 : නාගරික මධ්‍යස්ථානවල අනාගත ධූරාවලිය : 1996 ............................................................ 11
සිතියම් අංක 04: හක්මන නගරයේ ස්ථානීය පිහිටීම ........................................................................................ 12
සිතියම් අංක 05: සැලසුම් ප්‍රදේශය : හක්මන නාගරික සංවර්ධන ප්‍රදේශය (2017) ............................................ 16
සිතියම් අංක 06 : ආපදා ව්‍යාප්ත ප්‍රදේශ : හක්මන නාගරික සංවර්ධන ප්‍රදේශය ................................................ 27
සිතියම් අංක 07 : මාතර දිස්ත්‍රික් ජල ගැලීම් ව්‍යාප්ත ප්‍රදේශය ........................................................................ 28
සිතියම් අංක 08 : ප්‍රාදේශීය සම්බන්ධතාවය - 2017 ........................................................................................ 30
සිතියම් අංක 09 : සම්බන්ධකතා විශ්ලේෂණය - 2017 ........................................................................................ 31
සිතියම් අංක 10 : සංවේදීතා විශ්ලේෂණය : හක්මන නාගරික සංවර්ධන ප්‍රදේශය - 2017 ................................ 39
සිතියම් අංක 11 : යෝජිත ඉඩම් පරිහරණ සැලැස්ම : හක්මන නාගරික සංවර්ධන ප්‍රදේශය -2030..................... 48
සිතියම් අංක 12 : අධ්‍යාපන සේවා පෝෂක ප්‍රදේශය : හක්මන නාගරික සංවර්ධන ප්‍රදේශය ............................. 55
සිතියම් අංක 13 : ප්‍රවාහන සැලැස්ම : හක්මන නාගරික සංවර්ධන ප්‍රදේශය ..................................................... 59
සිතියම් අංක 14 : විදුලි සැපයුම : හක්මන නාගරික සංවර්ධන ප්‍රදේශය ........................................................... 62
සිතියම් අංක 15 : යෝජිත ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ සැලැස්ම ..................................................................... 65
සිතියම් අංක 16 : යෝජිත සංවර්ධන ව්‍යාපෘති : හක්මන නාගරික සංවර්ධන ප්‍රදේශය (2030)............................ 68
සිතියම් අංක 17 : යෝජිත තෙත්බිම් කලාපීකරණ සැලැස්ම : හක්මන නාගරික සංවර්ධන ප්‍රදේශය (2030)......... 72
සිතියම් අංක 18 : පොදු එළිමහන් විවෘත භූමි සැලැස්ම : හක්මන නාගරික සංවර්ධන ප්‍රදේශය (2030) ................ 77

# වගු ලේඛනය


වගු අංක 01 : සැලසුම් ක්‍රියාවලිය ........ 4

වගු අංක 02 : "ස්වභාවදහමේ සුන්දරත්වය සුසැදි නේවාසික නගරයක් නිර්මාණය කිරීම" සඳහා ශක්තීන්, දුර්වලතා, අවස්ථා හා තර්ජන විශ්ලේෂණය ........ 26

වගු අංක 03 : ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රම - හක්මන නාගරික සංවර්ධන ප්‍රදේශය ........ 33

වගු අංක 04 : ආදායම් වියදම් විස්තරය - හක්මන ප්‍රාදේශීය සභාව ........ 33

වගු අංක 05 : "කෘෂිකර්මය පදනම් කරගත් සුරැකි නීල හරිත පරිසරය සුරැකීම" සඳහා ශක්තීන්, දුර්වලතා, අවස්ථා හා තර්ජන විශ්ලේෂණය ........ 36

වගු අංක 06 : රැකියා නියුක්තිය : හක්මන නාගරික සංවර්ධන ප්‍රදේශය - 2017 ........ 41

වගු අංක 07 : බෝ නොවන රෝග (මී උණ) ව්‍යාප්තිය : 2010, 2017 ........ 43

වගු අංක 08 : ජනගහනය හා නිවාස : හක්මන නාගරික සංවර්ධන ප්‍රදේශය ........ 51

වගු අංක 09 : රජයේ රෝහල් තොරතුරු : හක්මන නාගරික සංවර්ධන ප්‍රදේශය - 2016 ........ 52

වගු අංක 10 : පාසල් පිළිබඳ තොරතුරු : හක්මන නාගරික සංවර්ධන ප්‍රදේශය - 2016 ........ 53

වගු අංක 11 : ප්‍රවාහන තත්ත්වය: හක්මන නාගරික සංවර්ධන ප්‍රදේශය 2017 ........ 56

වගු අංක 12 : ජල අවශ්‍යතාව පුරෝකථනය : හක්මන නාගරික සංවර්ධන ප්‍රදේශය - 2030 ........ 60

වගු අංක 13 : දෛනික සංසරණ ජනගහනය සඳහා ජල අවශ්‍යතාවය - 2030 ........ 60

වගු අංක 14 : දෛනික ජල අවශ්‍යතාවය : හක්මන නාගරික සංවර්ධන ප්‍රදේශය ........ 61

වගු අංක 15 : දෛනිකව ජනනය වන ඝන අපද්‍රව්‍ය : හක්මන නාගරික සංවර්ධන ප්‍රදේශය ........ 64

වගු අංක 16 : ඍජු විනෝද පහසුකම් සපුරාගත හැකි ස්ථාන - හක්මන නාගරික ප්‍රදේශය ........ 74

වගු අංක 17 : පවතින සහ යෝජිත පොදු එළිමහන් විවෘතභූමි ප්‍රමාණය - හක්මන නාගරික බල ප්‍රදේශය ........ 75

# රූප සටහන් ලේඛනය


රූප සටහන් අංක 01 : අධ්‍යයන ප්‍රදේශය........................................................................................ 08

රූප සටහන් අංක 02 : භූමි පරිහරණ රටාව (2017)..........................................................................14

රූප සටහන් අංක 03 : දැක්මේ නිර්මාණය..........................................................................................22

රූප සටහන් අංක 04 : යටිතල පහසුකම් සංවර්ධනය, හක්මන නාගරික සංවර්ධන ප්‍රදේශය............................ 28

රූප සටහන් අංක 05 : ගොඩනැගිලිවල ඌණ භාවිතය, හක්මන නාගරික සංවර්ධන ප්‍රදේශය........................... 30

රූප සටහන් අංක 06 : හක්මන ප්‍රාදේශීය සභාවේ ආදායම් ව්‍යාප්තිය.............................................................. 32

රූප සටහන් අංක 07 : දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව ව්‍යාපෘතිය...................................................................33

රූප සටහන් අංක 08 : මාතර - කතරගම දුම්රිය මාර්ග ව්‍යාපෘතිය..................................................................33

රූප සටහන් අංක 09 : වාර්ෂික වර්ෂාපතන රටාව, හක්මන නාගරික සංවර්ධන ප්‍රදේශය (2017).......................35

රූප සටහන් අංක 10 : පවත්නා නීල හරිත පරිසරයෙහි සංයුතිය....................................................................36

රූප සටහන් අංක 11 : තෙත් බිම් පද්ධතිය..........................................................................................38

රූප සටහන් අංක 12 : කුඹුරු ඉඩම් ගොඩකිරීම නිසා ජලය බැසයාමට බාධා ඇතිවී ඇති ආකාරය....................40

රූප සටහන් අංක 13 : ගොඩකර ඇති සහ ගොඩකිරීමට යෝජිතව තිබූ කුඹුරු ඉඩම්....................................... 40

රූප සටහන් අංක 14 : සංකල්පනාත්මක සැලැස්ම........................................................................43

රූප සටහන් අංක 15 : යෝජිත ඉඩම් පරිහරණ සැලැස්මේ හරස්කඩ............................................................ 47-48

රූප සටහන් අංක 16 : සතිපොල ඉදිරිපිට භූමිය සංචාරක ආකර්ශනය සහිතව සංවර්ධනය කිරීම.................... 67

# පළමු කොටස

# 1. හැඳින්වීම

## 1.1. සංවර්ධන සැලැස්මේ පසුබිම

නගර සංවර්ධන සැලැස්ම නගරයක අනාගතය තීරණය කරන ප්‍රධාන සාධකයක් වේ. එම සැලැස්ම සකස් කිරිම සඳහා ප්‍රදේශයේ සමාජ, ආර්ථික, භෞතික හා පාරිසරික සාධක පාදක කරගනී.ශ්‍රී ලංකාවේ නගර සංවර්ධනයේ නියාමන ආයතනය ලෙස කටයුතු කරනු ලබන්නේ නාගරික සංවර්ධන අධිකාරිය වන අතර, මෙම අධිකාරියට 1978 අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරී පනත යටතේ ප්‍රකාශිත සංවර්ධන ප්‍රදේශ සඳහා නාගරික සැලසුම් සකස් කිරිමේ හා ක්‍රියාත්මක කිරිමේ බලතල පැවරී ඇත. ඉහත පනතේ 3 (අ) වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව යම්කිසි ප්‍රදේශයක් නාගරික සංවර්ධන ප්‍රදේශයක් ලෙස ගැසට් මඟින් ප්‍රකාශයට පත්කිරිමෙන් අනතුරුව එම ප්‍රදේශය සඳහා සංවර්ධන සැලැස්මක් සකස් කිරිම අධිකාරියෙහි ප්‍රධාන කාර්යභාරය වේ. ඒ සඳහා නීතිමය පදනම 1978 අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරී පනතට අනුව සකස් කරන ලද 1982 අංක 04 දරණ සංශෝධිත පනත මඟින් සපයා ඇත.

හක්මන නාගරික සංවර්ධන ප්‍රදේශය අංක 1286/7 දරණ 2003.04.29 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් නාගරික සංවර්ධන ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත්කර ඇත. ඒ සඳහා හක්මන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ නගර මධ්‍යයෙහි වර්ග කිලෝමීටර් 3.06ක භූමි ප්‍රමාණයකින් යුත් ග්‍රාම නිලධාරී වසම් 11ක කොටස් ඇතුලත් වේ. හක්මන නාගරික සංවර්ධන ප්‍රදේශය සඳහා මෙතෙක් සංවර්ධන සැලැස්මක් සකස් කර නොමැති බැවින් ප්‍රදේශයෙහි පවත්නා ආර්ථික, සාමාජීය, භෞතික හා පාරිසරික තත්ත්වයන් පිළිබඳ අධ්‍යයනයක් සිදුකරන ලදි. එමඟින් දැනට පවත්නා ගැටළු හා විභවතා හඳුනාගෙන එම විභවතා ප්‍රශස්ථ අන්දමින් භාවිතයට ගනිමින් වර්තමානයේ පවත්නා ගැටළු අවම කර ගැනීමත් අනාගතයේ ඇතිවන්නා වූ ගැටළු වලට විසඳුම් සෙවීමත් අරමුණු කොටගෙන මෙම සංවර්ධන සැලැස්ම සකස් කර ඇති අතර, එම සංවර්ධන සැලැස්ම වසර 2019 සිට 2030 දක්වා කාල පරාසය සඳහා බලාත්මක වේ.

## 1.2. සැලසුම් කණ්ඩායම

නාගරික සංවර්ධන අධිකාරියේ මාතර දිස්ත්‍රික් කාර්යාලය මඟින් පිළියෙල කරන ලද හක්මන නාගරික සංවර්ධන ප්‍රදේශය සඳහා සකස් කරන ලද සංවර්ධන සැලැස්ම පහත ආයතන වල අදහස් හා යෝජනා, නිර්දේශ පදනම් කරගෙන පිළියෙල කරන ලදි.

**ප්‍රධාන පාර්ශවකරුවන්**

1. හක්මන ප්‍රාදේශීය සභාව

**අනෙකුත් පාර්ශවකරුවන්**

1. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - හක්මන
2. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව - ගාල්ල
3. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය - හක්මන
4. මාර/ කෝංගල මහා විද්‍යාලය - හක්මන
5. මාර/මෙතෝදිස්ත මධ්‍ය මහා විද්‍යාලය
6. කලාප අධ්‍යාපන කාර්යාලය - හක්මන
7. රුහුණ විශ්ව විද්‍යාලය - මාතර
8. මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය - දකුණු පළාත් කාර්යාලය
9. මධ්‍යම පරිසර අධිකාරිය - මාතර
10. වාරි මාර්ග දෙපාර්තමේන්තුව - මාතර
11. පොල් වගා කිරීමේ මණ්ඩලය - මාතර
12. විදුලි බල මණ්ඩලය - මාතර
13. විවිධ සේවා සමූපකාර සමිතිය - හක්මන
14. ගොවිජන සේවා කාර්යාලය - හක්මන
15. ජාතික නිවාස සංවර්ධන අධිකාරිය - මාතර
16. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය - හක්මන
17. ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය - මාතර
18. මාර්ග සංවර්ධන අධිකාරිය - මාතර
19. අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව - මාතර
20. ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය
21. තැපැල් කාර්යාලය - හක්මන
22. ගොවි සංවිධාන - හක්මන

**සැලසුම් කණ්ඩායම**

1. සංවර්ධන සැලසුම් අංශය (නාගරික සංවර්ධන අධිකාරිය)
2. පාරිසරික හා භූ දර්ශන අංශය (නාගරික සංවර්ධන අධිකාරිය)
3. භූගෝලීය තොරතුරු පද්ධති අංශය (නාගරික සංවර්ධන අධිකාරිය)
4. පර්යේෂණ හා සංවර්ධන අංශය (නාගරික සංවර්ධන අධිකාරිය)

**සැලසුම් නිලධාරී මණ්ඩලය**

1. කේ.ජී. කළ්‍යාානි ඉන්දිකා (නියෝජ්‍ය අධ්‍යක්ෂ,)
2. ජේ.සී. වික්‍රමරත්න මයා( සහකාර අධ්‍යක්ෂ, මාතර දිස්ත්‍රික් කාර්යාලය)
3. සුනිල් කාරියවසම් (උපාය මාර්ගික සැලසුම්කරු, මාතර දිස්ත්‍රික් කාර්යාලය)
4. සී.ඩී. ලියනගේ (සැලසුම් නිලධාරී, මාතර දිස්ත්‍රික් කාර්යාලය)
5. එච්.ටී.පී. චාමලී (සැලසුම් නිලධාරී, මාතර දිස්ත්‍රික් කාර්යාලය)
6. ලාලනී චන්ද්‍රලතා (සැලසුම් නිලධාරී, මාතර දිස්ත්‍රික් කාර්යාලය)
7. බී.පී. අබේගුණරත්න (සැලසුම් නිලධාරී, මාතර දිස්ත්‍රික් කාර්යාලය)
8. සී.කේ.එස්. යාපා (සැලසුම් නිලධාරී, මාතර දිස්ත්‍රික් කාර්යාලය)
9. ජේ.ඕ.බී. ජීවන්දර (සහකාර සැලසුම් නිලධාරී, මාතර දිස්ත්‍රික් කාර්යාලය)

## 1.3. විෂය පථය

හක්මන නගරයෙහි ප්‍රධාන මාර්ග, කාණු හා පදික වේදිකා සමඟ සංවර්ධනය කර ඇති අතර, ප්‍රදේශය තුල 100% ක නල ජල සැපයුම හා විදුලිය සැපයුම සිදුකර ඇත. වර්තමානය වන විට සතිපොළ අංග සම්පූර්ණව ඉදිකර අවසන් කර ඇත. මේ අනුව නගරය තුල අපරව්‍යූහ පහසුකම් නේවාසික හා සංසරණ ජනයාට ප්‍රමාණවත් අයුරින් පවතින බව සිදුකරන ලද අධ්‍යයනයේදී තහවුරු විය.

එසේම නගරයෙහි ළමා උද්‍යානයක් හා අක්කර 05 ක පමණ මහජන ක්‍රීඩාංගනයක්, පුස්තකාලයක් හා ආසන 500 ක නගර ශාලාවක් ඉදිකර ඇත. ඒ අනුව නාගරික හා පර්යන්ත ජනයා සඳහා අවශ්‍ය විවේක හා විනෝද කටයුතු සඳහා වන පහසුකම් ද සම්පූර්ණ වී ඇත. කෙසේ වුවද, යෝජිත ජන සංඛ්‍යා පුරෝකථනය හා අපේක්ෂිත සංවර්ධනය අනුව පාරිසරික හා භූ දර්ශන සැලැස්ම මඟින් විවේක හා විනෝද කටයුතු සඳහා සුදුසු ස්ථාන හඳුනාගෙන ඇත.

නාගරික ප්‍රදේශයේ ප්‍රධාන ශක්තිය වන්නේ නගර මධ්‍යයේ හෙක්ටයාර් 113 හෙවත් 37% භූමි ප්‍රදේශයක් පුරා ව්‍යාප්තව ඇති වී වගාව සහිත තෙත් බිම් පරිසර පද්ධතියයි. මෙම කුඹුරු ඉඩම් ප්‍රමාණය වාර්ෂිකව විවිධ සංවර්ධන කටයුතු සඳහා ගොඩකරන බව ක්ෂේත්‍ර සමීක්ෂණයේදී මෙන්ම පාර්ශවකරුවන්ගේ සාකච්ඡාවේදී පැහැදිලි වූ කරුණකි. ඒ අනුව, කුඹුරු ඉඩම් ගොඩකිරීමේ ගැටළුව අවම කිරීම කෙරෙහි මෙම සැලැස්ම මඟින් අවධානය යොමුකර ඇත.

තවද, මුළු භූමියෙන් 37% ක් වන කුඹුරු ඉඩම් නාගරික ප්‍රදේශයෙහි පවතින විභවතාවයක් ලෙස හඳුනාගෙන ඇත. මෙම කුඹුරු ඉඩම් සාම්ප්‍රදායික කෘෂිකර්මාන්තය පාදක කරගත් සංචාරක කර්මාන්තය සඳහා යොදාගැනීමටත් පවතින කුඹුරු හා තෙත් බිම් පද්ධතිය එම ප්‍රමාණයෙන්ම පවත්වා ගැනීමත් පිළිබඳව මෙහිදී ප්‍රමුඛ අවධානයට ලක්කර ඇත.

එසේම, නගරය ප්‍රධාන මාර්ග හමුවන මංසන්ධියක පිහිටීමත්, දක්ෂිණ අධිවේගී මාර්ගය සහ මාතර - කතරගම දුම්රිය මාර්ග ව්‍යාපෘතීන්හි බලපෑමත් මත මෙම නගරය නේවාසික නගරයක් ලෙස සංවර්ධනය කිරිමට අවශ්‍ය භෞතික, පාරිසරික හා සාමාජීය පසුබිම සැලසීමත් කෙරෙහි මෙම සැලැස්ම මඟින් අවධානය යොමු කර ඇත.

## 1.4. සැලසුම් ක්‍රියාවලිය

හක්මන නාගරික සංවර්ධන ප්‍රදේශය සඳහා සංවර්ධන සැලැස්ම සැකසීම 2017 වර්ෂයේ ජුනි මාසයේදී ආරම්භ කරන ලදි. එහි සැලසුම් ක්‍රියාවලිය පහත පරිදි දැක්විය හැකිය.

**වගු අංක 01 : සැලසුම් ක්‍රියාවලිය**

| | |
|---|---|
| **පසුබිම් අධ්‍යයනය** | අධ්‍යයන ප්‍රදේශය පිළිබඳව රචිත ග්‍රන්ථ, සඟරා, පුවත්පත් හා වෙනත් ප්‍රකාශන අධ්‍යයනය කිරිම.<br>රාජ්‍ය ආයතන මඟින් ආර්ථික, සමාජීය හා භෞතික තොරතුරු පිළිබඳ ද්විතීක දත්ත ලබාගැනීම.<br>භූමි පරිහරණ රටාව පිළිබඳ ක්ෂේත්‍ර සමීක්ෂණ සිදුකිරිම. |
| **විෂය පථය** | හක්මන නගරය ආශ්‍රිත ක්‍රියාත්මක වී ඇති හා යෝජිත සංවර්ධන ව්‍යාපෘති පිළිබඳව සහ නගරයට ආසන්නව පිහිටි අධිවේගී මාර්ගයෙහි අන්තර් හුවමාරු මධ්‍යස්ථාන ආශ්‍රිතව හා මාතර - කතරගම දුම්රිය මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය ආශ්‍රිතව බෙලිඅත්ත හා යටියන නගරවල සිදුවන සංවර්ධනය පිළිබඳව අධ්‍යයනය කරන ලදි. |
| **ගැටළු හා විභවතා හඳුනාගැනීම** | අධ්‍යයන ප්‍රදේශය තුල ආර්ථික, සාමාජීය, භෞතික හා පාරිසරික අංශයන්හි පවත්නා ගැටළු හඳුනා ගන්නා ලදි. මේ සඳහා නගරයේ ඇති එක් එක් ආයතනයන්ගේ සහභාගිත්වය ලබාගැනීමට 2017.12.12 දින පාර්ශවකරුවන්ගේ හමුවක් මාතර දී පවත්වන ලදි. |
| **දැක්ම අරමුණු හා පරමාර්ථ හඳුනාගැනීම** | ප්‍රදේශය තුළ පවත්නා සංවර්ධන විභවතාවයන්ගෙන් මනා ලෙස ප්‍රයෝජන ගැනීමටත් ප්‍රදේශය තුළ ඇති සංවර්ධනයේ ගැටළුකාරී තත්ත්වයන් මඟහරවා ගනිමින් පාරිසරික, ආර්ථික, සමාජීය හා භෞතික අංශයන්හි සමබර සංවර්ධනය තුළින් නගරයේ දියුණුව කරා රැගෙනයාම සඳහා අවශ්‍ය දැක්ම ගොඩනඟන ලද අතර, දැක්ම සාක්ෂාත් කරගැනීමට ඉලක්ක හා අරමුණු සකස් කරන ලදී. |
| **විස්තරාත්මක විශ්ලේෂණය** | සංවර්ධන සැලැස්මේ දැක්ම ලඟාකරගැනීම සඳහා අරමුණු හා පරමාර්ථ සාක්ෂාත් කරගත යුතුය. ඒ සඳහා සංවර්ධන ප්‍රදේශයේ පවත්නා ශක්තීන්, දුර්වලතා, අවස්ථා හා අවහිරතා ඉතා සවිස්තරාත්මකව විශ්ලේෂණය කරන ලදි. |

| | |
|---|---|
| **සංවර්ධන සැලැස්මේ උපාය මාර්ග ගොඩනැගීම** | ඉහත සඳහන් කරන ලද සවිස්තරාත්මක විශ්ලේෂණයන්ගේ ප්‍රතිඵල ප්‍රමුඛතා ගත කරමින් සංවර්ධන සැලැස්මේ ඉලක්ක ලඟා කරගැනීම සඳහා අරමුණු හඳුනාගන්නා ලදී. එම අරමුණු මඟින් ප්‍රදේශයේ පවතින සංවර්ධන විභවතාවන් නියමිත කාලයක් තුළදී නියමිත ප්‍රමාණයන්ගෙන් වැඩිදියුණු කරගැනීමටත්, ප්‍රදේශය තුළ පවතින ගැටළුකාරී තත්ත්වයන් මඟහරවාගනිමින් අපේක්ෂිත කාලය තුළ ප්‍රදේශය සංවර්ධනය කරා ගෙන යාම සඳහාත් අරමුණු සකස් කරනු ලැබීය. සංවර්ධන සැලැස්මේ ඉලක්ක හා අරමුණු තුළින් දැක්ම ලඟා කරගත යුතු ආකාරය විශ්ලේෂණය කරන ලදී. ඉන් අනතුරුව උපාය මාර්ග සැලසුම් සකස් කරන ලද අතර, ක්‍රියාකාරී ව්‍යාපෘති හඳුනාගන්නා ලදී. |
| **සැලසුම් රෙගුලාසි පිළියෙල කිරීම** | සංවර්ධන සැලැස්ම බලාත්මක කිරීම සඳහා අවශ්‍ය ගොඩනැගිලි ඉදිකිරීම සම්බන්ධ නීති හා රෙගුලාසි, ඉඩම් පරිහරණයන් සම්බන්ධයෙන් වන නීති හා රෙගුලාසි ද සංවර්ධන සැලැස්මේ දැක්ම කරා ලඟාවීම සඳහා දැනට හඳුනාගත් ගැටළු හා ඉදිරියේදී උද්ගතවේයැයි විශ්ලේෂණය මඟින් අපේක්ෂා කරනු ලබන ගැටළු ද අවම කරගැනීම සඳහා නීත්‍යානුකූල රාමුවක් ඇති කිරීමට මෙහිදී කටයුතු කරන ලදී. |
| **පළාත් පාලන ආයතනයේ එකඟතාවය** | සකස් කරන ලද දළ සංවර්ධන සැලැස්ම සඳහා මහජන අදහස් ලබාගැනීම සඳහා අදාල පළාත් පාලන ආයතනයට ඉදිරිපත් කර ඔවුන්ගේ අදහස් හා යෝජනා ලබාගැනිමට දින 60ක කාලයක් ලබාදී මහජන අදහස් හා පළාත් පාලන ආයතනයේ යෝජනා අනුව අවශ්‍ය සංශෝධනයන් සිදු කරනු ලැබේ. |
| **සංවර්ධන සැලැස්ම ප්‍රධාන සැලසුම් කමිටුවට ඉදිරිපත් කිරීම** | පළාත් පාලන ආයතනයේ අදහස් හා යෝජනා ලබාගැනීමෙන් පසු නැවත සංශෝධනය කරන ලද සංවර්ධන සැලැස්ම අධිකාරියේ ප්‍රධාන සැලසුම් කමිටුවට ඉදිරිපත් කර අවශ්‍ය උපදෙස් හා යෝජනා ලබාගැනීම සිදු කරන ලදී. |
| **අනුමැතිය හා ප්‍රකාශයට පත් කිරීම** | නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් කමිටුවෙන් ලද උපදෙස් පිළිබඳ අවධානය යොමු කරමින් සංශෝධිත සැලැස්මේ කෙටුම්පත නීත්‍යානූකූල සැලැස්මක් බවට ප්‍රකාශයට පත් කිරීම. |


# 2.0 මූලික අධ්‍යයනය

## 2.1. අධ්‍යයන කලාපය

හක්මන නගරය දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ නැගෙනහිර මායිමට වන්නට මාතර - මිද්දෙනිය ප්‍රධාන මාර්ගයෙහි මාතර නගරයේ සිට කිලෝමීටර් 23.0 ක් දුරින් පිහිටා ඇත. හක්මන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය ග්‍රාම නිලධාරී වසම් 34කින් හා වර්ග කිලෝමීටර් 53.8 ක භූමි ප්‍රමාණයකින් සමන්විත වන අතර, 2017 වර්ෂයේ මුළු ජනගහනය 34,816ක්ද, පවුල් 9720 ක්ද වේ. (සම්පත් පැතිකඩ - 2017, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, හක්මන)

මෙම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වර්ග කිලෝමීටර් 13.34 කින් යුක්ත ප්‍රදේශය අධ්‍යයන ප්‍රදේශය ලෙස තෝරා ගෙන ඇති අතර, එයට බෙරුවේවෙල (293සී), ගම්මැදපිටිය(286සී), කැබිලියපොල දකුණ (284ඒ), කෝංගල මධ්‍යම (295බී), කෝංගල නැගෙනහිර (295), කෝංගල දකුණ (295සී), කෝංගල බටහිර (295ඒ), ලාල්පෙ (294බී), මුරුතමුරය (293), මුරුතමුරය බටහිර (293බී), මුරුතමුරය නැගෙනහිර (293ඒ), උඩුපීල්ලෙගොඩ නැගෙනහිර (294), උඩුපීල්ලගොඩ බටහිර (294ඒ), වේපතඉර දකුණ (283ඒ), වේපතඉර බටහිර(283බී) යන ග්‍රාම නිලධාරී කොට්ඨාශ 15 අයත් වේ.

**සිතියම් අංක 01: අධ්‍යයන ප්‍රදේශය : හක්මන නාගරික සංවර්ධන ප්‍රදේශය - 2017**




**යොමුව**

- ජල ප්‍රදේශ
- කුඹුරු බිම්

N W E S

1:22,000

**සිතියම් අංක : 01**

| | |
|---|---|
| සකස් කළ දිනය | : 2018 දෙසැම්බර් 10 |
| යාවත්කාලීන කලේ | : 2019 |
| මූලාශ්‍රය | : නා.සං.අ. මාතර කාර්යාලය |
| සකස් කළේ | : ජේ.ඕ.බී. ජීවන්දර |


නාගරික සංවර්ධන අධිකාරිය

**අධ්‍යයන ප්‍රදේශය : හක්මන නාගරික සංවර්ධන ප්‍රදේශය - 2017**

හක්මන නාගරික සංවර්ධන සැලැස්ම (2019 - 2030)

නාගරික සංවර්ධන අධිකාරිය

රූප සටහන් අංක 01 : අධ්‍යයන ප්‍රදේශය : හක්මන නාගරික සංවර්ධන ප්‍රදේශය - 2017




මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය, මාතර දිස්ත්‍රික් කාර්යාලය (2017)

## 2.2. සැලසුම් සන්දර්භය හා වර්තමාන තත්ත්වය

ප්‍රාග් ඓතිහාසික යුගයෙන් පසු හක්මන ප්‍රදේශය වාස භූමිය කරගත් මිණිකිරුළ නම් රජු ශත වර්ෂ 240 දී පමණ හක්මන වාසය කළ බවට සාක්ෂි ඇති බව සඳහන් වේ. තවද, වර්තමානයේ හක්මන - බෙලිඅත්ත මාර්ගයේ කිලෝමීටර් 01 ක් පමණ දුරින් පිහිටි ප්‍රේමසිරි ධර්මායතනය රජුගේ මාළිගය තිබූ ස්ථානය බවද එම ලේඛනයේ සඳහන් වේ. (මාතර පුරාණය 1994. කඹුරුපිටියේ වනරතන හිමි)

හක්මන ප්‍රදේශය ඉතාමත් දීර්ඝ ඉතිහාසයක් ඇති රාජ පරම්පරා ගණනාවකින් පෝෂණය වූ ඓතිහාසික හා රාජකීය ආරක්ෂිත ප්‍රදේශයක් වශයෙන් ප්‍රසිද්ධියට පත්ව තිබී ඇති බවත්, නාග ගෝත්‍රික සමයෙහි රුහුණට පලා ගිය මුටසීව නම් රජුගේ පුත් මහානාග කුමරුගේ රුහුණු සම්ප්‍රාප්තිය සමඟ මෙම ප්‍රදේශයේ ඓතිහාසික තොරතුරු වඩාත් පණ ගැන්වී ඇත. නාග වංශිකයෝ වඩාත් සශ්‍රීක භූමි ප්‍රදේශ ආශ්‍රිතව ගම් නියම්ගම් තනා ගනිමින් වාසය කර ඇති බවත්, නාග ගෝත්‍රිකයින් හක්මන දක්වා ව්‍යාප්ත වූ බවත් හක්මන ප්‍රදේශයට පිවිසෙන මාර්ගය අවට පිහිටි නාදුගල, නායිම්බල, නාකන්ද ආදී ග්‍රාම නාමවලින් සනාථ වන බවත් එම ග්‍රන්ථයෙහි දක්වා ඇත. පෘතුගීසීන් මාතර දිසාව යටත්කර ගැනීමෙන් අනතුරුව ගාල්ල, මාතර ආදී ප්‍රධාන නගරවල මෙන්ම හක්මන, කටුවන ආදී ප්‍රදේශවලද බලකොටු බැන්ද වූ බව සඳහන් වේ. (මාතර පුරාණය,

වනරතන හිමි, 1994, 199) 1645 ජනවාරි 01 දින පෘතුගීසී ලන්දේසි ගිවිසුම මත මාතර දිසාවන් ලන්දේසීන්ට හිමිවුනි. ලන්දේසීහු මාතර, ගන්දර, තංගල්ල, හක්මන, කටුවන ආදී ස්ථාන වල බලකොටු තැනූහ. ක්‍රි.ව. 1645 දී ලන්දේසීන් විසින් හක්මන කඩපොළට යාර 150 ක් පමණ දුරින් (මාතර පාරේ) කෝන්ගහවත්ත ඉදිරිපස ඇති කොටුගොඩැල්ල නම් ස්ථානයේ බලකොටුවක් තනන ලද බව හක්මන පුරාවිද්‍යාත්මක ඉතිහාසය නම් ග්‍රන්ථයෙහි සඳහන් වේ.


පුරාතන යුගයේ පටන් ඓතිහාසික තොරතුරු රැසක් හක්මන හා බැඳී ඇති අතර, මෙසේ විකාශනය වූ නගරය 1987 වර්ෂය වන විට දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ පිහිටි ගම්සභා අතුරින් හක්මන - වලකඩ ගම් සභා බල ප්‍රදේශයට ඇතුලත් විය. එය 1988.01.01 දින හක්මන ප්‍රාදේශීය සභාව ලෙස ප්‍රකාශයට පත්කර ඇත.

හක්මන නගරයේ භෞතික සැලසුම් කටයුතු 2003.04.28දින දක්වා නගර හා ග්‍රාම නිර්මාණ ආඥා පනත යටතේ සිදුවූ අතර, 2003.04.29 දිනැති අංක 1286/07 දරණ ගැසට් නිවේදනය පරිදි හක්මන නාගරික ප්‍රදේශය නාගරික සංවර්ධන අධිකාරියේ ප්‍රකාශිත ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇත. ඒ අනුව, දැනට මෙම ප්‍රදේශයේ සැලසුම් හා සංවර්ධන කටයුතු 1978 අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරි පනත යටතේ සංස්ථාපිත නාගරික සංවර්ධන අධිකාරිය මඟින් ඉටු කරනු ලැබේ.

හක්මන නගරය තෙත් හා වියලි මිශ්‍ර දේශගුණික ලක්ෂණ වලින් යුත් ප්‍රදේශයකි. ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව මගින් සකස් කරන ලද ජාතික භෞතික සංශෝධිත සැලැස්මට අනුව නගරය ආපදා වලින් තොර කලාපයක පිහිටා ඇත. තෙත් කලාපයට අයත් මෙම ප්‍රදේශයේ පොඩ්සොලික් සහ රතු මිශ්‍ර පසක් දැකිය හැකි අතර, කෘෂිකාර්මික කටයුතු සඳහා සුදුසු පරිසරයක් පවතී. දෙනගම වැව, උයන් වැව, තිත්තමුහුණු වැව යන පාරිසරික හා ආර්ථික වශයෙන් වැදගත් වන වැව් කිහිපයක් නගරය ආශ්‍රිතව පිහිටා ඇත. ආර්ථික භෝග වශයෙන් වැදගත් වන පොල්, කුරුඳු, පුවක්, තේ වගාව ප්‍රදේශයේ ව්‍යාප්ත වී ඇති අතර, නගරය කෘෂි කාර්මික බෝග මිලදී ගැනීමේ මධ්‍යස්ථානයක් ලෙස අතීතයේ සිට වැදගත් වේ.

ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව මගින් ප්‍රකාශිත ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තිය හා සැලැස්මේ අරමුණ වනුයේ ශ්‍රී ලංකාවෙහි ස්වාභාවික සම්පත් වලින් උපරිම ප්‍රයෝජන ලබාගැනිම හා එහි වාසි සහගත පිහිටීම තුලින් උපරිම ඵල ලබාගන්නා පරිදි භූමි පරිභෝග සැලැස්ම සකස් කිරිම හා යටිතල පහසුකම් සංවර්ධනය කිරිමයි.


**සිතියම් අංක 02 : ජාතික භෞතික සැලැස්ම 2050**




මූලාශ්‍රය : ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව - 2017

ජයිකා ආයතනය (Japan International Co – operation Agency) මඟින් 1997 වසරේදී සකස් කර ඇති දකුණු කලාපීය නගර ධූරාවලියට (සිතියම් අංක 03) අනුව ගාල්ල හා මාතර නගර දෙක පළමු පෙළ නාගරික මධ්‍යස්ථානයක් වශයෙන්ද හක්මන නගරය සිව්වන පෙළ නාගරික මධ්‍යස්ථානයක් වශයෙන්ද හඳුනාගෙන ඇත.

**සිතියම් අංක 03 : නාගරික මධ්‍යස්ථානවල අනාගත ධූරාවලිය : 1996**



හක්මන නාගරික ප්‍රදේශය අන්තර් කලාපීය වැදගත්කමක් ඇති මාතර - ඇඹිලිපිටිය දක්වා සම්බන්ධ දෙවන පෙළ මහා මාර්ගයේ පිහිටා ඇති අතර, බෙලිඅත්ත, වලස්මුල්ල, දෙයියන්දර, කඹුරුපිටිය හා අකුරැස්ස යන නාගරික මධ්‍යස්ථාන සමග දෙවන පෙළ මාර්ග ජාලයකින් සම්බන්ධ වේ. එම මාර්ග ජාලය හම්බන්තොට දිස්ත්‍රික්කය සමඟ සෘජුවම සම්බන්ධ වීම හරහා මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපොළ, හම්බන්තොට ජාත්‍යන්තර වරාය හා සූරියවැව ක්‍රිකට් ක්‍රීඩාංගණය සඳහා කෙටි කාලයකදී ලඟා වීමේ හැකියාව තුළින් මෙම නගරය කලාපය තුළ සාමාජීය හා ආර්ථික වශයෙන් වැදගත් වීමට හේතු වී ඇත. එය සිතියම් අංක 04 මගින් දක්වා ඇත. විධිමත්ව ක්‍රියාත්මක වන මාතර - හක්මන බස් සේවාව මඟින් හක්මන නාගරික ප්‍රදේශය මාතර නගරය සමඟත් වලස්මුල්ල, මිද්දෙනිය, දෙයියන්දර සිට හක්මන නගරය හරහා කොළඹ දක්වා ගමන් කරන බස් සේවාව මඟින් කොළඹ නගරය සමඟත් සෘජු සම්බන්ධතාවයක් ඇති කිරීමට සමත්වීම එහි අනාගත කාර්යභාරය වර්ධනයට විශේෂයෙන් බලපානු ඇත.

**සිතියම් අංක 04: හක්මන නගරයේ ස්ථානීය පිහිටීම**




**මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය, මාතර දිස්ත්‍රික් කාර්යාලය -2017**

2011 වර්ෂයේ ජන හා නිවාස සංගණන දත්ත අනුව මාතර දිස්ත්‍රික් ජනගහනය 965,291 ක් වන අතර, හක්මණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ජනගහනය 30,994 ක්ද, හක්මන නාගරික සංවර්ධන ප්‍රදේශයේ ජනගහනය 13,724 ක්ද වේ. ඒ අනුව, හක්මන නාගරික සංවර්ධන ප්‍රදේශයේ ජනගහනය මාතර දිස්ත්‍රික් ජනගහනයෙන් 1.4% ක් වේ.

හක්මන නගරයේ ජනගහනය 2001 – 2011 දක්වා කාල පරාසය තුළදී ඉතා අඩු වර්ධන අනුපාතයක් ගෙන ඇත. වාර්ෂික වර්ධන අනුපාතය 0.23 ක් වන අතර, නාගරික ප්‍රදේශයේ මුළු ජන සංඛ්‍යාව අඩු වර්ධන වේගයකින් වැඩි වී ඇති බව පැහැදිලි වේ.


අධ්‍යයන ප්‍රදේශය ග්‍රාම නිලධාරී කොට්ඨාස 15 කින් සමන්විත වන අතර, මුළු භූමි ප්‍රමාණය වර්ග කිලෝමීටර් 13.34 (හෙක්ටයාර් 1,334) ක් වේ. 2011 වර්ෂයේ ජන සංගණන වාර්තා අනුව ප්‍රදේශයේ දළ ජන ඝණත්වය හෙක්ටයාර් 01ට පුද්ගලයින් 06 ක් වන අතර, ශුද්ධ ජන ඝණත්වය හෙක්ටයාර් එකකට පුද්ගලයින් 43 ක් වේ.

2011 වර්ෂයේදී අධ්‍යයන ප්‍රදේශය තුළ 0 – 15 ත් අතර වයස් කාණ්ඩයට අයත්වන ජනගහනයෙහි (ළදරු හා ළමා ජනගහනය) ප්‍රතිශතය 23.8% ක් වී ඇති අතර, එය 2001 වර්ෂයේදී එම ජනගහනයෙහි ප්‍රතිශතය වන 26.7% ට වඩා 2.9% ක අඩුවීමක් පෙන්නුම් කරයි. හක්මන නාගරික සංවර්ධන ප්‍රදේශය තුල 99% සිංහල බෞද්ධයන් වේ.

මාතර, තංගල්ල වැනි ප්‍රධාන නගරත් බෙලිඅත්ත, කඹුරුපිටිය, අකුරැස්ස, වලස්මුල්ල යන නාගරික සේවා මධ්‍යස්ථානත් සම්බන්ධ කෙරෙන හුවමාරු මධ්‍යස්ථානයක් (Transit Centre) ලෙස හක්මන නගරය ක්‍රියා කරයි. තවද, නගරයේ දෛනික සේවා ප්‍රදේශය මාතර දිස්ත්‍රික්කයේ කිරින්ද - පුහුල්වැල්ල, කඹුරුපිටිය, මුලටියන යන යාබද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල වැඩි ප්‍රදේශයකටද හම්බන්තොට දිස්ත්‍රික්කයේ වලස්මුල්ල හා ඕකේවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල බටහිර ප්‍රදේශවලටද ව්‍යාප්තවී ඇත. ඒ අනුව සංවර්ධන ප්‍රදේශයේ දෛනික සංසරණ ජනගහනය දළ වශයෙන් 7000 – 7500 ත් අතර වේ.

හක්මන නාගරික ප්‍රදේශයේ මුළු භූමි ප්‍රමාණය හෙක්ටයාර් 306.73 ක් වන අතර, ඉන් හෙක්ටයාර් 170.2ක් හෙවත්, 55.5% ක් ඉදිකිරීම් කටයුතු සඳහා වෙන්වී ඇත. 2008 වර්ෂයේ සකස් කරන ලද භූමි පරිභෝග සැලැස්මට අනුව සලකා බැලීමේදී 2017 වසරේ ඉදිකිරීම් කටයුතු සඳහා යෙදවී ඇති බිම් ප්‍රමාණය 13.72% ක වර්ධනයක් පෙන්නුම් කරයි. ඒ අනුව සමස්ත භූමි ප්‍රමාණයෙන් හෙක්ටයාර් 136.3 ක් හෙවත් 45.5% ක ප්‍රමාණයක් ඉදිකිරීම් සඳහා යොදාගෙන නොමැති අතර, පාරිසරික සංවේදී ප්‍රදේශ වන කුඹුරු ඉඩම් හා ජල මාර්ග සහ දැනට සංවර්ධන කටයුතු සඳහා යෙදවී නැති කෘෂිකාර්මික, පොල් ඉඩම්, වෙනත් බෝග හා හිස් ඉඩම් ද ඊට අයත් වී ඇත. ඒ අනුව එක් එක් භාවිතා සඳහා භූමිය යෙදවී ඇති ආකාරය රූප සටහන අංක 02 හා සිතියම් අංක 11 මගින් පෙන්වා ඇත.

**රූප සටහන් අංක 02 :**




මූලාශ්‍රය : භූමි පරිභෝග සමීක්ෂණ - නාගරික සංවර්ධන අධිකාරිය, මාතර දිස්ත්‍රික් කාර්යාලය (2017)

## 2.3. සැලසුම් ප්‍රදේශය නිර්ණය කිරීම

හක්මන නගර සංවර්ධන සැලැස්ම සකස් කරනුයේ 2003.04.29 දිනැති අතිවිශේෂ ගැසට් නිවේදනය මඟින් හක්මන නාගරික සංවර්ධන ප්‍රදේශය ලෙස ප්‍රකාශිත සංවර්ධන ප්‍රදේශය සඳහාය. ඒ අනුව එම සැලසුම් ප්‍රදේශය පහත විස්තර කර ඇති පරිදි මූලික ක්ෂේත්‍ර 03ක් යටතේ හඳුන්වා දිය හැකිය.

### 2.3.1. ක්‍රියාකාරී ප්‍රදේශය

හක්මන සැලසුම් ප්‍රදේශය තුල ලංකා විදුලි බල මණ්ඩලය, පොලීසිය, ජල සම්පාදන මණ්ඩලය, ගොවිජන සේවා කාර්යාලය සහ අධ්‍යාපන ආයතන පිහිටා ඇත. එම ආයතනවල සේවා ප්‍රදේශය හක්මන අධ්‍යයන ප්‍රදේශය සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙන් ඔබ්බට පිහිටා ඇත. තවද, හක්මන නගරයේ ඇති සතිපොල සඳහා පල්ලවෙල, දෙනගම, ඇල්ලවෙල සහ නිහිළුව යන ප්‍රදේශ වලින් වෙළඳුන් මෙන්ම භාණ්ඩ මිලදී ගැනීමට පාරිභෝගිකයන් පැමිණෙති. තවද, හක්මන නගරයේ සිට කිලෝ මීටර් 15 ක් පමණ යන තෙක් ඉන්ධන පිරවුම්හලක් නොමැත. හක්මන විවිධ සේවා සමූපකාර සමිතියේ ප්‍රධාන කාර්යාලයද සැලසුම් ප්‍රදේශය තුල ස්ථානගතව ඇත. හක්මන මෙන්ම මුලටියන ප්‍රදේශයටද මෙමඟින් සේවාවන් සපයයි. ඒ අනුව හක්මන ක්‍රියාකාරී ප්‍රදේශය අධ්‍යයන ප්‍රදේශයෙන් ඔබ්බට ද ගමන්කරන බව පෙනී යයි.

### 2.3.2. භූගෝලීය ලක්ෂණ

සැලසුම් ප්‍රදේශය තෙත් කලාපය තුල පිහිටියා වුවද, හම්බන්තොට දිස්ත්‍රික්කයට ආසන්නව පිහිටීම නිසා තෙත් සහ වියළි මිශ්‍ර පාරිසරික ලක්ෂණ සහිත පාරිසරික තත්ත්වයක් දක්නට ඇත.


ප්‍රදේශයේ භූගෝලීය ලක්ෂණ අතර ප්‍රධාන වන්නේ හෙක්. 113 (37%) බිම් ප්‍රදේශයක් ව්‍යාප්තව ඇති වී වගාව සහිත තෙත් බිම් පරිසර පද්ධතියයි. එමනිසා රතු හා කහ මිශ්‍ර පොඩ්සොලික් පස ප්‍රධාන පාංශු වර්ගය වේ. තවද, ඊශාන සහ නිරිත දිග මෝසම ප්‍රදේශයේ වර්ෂාපතනය තීරණය කරන ප්‍රධාන සාධකයක් වන අතර, එමගින් වාර්ෂිකව මිලිමීටර් 1750 – 2000 වර්ෂාපතනයක් ලැබෙන අතර,මධ්‍ය වාර්ෂික උෂ්ණත්වය $30^{o}$ C පමණ වේ. තවද, භූගෝලීය ලක්ෂණ අතර ප්‍රධාන තැනක් ගන්නේ කුඩා කඳු බිම් සහ රැළි බිම් ලක්ෂණයි. එම රැළි බිම් උපයෝගී කොට කුඩා වැව් තුනක් සැලසුම් ප්‍රදේශය තුල ඉදිකර ඇත.

### 2.3.3. පරිපාලන ප්‍රදේශය

සැලසුම් ප්‍රදේශයේ පරිපාලන ප්‍රදේශය හක්මන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය සහ හක්මන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය දක්වා ව්‍යාප්ත වේ.

එසේ වුවද, ප්‍රදේශයේ ක්‍රියාකාරී කටයුතු හා භූගෝලීය පිහිටීම සලකා බලා දැනට නාගරික සංවර්ධන අධිකාරිය විසින් ගැසට් කරන ලද සංවර්ධන ප්‍රදේශය සඳහා මෙම සංවර්ධන සැලැස්ම සකස් කිරිම සිදුකර ඇත. එම ප්‍රදේශය වර්ග කිලෝමීටර් 3.06කින් සමන්විත වන අතර, එයට බෙරුවේවෙල (293සී), ගම්මැදපිටිය(286සී), කැබිලියපොල දකුණ (284ඒ), කෝංගල මධ්‍යම (295බී), කෝංගල නැගෙනහිර (295), කෝංගල දකුණ (295සී), කෝංගල බටහිර (295ඒ), ලාල්පෙ (294බී), මුරුතමුරය (293), මුරුතමුරය බටහිර (293බී), මුරුතමුරය නැගෙනහිර (293ඒ), උඩුපීල්ලෙගොඩ නැගෙනහිර (294), උඩුපීල්ලගොඩ බටහිර (294ඒ), වේපතඉර දකුණ (283ඒ), වේපතඉර බටහිර(283බී) යන ග්‍රාම සේවා කොට්ඨාශ 11 ක කොටස් අයත් වේ

**සිතියම් අංක 05: සැලසුම් ප්‍රදේශය : හක්මන නාගරික සංවර්ධන ප්‍රදේශය (2017)**




**යොමුව**

| | |
|---|---|
| අධ්‍යයන ප්‍රදේශය | ජල ප්‍රදේශ |
| කුඹුරු බිම් | මාර්ග |
| සැලසුම් ප්‍රදේශය | |

N, E, S, W

1:22,000

**සිතියම් අංක : 05**

**සැලසුම් ප්‍රදේශය : හක්මන නාගරික සංවර්ධන ප්‍රදේශය - 2017**

හක්මන නාගරික සංවර්ධන සැලැස්ම (2019 - 2030)

නාගරික සංවර්ධන අධිකාරිය

| | |
|---|---|
| සකස් කළ දිනය | : 2018 දෙසැම්බර් 10 |
| යාවත්කාලීන කලේ | : 2019 |
| මූලාශ්‍රය | : නා.සං.අ. මාතර කාර්යාලය |
| සකස් කලේ | : ජේ.ඕ.බී. ජීවන්දර |

නාගරික සංවර්ධන අධිකාරිය

# 3. සංවර්ධන සැලැස්මෙහි අවශ්‍යතාවය

සංවර්ධන සැලසුමක් සකස් කිරිමේ මූලික අවශ්‍යතාවය වන්නේ එම ප්‍රදේශයේ පැන නැඟී ඇති භෞතික, ආර්ථික, සාමාජීය සහ පාරිසරික ගැටළු මඟහරවා ගනිමින් පවතින විභවතාවයන් ප්‍රශස්ථ ලෙස ප්‍රයෝජනයට ගැනීමයි.

හක්මන නගර සංවර්ධන සැලැස්ම සකස් කිරිමේදී මූලික අවශ්‍යතාවයක් වන්නේ සැලසුම් ප්‍රදේශයේ මුළු භූමි ප්‍රමාණයෙන් 37% ක් වන කුඹුරු බිම් පද්ධතිය ආරක්ෂා කරගනිමින් විධිමත් සංවර්ධනයක් කරා ළඟාවීමයි. හක්මන නගරයේ හඳුනාගත් ප්‍රධාන දූර්වලතාවයක් වන්නේ නගරයේ වැසි ජලය බැසයාමට, පාරිසරික සංවේදීතාවයට හා දර්ශනීයත්වයට හානි වන අයුරින් තෙත් බිම් පද්ධතියක් ලෙස ක්‍රියා කරන කුඹුරු බිම් ගොඩකර අනවසර ඉදිකිරිම් සිදුකිරිමයි. 2008 වර්ෂයේ හෙක්ටයාර් 118 ක් ලෙස පැවති කුඹුරු බිම් 2017 වන විට හෙක්ටයාර් 113 ක් දක්වා අඩු වී ඇත. උදාහරණයක් ලෙස ප්‍රාදේශීය සභාව හා සති පොල ඉදිකර ඇත්තේ මෙම කුඹුරු බිම් කොටසක් ගොඩකිරිමෙනි. මේ අතර හක්මන නගරයේ අනෙකුත් නගරවලට සාපේක්ෂව අපරව්‍යුහ පහසුකම් සංවර්ධනය වී ඇති නමුදු මුළු භූමි ප්‍රමාණයෙන් 8% ක ප්‍රමාණයක් වාණිජ භාවිතය සඳහා ව්‍යාප්ත වී ඇති නමුදු ඉදිකරන ලද බොහොමයක් පොදු ගොඩනැගිලි උපරිම වශයෙන් ප්‍රයෝජනයට නොගැනේ. උදාහරණ ලෙස නගර ශාලාව, බස් නැවතුම්පොල, කඩ කාමර, සති පොල හා පුද්ගලික කඩ කාමර ප්‍රධාන වේ. මෙම ගොඩනැගිලි ඌණ භාවිතයෙන් ඉවත්කොට ප්‍රශස්ථ භාවිතයක් සඳහා යෙදවීමද මෙම සංවර්ධන සැලැස්මේ මූලික අවශ්‍යතාවයකි.

හක්මන නගරයේ ස්ථානීය පිහිටීම පිළිබඳ සලකා බලන විට මාතර - මිද්දෙනිය ප්‍රධාන මාර්ගයේ මාතර නගරයේ සිට කිලෝ මීටර් 23.0 ක් දුරින් භුවමාරු මධ්‍යස්ථානයක් ලෙසද මාතර දිස්ත්‍රික්කයේ බෙලිඅත්ත නගරයට කිලෝ මීටර් 11.5 ක් දුරින්, වලස්මුල්ල නගරයට කිලෝ මීටර් 12.0 ක් දුරින් හා කඹුරුපිටිය නගරයට කිලෝ මීටර් 11.0 ක් දුරින් කේන්ද්‍රීයව පිහිටා ඇත.

එසේම, කෘෂි හා පාරිසරික සංචාරක කර්මාන්තයට ප්‍රබලතා ලෙස යොදා ගත හැකි පරිසර පද්ධතීන් ස්ථානගත වී ඇත. වර්ෂයකට කන්න දෙකම වගා කරන 37% ක් වන කුඹුරු ඉඩම් පද්ධතිය හා රැළි හා නිම්න ප්‍රදේශ ආශ්‍රිතව ඉදිකර ඇති දර්ශනීය වැව් හා ජෛව පරිසර පද්ධතියකින් සමන්විත වේ. මුළු භූමියෙන් 45.5% ක් වන හරිත පරිසරය සහ 10.5% ක් ලෙස ව්‍යාප්ත ගෙවතු වගාව, නියර වගාව, කොරටු වගාව සහ සාම්ප්‍රදායික වගා ක්‍රම භාවිතා කරනු ලබන ප්‍රදේශයකි.

ප්‍රදේශයේ ජල ගැලීම් පාලනයට ඉවහල් වන ලෙස මුරුතමුරය, දෙනගම, ඇල්ලෙවෙල, වැවල, උයන්වැව සහ උඩුපීල්ලගොඩ යන වැව් පද්ධතීන්වල පිහිටීමත් වැසි ජලය බැස යාමට යෝග්‍ය ලෙස පිහිටා ඇති කුඹුරු බිම් පද්ධතියත් සමස්ථයක් ලෙස නගරයේ භූගෝලීය පිහිටීමත් ස්වභාවික

ආපදා අවම වීමට බලපායි. මෙම ප්‍රධාන විභවතාවයන් භාවිතයට ගනිමින් හක්මන නගරයේ අනාගත සංවර්ධනය කරා ළඟාවීමටත් එම විභවතාවයන් පරිරක්ෂණය කරමින් හක්මන නගරයේ අනාගත සුරක්ෂිතතාවය ඇති කිරීමටත් සංවර්ධන සැලස්මෙහි අවශ්‍යතාවයකි.

මහා හම්බන්තොට නගර සැලැස්මට සමගාමීව බෙලිඅත්ත නගරය ඉලක්ක කරගත් සංවර්ධන ව්‍යාපෘතීන් ලෙස දක්ෂිණ අධිවේගී මාර්ගය ඉදිකිරීමත් සමඟ හක්මන නගරයේ සිට කිලෝමීටර් 11.5 ක් දුරින් බෙලිඅත්ත, යටියන අන්තර් හුවමාරු මධ්‍යස්ථාන ලෙස සංවර්ධනය වීමත් මාතර - කතරගම දුම්රිය මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය යටතේ කිලෝ මීටර් 11.5 ක් දුරින් බෙලිඅත්ත නගරය ආශ්‍රිතව නව දුම්රිය ස්ථානය ඉදිවීමත්, හක්මන නගරයට සංවර්ධන අවස්ථාවන් ලෙස හඳුනාගෙන තිබේ. මීට අමතරව නේවාසික නාගරික මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනයට ඉවහල් වන වැවල, උයන්වැව, ඇල්ලෙවෙල වැව වැනි වැව් පද්ධති සහ නගරය අවට දර්ශනීය පරිසර පද්ධතියක් සහිත වටපිටාවක් සහිත වටපිටාවකින් යුක්ත වීමත් හක්මන නගරයට සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය පෙන්නුම් කරයි.

# දෙවන කොටස

# ගරු අමාත්‍යතුමාගේ අනුමැතිය

**හක්මන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ (කොටසක්) සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම**

මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය පාඨලී චම්පික රණවක වන මම, 1982 අංක 4 දරණ පනතේ සංශෝධිත 1978 අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 8ඊ වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, 2019 ජූලි මස 09 වන දින නාගරික සංවර්ධන අධිකාරියේ කළමණාකරන මණ්ඩලය විසින් කරන ලද නිර්දේශයන් සැලකිල්ලට ගෙන හක්මන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ (කොටසක්) සඳහා වූ සංවර්ධන සැලැස්ම මෙයින් අනුමත කරමි.



**පාඨලී චම්පික රණවක,**
**මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යය.**

මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය,
17 හා 18 වන මහල,
"සුහුරුපාය", සුභූතිපුර
පාර, බත්තරමුල්ල.

2019 අගෝස්තු මස 01 වන දින.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2135/22 - 2019 අගෝස්තු මස 06 වැනි අඟහරුවාදා - 2019.08.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ජෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

හක්මන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය (කොටසක්) සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම පිළිබඳ දැන්වීමයි

1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය (සංශෝධිත) පනතේ 8අ වගන්තිය යටතේ පැවරී ඇති බලතල අනුව හක්මන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය (කොටසක්) සඳහා පිළියෙල කරන ලද සංවර්ධන සැලැස්ම මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය පාඨලී චම්පික රණවක වන මා විසින්, එකී පනතේ 8ඊ වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල වලට අනුකූලව 2019 අගෝස්තු මස 01 වැනි දින අනුමත කරන ලද බව, එකී පනතේ 8ඩ වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනතාව වෙත දැනුම් දෙමි.

පාඨලී චම්පික රණවක,
මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය.

2019 අගෝස්තු මස 01 වැනි දින,
මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය,
17 හා 18 වන මහල,
"සුහුරුපාය",
සුභූතිපුර පාර,
බත්තරමුල්ල.


1A - G 30678— 27 (2019/08)

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.


ගැසට් නිවේදනය

2 A I කොටස : (I) ඡෙදය - ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රය - 2019.08.06

**හක්මන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය (කොටසක්) සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම**

1982 අංක 4 දරන පනතෙන් සංශෝධිත 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 8ඉ වගන්තියේ බලතල ප්‍රකාරව හක්මන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය (කොටසක්) සඳහා සකස් කරන ලද සංවර්ධන සැලැස්ම මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය ගරු පාඨලී චම්පික රණවක මැතිතුමා විසින්, එම සංශෝධිත පනතේ 8ඊ වගන්තියෙන් එතුමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2019 අගෝස්තු මස 01 වැනි දින අනුමත කරන ලද බව මහජනතාවට මෙයින් දැනුම් දෙමි.

ආචාර්ය ජගත් මුණසිංහ,
සභාපති,
නාගරික සංවර්ධන අධිකාරිය.

2019 අගෝස්තු මස 01 වැනි දින.

08 - 749


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

# 4. සංවර්ධන සැලසුම් රාමුව

## 4.1. දැක්ම

හක්මන නගර සංවර්ධන සැලැස්මෙහි දැක්ම සකස් කිරිම සඳහා ප්‍රදේශයේ සමාජ, ආර්ථික, භෞතික හා ඓතිහාසික තත්ත්වය මෙන්ම ජාතික හා කලාපීය සම්බන්ධතාවයන් පිළිබඳ පරීක්ෂා කිරිමක් සිදුකරන ලදි. ඉන් අනතුරුව පවත්නා ගැටළු, විභවතා පිළිබඳ අධ්‍යනයක් සිදුකරන ලද අතර, ඒ අනුව, අදාල මූලික තොරතුරු විශ්ලේෂණය සිදුකර නගර සංවර්ධන සැලැස්මේ දැක්ම "හරිත නිම්නයේ නිවසන" ලෙස නිර්මාණය කරන ලදි.

රූප සටහන් අංක 03 : දැක්මේ නිර්මාණය



**හරිත නිම්නයේ නිවසන**
**Living In Green Valley**



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය, මාතර දිස්ත්‍රික් කාර්යාලය (2017)

## 4.2. දැක්මේ ප්‍රකාශනය

### "හරිත නිම්නයේ නිවසන"

### හරිත නිම්නය

හක්මන නාගරික සංවර්ධන ප්‍රදේශය භූගෝලීය වශයෙන් මුහුදු මට්ටමේ සිට උස මීටර් 30 -180ත් අතර පිහිටා ඇත. නගරයෙන් ඔබ්බට යත්ම මීටර් 180 සිට මීටර් 360 ක් දක්වා උස් වූ කුඩා කඳු පද්ධති වලින් යුක්ත වේ. කෘෂිකර්මාන්තය මෙම ප්‍රදේශයේ ප්‍රධාන ආර්ථික කටයුත්ත වේ. එබැවින් 45.5% ක් වන හරිත පද්ධතියක් ප්‍රදේශයේ දක්නට ඇත. ඉන් 37% ක් වී වගා බිම් වේ. ඊට අමතරව 10.5% ක් ගෙවතු වලින්ද, 0.64%ක ප්‍රමාණයක් ජලාශ වලින්ද සමන්විත වේ. නාගරික ප්‍රදේශයෙන් ඔබ්බෙහි පිහිටි කඳු පද්ධතීන් රබර්, කුරුඳු, පොල් වැනි බෝග වලින් යුත් හරිත ආවරණයක් දැකිය හැකි වේ.

### නිවසන

නිවසන යන්නෙහි අදහස වාසය කිරිම වේ. සංවර්ධන ප්‍රදේශයේ භූමි පරිහරණ අධ්‍යයනයන්ට අනුව 34.4% ක් (හෙක්ටයාර් 103.2ක්) නේවාසික භාවිතයන්ගෙන් සමන්විත වේ. ඒ අනුව, සංවර්ධන සැලැස්ම තුළින් බලාපොරොත්තු වන්නේ ස්වාභාවික පරිසරයට අනුරූප වූ නේවාසික සංවර්ධනයකි. ඒ අනුව, හක්මන නගරය ස්වාභාවික ආපදා අවම තෙත් හා වියලි ලක්ෂණවලින් යුත් දේශගුණය නේවාසික සංවර්ධනය සඳහා හිතකර නාගරික ප්‍රදේශයක් වේ

මෙම ප්‍රදේශයේ නේවාසික සංවර්ධනය සඳහා අවශ්‍ය යටිතල පහසුකම් වන නල ජලය, විදුලිය, මාර්ග ආදිය ඉතාමත් සතුටුදායක මට්ටමක පවතී. (100%ක් සම්පූර්ණ කර ඇත.) තවද, ප්‍රවාහන පහසුකම් අතර, කි.මී. 11.5කින් හා කි.මී. 9 ක් දුරින් අධිවේගී මාර්ග අන්තර් හුවමාරු මධ්‍යස්ථාන දෙක සහ කි.මී. 11.5 ක් දුරින් බෙලිඅත්ත නගරයේ ඉදිවන A ශ්‍රේණියේ දුම්රිය පොළ මඟින් දිවයිනේ ඕනෑම ප්‍රදේශයකට ප්‍රවේශවීමට පහසුකම් සපයනු ලබයි. ඒ අනුව, මෙම සංවර්ධන සැලැස්මේ දැක්ම ප්‍රකාශය වන්නේ "ස්වභාව ධර්මයේ ආශිර්වාදයත්, හරිත ස්පර්ශයත් කැටිවුනු කෘෂි වටපිටාව ආරක්ෂා කර ගනිමින් හක්මන වැසියන්ට හා පෝෂක ප්‍රදේශයේ ජනයාට ස්වභාවධර්මයට අනුරූප වූ නාගරික වටපිටාවක් ලෙස පහසුකම් සැලසීම " වේ.

## 4.3. අරමුණු

සංවර්ධන ප්‍රදේශයෙහි පවත්නා ප්‍රබලතා, දුබලතා. අවස්ථා හා අවහිරතා විශ්ලේශනය කිරීම තුලින් ගොඩනගා ගන්නා ලද අරමුණු දෙකක් ඔස්සේ සැලැස්මෙහි දැක්ම ළඟාකර ගැනීමට අපේක්‍ෂා කෙරේ. එනම්,

1. ස්වභාව දහමේ සුන්දරත්වය සුසැදි නේවාසික නගරයක් නිර්මාණය කිරීම.

2. කෘෂිකර්මය පදනම් කරගත් නීලහරිත පරිසරය සුරැකීම.

## 4.4. පරමාර්ථ

පළමු අරමුණ වන **"ස්වභාව දහමේ සුන්දරත්වය සුසැදි නේවාසික නගරයක් නිර්මාණය කිරීම"** යන්න සාක්ෂාත් කර ගැනීම සඳහා පහත පරමාර්ථ ඔස්සේ ක්‍රියා කරනු ලැබේ.

**පරමාර්ථ**

1. වසර 2030 වන විට සනත්වය පදනම් කරගත් කලාප 04ක් නිර්මාණය කිරිම තුලින් හක්මන නගරයට අනන්‍ය වූ පාරිසරික වටපිටාවක් නිර්මාණය කිරිම.

2. පවත්නා ස්වභාවික භෞතික පරිසරය සහ නාගරික යටිතල පහසුකම් පදනම් කරගෙන 2030 වන විට සුසැදි නේවාසික සංවර්ධනයක් කරා ළඟාවීම.

3. දැනට පවතින ගොඩනැගිලි වල 50% ක් වන ඌණ භාවිතය, 2030 වන විට 10% දක්වා අඩු කිරිම.

දෙවන අරමුණ වන **"කෘෂිකර්මය පදනම් කරගත් නීලහරිත පරිසරය සුරැකීම"** යන්න සාක්ෂාත් කර ගැනීම සඳහා පහත පරමාර්ථ ඔස්සේ ක්‍රියා කරනු ලැබේ.

**පරමාර්ථ**

1. 56% ක් ව පවතින නීල හරිත ආවරණය 2030 වන විට එලෙසම පවත්වා ගැනීම.

2. 2025 වන විට සාම්ප්‍රදායික කෘෂිකර්මාන්තය ප්‍රවර්ධනය කිරිමේ අරමුණින් කෘෂිකර්මය පදනම් කරගත් සංචාරක කර්මාන්තය හඳුන්වාදීම සහ වාර්ෂිකව නගරයට සංචාරකයින් 3500ක් (දේශීය 3000 විදේශීය 500) ආකර්ශනය කරගැනීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම.

# 5. ශක්තීන්, දුර්වලතා, අවස්ථා හා තර්ජන විශ්ලේෂණය

## අරමුණ 01 - "ස්වභාවදහමේ සුන්දරත්වය සුසැදි නේවාසික නගරයක් නිර්මාණය කිරීම

**වගු අංක 02 : "ස්වභාවදහමේ සුන්දරත්වය සුසැදි නේවාසික නගරයක් නිර්මාණය කිරීම" සඳහා ශක්තීන්, දුර්වලතා, අවස්ථා හා තර්ජන විශ්ලේෂණය**

| ශක්තීන් | ශ | දු | දුර්වලතා |
|---|---|---|---|
| • ස්වාභාවික විපත් අවම පරිසරයක පිහිටා තිබීම නිසා සමස්ථ ප්‍රදේශයම සංවර්ධනය සඳහා යොදාගත හැකිවීම.<br>• නේවාසික නගරයක් සඳහා අවශ්‍ය නාගරික යටිතල පහසුකම් සංවර්ධනය වී තිබීම.<br>• මානව හා ප්‍රජා විද්‍යාත්මක සාධක වල දියුණුව නිසා ජීවත්වීමට සුදුසු පරිසරයක් නිර්මාණය වී තිබීම.<br>• දෙවන පෙළ මාර්ග ජාලයකින් අරීයව සම්බන්ධ වන මාර්ග මංසන්ධියක පිහිටීම මඟින් නේවාසිකයන්ට යාබඳ නගර කරා ප්‍රවේශවීමට පහසු ප්‍රවේශකත්වයක් තිබීම | ශ | දු | • රජයේ හා පෞද්ගලික ගොඩනැගිලිවල ඌණ භාවිතය සහ පවත්නා යටිතල පහසුකම් නිසි පරිදි නඩත්තු නොකිරීම.<br>• සියළුම ප්‍රධාන මාර්ග ආවරණය වන පරිදි පදික මංතීරු ඉදිකර නොතිබීම.<br>• ආදායම් ව්‍යාප්ති විෂමතාවය වැඩි වීම සහ ප්‍රාදේශීය සභාව සතු ආයෝජන ශක්තිය අඩුවීම.<br>• විධිමත් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රමවේදයක් නොමැතිවීම. |

| අවස්ථා | | | තර්ජන |
|---|---|---|---|
| • මාතර - කතරගම දුම්රිය මාර්ග දිගුව යටතේ බෙලිඅත්ත නගරයේ ඉදිවන A ශ්‍රේණියේ දුම්රිය ස්ථානය වෙත නේවාසිකයින්ට කෙටි කාලයකින් ළඟාවිය හැකිවීම.<br>• දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව ව්‍යාපෘතියේ යටියන සහ බෙලිඅත්ත ප්‍රදේශයේ ඉදිවන පිවිසුම් මාර්ග හරහා නේවාසිකයින්ට පහසුවෙන් අධිවේගී මාර්ගය භාවිතා කිරීමේ හැකියාව පැවතීම.<br>• 2017 – 2030 සඳහා සකස් කරන ලද ජාතික භෞතික සැලසුමට අනුව හක්මන ග්‍රාමීය ජනාවාස සංවර්ධන කලාපයට අයත් වීම. | අ | ත | • පර්යන්ත නාගරික මධ්‍යස්ථානවල සංවර්ධනය හේතුවෙන් නගරයේ සංවර්ධන නැමියාවට බාධා ඇතිවීම. |

මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය, මාතර දිස්ත්‍රික් කාර්යාලය ( 2017)


**ශක්තීන්**

**1. ස්වාභාවික විපත් අවම පරිසරයක පිහිටා තිබීම.**

මාතර දිස්ත්‍රික්කයට බලපාන ප්‍රධාන ස්වභාවික විපත් ලෙස ගංවතුර, සුළි සුළං, සුනාමි සහ නායයාම් හඳුනාගත හැකිය. නමුත්, හක්මන නගරය මාතර නගරයේ සිට කිලෝමීටර් 23 ක් දුරින් පිහිටා ඇති බැවින් හා මුහුදු මට්ටමෙන් ඉහළ මට්ටමේ ඇති නගරයක් බැවින් සාගරය ආශ්‍රිත ඇතිවන ස්වභාවික විපත්වලින් තොර නගරයකි. තවද, නගර මධ්‍යයේ ඇති හෙක්. 113ක් වන තෙත් බිම් පද්ධතිය මඟින් වැසි ජලය බැසයාමේ ගැටළුව මෙන්ම ඉහල ප්‍රදේශවල වැව් 05ක් පිහිටා තිබීම නිසා ගංවතුර වැනි ආපදා බලපෑම අවම වී ඇත. සිතියම් අංක 06 සහ සිතියම් අංක 07 අනුව මෙම නගරය ආපදා අවදානම් කලාපයෙන් පිටත පිහිටා ඇති බව හඳුනාගත හැකිය. ඒ අනුව පැහැදිලි වන්නේ සංවර්ධන ප්‍රදේශයේ සමස්ථ ඉඩම් ප්‍රමාණයම නේවාසික හා අනෙකුත් සංවර්ධන කටයුතු සඳහා යොදාගත හැකි බවය.


**සිතියම් අංක 06 : ආපදා ව්‍යාප්ත ප්‍රදේශ : හක්මන නාගරික සංවර්ධන ප්‍රදේශය**



මූලාශ්‍රය : ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය (2017)

**සිතියම් අංක 07 : මාතර දිස්ත්‍රික් ජල ගැලීම් ව්‍යාප්ත ප්‍රදේශය**




මූලාශ්‍රය : වාරිමාර්ග දෙපාර්තමේන්තුව - මාතර **(2017)**

## 2. නාගරික යටිතල පහසුකම් සංවර්ධනය

නේවාසික නගරයක් සඳහා අවශ්‍ය වන මූලික යටිතල පහසුකම් හක්මන නගරය තුල දැනටමත් සතුටුදායක මට්ටමක පවතින අතර, නාගරික සීමාව තුල පවත්නා බී ශ්‍රේණියේ මාර්ග හතර ද්විත්ව මංතීරු සහිතව සංවර්ධනය කර තිබේ. නල ජලය, විදුලිය පහසුකම් අවශ්‍යතාවයට අනුව පවතින අතර, (100% ක් සම්පූර්ණ කර තිබීම) අනෙකුත් අපරව්‍යුහ පහසුකම් වන මීටර් 200 ක ධාවන පථයකින් හා ප්‍රේක්ෂකාගාරයක් සහිත ක්‍රීඩාංගණය, ළමා උද්‍යානය, ආසන 600 කින් යුත් අංග සම්පූර්ණ නගර ශාලාව, ප්‍රේක්ෂකාගාරය සහිත අංග සම්පූර්ණ පුස්තකාලය, සති පොළ හා පොදු වැසිකිළි ආදී පහසුකම් නගරය තුල දැනටමත් ස්ථාපිත වී ඇත. තවද, සංවර්ධන ප්‍රදේශයේ පවත්නා නිවාස ඒකක 2694 න් ඒකක 2576 කට (95.6%) රාජ්‍ය ,වාණිජ සහ ආගමික ස්ථාන සඳහා 100% ක්ම ආවරණය වන පරිදි විදුලිය පහසුකම් ලබාදී ඇත. මේ අනුව, නේවාසික සංවර්ධනය සඳහා ප්‍රමාණවත් නාගරික යටිතල පහසුකම් නගරය තුල පවතින බව පැහැදිලි වේ.

**රූප සටහන් අංක 04 : යටිතල පහසුකම් සංවර්ධනය : හක්මන නාගරික සංවර්ධන ප්‍රදේශය**

**ක්‍රීඩාපිටිය**



**නගර ශාලාව**



**මාර්ග සංවර්ධනය**



**ළමා උද්‍යානය**



**සති පොළ**



**ආදාහනාගාරය**




මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණ, නාගරික සංවර්ධන අධිකාරිය - 2017

### 3. දෙවන පෙළ මාර්ග ජාලයකින් අරීයව සම්බන්ධ වන මාර්ග මංසන්ධියක පිහිටීම.

හක්මන නගරය මාතර නගරයේ සිට කි.මී. 23.0 ක් ද, කඹුරුපිටිය නගරයේ සිට කි.මී. 12ක්ද, දෙයියන්දර නගරයේ සිට කි.මී. 11ක්ද, හම්බන්තොට දිස්ත්‍රික්කයට අයත් වලස්මුල්ල හා බෙලිඅත්ත නගරයන්හි සිට කි.මී. 11ක් දුරින් පිහිටා ඇත. (සිතියම් අංක 08) ඒ අනුව, හක්මන නගරය පොදු ප්‍රවාහන මාර්ග පද්ධතිය ඔස්සේ යාබඳ නගර හා සම්බන්ධ වූ ප්‍රාදේශීය සම්බන්ධතාවයක් පෙන්නුම් කරයි. තවද, නගරයේ පොදු ප්‍රවාහන පහසුකම් සලකා බැලීමේදී නගරය හරහා ගමන් ගන්නා බස් රථ 36 ක් මඟින් ගමන් වාර 149 ක් සංසරණය වන අතර, නගරයෙන් ආරම්භ වන බස් රථ 69 ක් මඟින් දෛනිකව ගමන් වාර 353 ක් සේවාවක් සපයයි. මේ අනුව, හක්මන නගරයේ නේවාසිකයින්ට ඉතා කෙටි කාලයකින් යාබඳ නගර වලින් අවශ්‍ය පහසුකම් සපයා ගැනීමට පහසු ප්‍රවේශකත්වයක් පවතින බව තහවුරු වේ.


**සිතියම් අංක 08 : ප්‍රාදේශීය සම්බන්ධතාවය - 2017**




මූලාශ්‍රය - නාගරික සංවර්ධන අධිකාරිය - මාතර දිස්ත්‍රික් කාර්යාලය

ඉහත මාර්ග ජාලය පදනම් කර ගනිමින් හක්මන නගරයේ සම්බන්ධතා විශ්ලේෂණය සිදුකරන ලද අතර, ඒ අනුව පැහැදිලි වන්නේ නගරයේ වාණිජ කලාපය තුල වැඩිම ක්‍රියාකාරිත්වයක් ඇති බවයි. එනම්, එම ප්‍රදේශය සඳහා ප්‍රධාන මාර්ග 04කින් සහ තවත් අතුරු මාර්ග කීපයකින් ඍජුව සම්බන්ධ වීම නිසා මෙම ප්‍රදේශය එලෙස ඉහළ ක්‍රියාකාරිත්වයක් සහිත ප්‍රදේශයක් ලෙස හඳුනාගත හැක.

**සිතියම් අංක 09 : සම්බන්ධකතා විශ්ලේෂණය - 2017**




මූලාශ්‍රය - නාගරික සංවර්ධන අධිකාරිය - මාතර දිස්ත්‍රික් කාර්යාලය

**4. මානව හා ප්‍රජා විද්‍යාත්මක සාධක වල දියුණුව**

2011 ජන සංඛ්‍යා ලේඛණ හා නිවාස සංගණන දත්ත අනුව හක්මන නාගරික ප්‍රදේශයේ ජනතාවගේ සාක්ෂරතාවය 98%ක් වන අතර, එය දිස්ත්‍රික්කයේ සාක්ෂරතා අගයට සමාන වේ. තවද, ප්‍රමිතිරි අනුපාතය 98% ක් වන අතර, රාජ්‍ය සේවා නියුක්තිය 32.7% ක් වේ. ඒ අනුව, නගරයේ ජනතාවගේ සාක්ෂරතාවය ඉහළ මට්ටමක පවතින බවත්, රාජ්‍ය සේවා නියුක්තිය ඉහළ මට්ටමක පවතින බවත් තහවුරු වේ.

## දුබලතා

**1. ගොඩනැගිලි ඌණ භාවිතය**

නාගරික ප්‍රදේශයේ භූමි පරිහරණයෙන් 3% ක ප්‍රමාණයක් වාණිජ කටයුතු සඳහා වෙන් වී ඇත. නමුත් එම ප්‍රදේශය තුළ පවත්නා රජයේ හා පෞද්ගලික ගොඩනැගිලිවල ඌණ භාවිතයක් දක්නට ඇත. (රූප සටහන 05) ඒ අනුව, ආසන 600 කින් යුත් නගර ශාලාවක් පැවතුනද එය 2017 වර්ෂයේ ප්‍රයෝජනයට ගෙන ඇත්තේ අවස්ථා 07 කදී පෙර පාසල්වල විසිරයාමේ උත්සව සඳහා පමණි. තවද, ඉදිකරන ලද බස්නැවතුම් පොළෙහි උඩු මහළෙහි කඩ කාමර 10න් 05ක් වසා ඇති අතර, පැරණි පොදු වෙළඳ පොලෙහි දෙමහල් ගොඩනැගිල්ලේ උඩු මහලේ කඩ කාමර සහ තවත් කඩකාමර 22 ක් ද පැරණි ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ලද දැනට භාවිතයට නොගැනන තත්ත්වයක පවතී. එමෙන්ම සති පොළ භූමියෙන් දැනටඉදිකර ඇති ගොඩනැගිලි වලින් භාවිතයට ගනු ලබන්නේ 65%ක් පමණ ප්‍රමාණයකි. ඒ අනුව

පැහැදිලි වන්නේ නගරයේ වාණිජ ආර්ථිකයේ වර්ධනයක් සිදුනොවන බවයි. එය නේවාසික ආකර්ශනය කෙරෙහි බාධාවක් වී ඇත.

**රූප සටහන් අංක 05 : ගොඩනැගිලි වල ඌණ භාවිතය : හක්මන නාගරික සංවර්ධන ප්‍රදේශය**

**බස්නැවතුම්පොල උඩු මහල**



**සතිපොල**



**නගර ශාලාව**



**පැරණි ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ල**



මූලාශ්‍රය - ක්ෂේත්‍ර සමීක්ෂණ : නාගරික සංවර්ධන අධිකාරිය, මාතර දිස්ත්‍රික් කාර්යාලය - 2017

2. **ඉදිකර ඇති පදික මංතීරු ප්‍රමාණවත් නොවීම**

හක්මන ඇල්ලෙවෙල හරහා කඹුරුපිටිය දක්වා දිවෙන මාර්ගයෙහි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, පොලීසිය, සමුපකාර සංගමය, තැපැල් කාර්යාලය, ටෙලිකොම් වැනි ආයතන කිහිපයක් පිහිටා ඇත. මෙම මාර්ගයෙහි දිනපතා විශාල රථ වාහන සංඛ්‍යාවක් ගමන් ගන්නා අතර, මාර්ග දෙපස ඉහත ආයතන කරා සේවා ලබාගැනීමට පැමිණෙන වාහන නතර කරනු ලබන නමුත් මෙම මාර්ගයන්ගේ පදික වේදිකා ඉදිකර ඇත්තේ නගර මධ්‍යයේ සිට මීටර් 200 ක් දුරට පමණි. ඒ අනුව නගරයේ ප්‍රධාන මාර්ග ආශ්‍රිතව පදිකයන්ට නව පදික මංතීරු ඉදිකිරීමට සිදුවන අතර, එය නගරයේ ආර්ථිකයට බාධාවක් වේ.

3. **විධිමත් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රමවේදයක් නොමැතිවීම**

නගරයේ එකතු කරනු ලබන මුළු ඝණ අපද්‍රව්‍ය ප්‍රමාණයෙන් 87% ක් දිරන අපද්‍රව්‍ය වන අතර, 13% ක් වන නොදිරන අපද්‍රව්‍ය වේ. නමුත් මෙම අපද්‍රව්‍ය වර්ගීකරණයකින් තොරව එකම ස්ථානයකට බැහැර කරනු ලබයි. තවද, අංක 03 වගුවට අනුව සමස්ථ ඝන අපද්‍රව්‍ය ප්‍රමාණයෙන් 14% ක් මාර්ගවලට බැහැර කරන බව පැහැදිලි වේ. ඒ අනුව, නගරය තුල විධිමත් ලෙස ඝන අපද්‍රව්‍ය බැහැරලීමට සුදුසු ස්ථාන නොමැතිකමින් මාර්ගවලට අවිධිමත් ලෙස කුණු බැහැරලීම හේතුවෙන් නගරයේ සුන්දර පරිසරයට බාධාවක් වී ඇත.

**වගු අංක 03:ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රම - හක්මන නාගරික සංවර්ධන ප්‍රදේශය**

| ක්‍රමය | ප්‍රතිශතය % | අපද්‍රව්‍ය බැහැර කරන අයුරු |
|---|---|---|
| ගෙහිමියා විසින්ම පුළුස්සන | 6% |  |
| ගෙහිමියා විසින් වළ දැමීම | 35% | |
| ගෙහිමියා විසින් කොම්පෝස්ට් සකස් කිරිම | 45% | |
| මාර්ගයට බැහැර කිරිම | 14% | |

මූලාශ්‍රය : ජන හා නිවාස සංගණන වාර්තා - 2011

**4. ආදායම් ව්‍යාප්ති විෂමතාවය වැඩි වීම සහ ප්‍රාදේශීය සභාව සතු ආයෝජන ශක්තිය අඩුවීම.**


නාගරික ප්‍රජාවගේ රැකියා නියුක්තිය අනුව රජයේ සේවකයින් 32.7% ක් පුද්ගලික අංශය 25.9%ක්, ස්වයං රැකියාලාභීන් 36%ක් සහ විදේශ රැකියාවල නිරතවන්නන්ගේ ප්‍රමාණය 5.4%ක් වේ. කෙසේ නමුදු ආදායම් ව්‍යාප්තිය අනුව 35% කගේ මාසික ආදායම රු: 6000 ට වඩා අඩුවේ. 56% ක ගේ මාසික ආදායම රු: 12000/= ට වඩා අඩුවේ. තවද, මාසික ආදායම රු: 70,000/= ට වැඩි අයගේ ප්‍රතිශතය 2% ක් තරම් අඩු අගයක් ගනී. (රූප සටහන අංක 06) ප්‍රාදේශීය සභාවේ ආයෝජන ශක්තිය අඩුවීමද නාගරික ආර්ථිකයට සෘජුවම බලපායි. විශේෂයෙන්ම නාගරික යටිතල පහසුකම් සංවර්ධනයට මෙන්ම නඩත්තු කිරිමටද සභාවේ ආදායම් තත්ත්වය වැදගත් වේ. වගු අංක 04 ට අනුව ප්‍රාදේශීය සභාවේ 2009 හා 2010 වර්ෂවල ආදායම් වියදම් තත්ත්වය අනුව වියදම් පාර්ශවය වැඩි අගයක් ගැනීම මඟින් එය මනාව පැහැදිලි වේ.

**වගු අංක 04:ආදායම් වියදම් විස්තරය - හක්මන ප්‍රාදේශීය සභාව**

| වර්ෂය | ආදායම (රුපියල් මිලියන) | වියදම (රුපියල් මිලියන) | අතිරික්ත (රුපියල් මිලියන) |
|---|---|---|---|
| **2008** | 16.74 | 15.00 | 1.3 |
| **2009** | 17.42 | 18.58 | -1.16 |
| **2010** | 18.58 | 22.17 | -3.59 |
| **2011** | 21.84 | 21.10 | 0.74 |
| **2012** | 26.29 | 26.29 | - |
| **2013** | 29.96 | 29.67 | 0.29 |

මූලාශ්‍රය: හක්මන ප්‍රාදේශීය සභාව-අයවැය වාර්තා - 2008, 2009, 2010, 2011, 2012, 2013

**රූප සටහන් අංක 06 : ආදායම් ව්‍යාප්තිය : හක්මන ප්‍රාදේශීය සභාව - 2017**




මූලාශ්‍රය : සම්පත් පැතිකඩ - 2017 , ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, හක්මන

## අවස්ථා

1. **හම්බන්තොට වරාය නගරය කේන්ද්‍ර කරගත් මාතර - කතරගම දුම්රිය මාර්ග ව්‍යාපෘතිය සහ මාතර - හම්බන්තොට දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව සංවර්ධන ව්‍යාපෘතීන්හි බලපෑම**


හක්මන නගරයේ සිට කි.මී. 11ක් දුරින් පිහිටි බෙලිඅත්ත නගරයෙහි ඉදිකරමින් පවතින A ශ්‍රේණියේ දුම්රිය නැවතුම් පොල සහ බෙලිඅත්ත නගරයේ සහ හක්මන නගරයට කි.මී. 09ක් දුරින් පිහිටි යටියන නගරයේ ඉදිවෙමින් පවතින අධිවේගී මාර්ගයෙහි අන්තර් හුවමාරු මධ්‍යස්ථාන මඟින් හක්මන නගරයේ ජනයාට දිවයිනේ අනෙකුත් ප්‍රධාන නගර සමඟ කෙටි කාලයකින් සම්බන්ධ වීමට ඇති හැකියාව රූප සටහන් අංක 07 හා 08 මඟින් පෙන්නුම් කර ඇත.

**රූප සටහන් අංක 07 : දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව ව්‍යාපෘතිය**



මූලාශ්‍රය : www.dailymirror.lk. -2017

**රූප සටහන් අංක 08 : මාතර - කතරගම දුම්රිය මාර්ග ව්‍යාපෘතිය**




මූලාශ්‍රය : WWW.drwingler.com - 2017

## තර්ජන

**1. පර්යන්ත නාගරික මධ්‍යස්ථාන වල සංවර්ධනය**

- 2005 වර්ෂයේදී කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය පිහිටුවීමේදී හක්මන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් කරතොට, නාරද්ද, කුඹල්ගොඩ, ගල්කන්ද ග්‍රාම නිලධාරී වසම් හි කොටස් කිරින්ද පුහුල්වැල්ලට එකතු වූ බැවින් ඔවුන් සේවා අවශ්‍යතා සඳහා කිරින්ද නගරයට යාම හේතුවෙන් හක්මන නගරයෙහි දෛනික සංසරණ ජනගහනය අඩුවීම සහ කෘෂි නිෂ්පාදන මිලදී ගැනීමේ මධ්‍යස්ථාන ද යාබඳ නගරවල ව්‍යාප්ත වීම හේතුවෙන් හක්මන නගරයේ ආර්ථික වර්ධනයට බාධා ඇතිවීම.

## අරමුණ 02 : "කෘෂිකර්මය පදනම් කරගත් සුරැකි නීල හරිත පරිසරය සුරැකීම"

වගු අංක 05 : **"කෘෂිකර්මය පදනම් කරගත් සුරැකි නීල හරිත පරිසරය සුරැකීම" සඳහා ශක්තීන්, දුර්වලතා, අවස්ථා හා තර්ජන විශ්ලේෂණය**


| **ශක්තීන්** | | | **දුර්වලතා** |
|---|---|---|---|
| • කෘෂිකර්මාන්තයට යෝග්‍ය භූ භෞතික තත්ත්වය නීල හරිත පරිසරයට ශක්තියක්වීම.<br>• පවත්නා නීල හරිත පරිසරය<br>• කෘෂි හා පරිසර පාදක සංචාරක කර්මාන්තයට විභවතාවන් ලෙස වැව් හා කුඹුරු ඉඩම්වල පිහිටීම.<br>• රැකියා නියුක්තිය අනුව 36%ක් ස්වයං රැකියාවල නිරත වීම. | ශ | දු | • ස්වාභාවික ජලවහන පද්ධතියට බාධාවන ලෙස කුඹුරු ඉඩම් ගොඩකිරීම.<br>• කෘෂිකර්මාන්තය ආශ්‍රිත රෝගාබාධ (මීඋණ) |
| **අවස්ථා** | | | **තර්ජන** |
| • කෘෂි හා පාරිසරික සංචාරක කර්මාන්තයට ඇති විභවතාවය | අ | ත | • කාලගුණික විපර්යාස මගින් වර්ෂාපතන රටාව වෙනස්වීම. |


**ශක්තීන්**

1. **කෘෂිකර්මාන්තයට යෝග්‍ය භූ භෞතික පරිසරය**

   දියළු හා පොඩ්සොලික් පස සහිත අන්තර්මධ්‍ය දේශගුණික කලාපයක පිහිටීම හා වාර්ෂික වර්ෂාපතනය මිලිමීටර් 2500 – 3000 අතර කලාපයක පිහිටීම සහ වැව් ආශ්‍රිත වාරි ජලය මඟින් කෘෂි කටයුතු සිදුකරන බැවින් අවශ්‍ය අවස්ථාවල ජලය ලබාගැනීමට ඇති හැකියාව නිසා වර්ෂය පුරාම කෘෂි බෝග වගා කිරිමට නාගරික වාසීන්ට හැකියාවක් ඇත. හක්මන නාගරික සංවර්ධන ප්‍රදේශයේ වාර්ෂික වර්ෂාපතන රටාව රූප සටහන් අංක 09 මඟින් පෙන්නුම් කර ඇත.

**රූප සටහන් අංක 09 : වාර්ෂික වර්ෂාපතන රටාව : හක්මන නාගරික සංවර්ධන ප්‍රදේශය - 2017**








මූලාශ්‍රය : වාරිමාර්ග දෙපාර්තමේන්තුව - 2017

## 2. පවත්නා නීල හරිත පරිසරය


නගර මධ්‍යයෙහි මුළු භූමියෙන් 45.5% ක් හරිත ආවරණයෙන් යුක්ත වන අතර, ඉන් 37% ක් කුඹුරු ඉඩම්ද, 7.9%ක් වෙනත් බෝග වලින්ද සමන්විත වීම සහ 0.6%ක් වන ජලාශ පද්ධතීන්ගෙන් සමන්විත වීම නාගරික භූමි පරිහරණ රටාවට මෙන්ම භූ දර්ශන පද්ධතියට ඉවහල් වන බැවින් එම ප්‍රමාණය සංරක්ෂණය කිරිමට කටයුතු යොදා තිබීම කෘෂි කර්මය පදනම් කරගත් සුරැකි නීල හරිත පරිසරය සුරැකීමට දායකත්වයක් වේ. තවද, හක්මන නාගරික සංවර්ධන ප්‍රදේශයේ පාරිසරික සංවේදී විශ්ලේෂණය කලාප 05 යටතේ සිදු කරන ලදී. ඒ අනුව, නගර මධ්‍යයේ පිහිටි ප්‍රදේශය තෙත් බිම් පරිසරය වන කුඹුරු ප්‍රදේශයයි. ඉහත අධ්‍යනයට අනුව එය අධි සංවේදී ප්‍රදේශය වේ. නගර මධ්‍යයෙන් පිටතට යත්ම ප්‍රදේශයේ පාරිසරික සංවේදීතාවය ද ක්‍රමයෙන් අඩු වී යයි.

**රූප සටහන් අංක 10 : පවත්නා නීල හරිත පරිසරයෙහි සංයුතිය**



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය, මාතර දිස්ත්‍රික් කාර්යාලය - 2017

## සිතියම් අංක 10 : සංවේදීතා විශ්ලේෂණය : හක්මන නාගරික සංවර්ධන ප්‍රදේශය - 2017




**යොමුව**

ඉහළ : 5

අවම : 1

හක්මන නගර සභා සීමාව

1:11,000

**සංවේදීතා විශ්ලේෂණය : හක්මන නාගරික සංවර්ධන ප්‍රදේශය - 2017**

හක්මන නාගරික සංවර්ධන සැලැස්ම (2019 - 2030)

නාගරික සංවර්ධන අධිකාරිය

**සිතියම් අංක : 10**


| | |
|---|---|
| සකස් කළ දිනය | : 2018 දෙසැම්බර් 10 |
| යාවත්කාලීන කලේ | : 2019 |
| මූලාශ්‍රය | : නා.සං.අ. මාතර කාර්යාලය |
| සකස් කලේ | : ජේ.ඕ.බී. ජීවන්දර |

නාගරික සංවර්ධන අධිකාරිය

### 3. කෘෂි හා පරිසර පාදක සංචාරක කර්මාන්තයට විභවතාවයක් ලෙස යොදාගත හැකි වැව් හා තෙත් බිම් පද්ධතිය

සංවර්ධන ප්‍රදේශය ආසන්නයේ ජෛව විවිධත්වයෙන් යුත් දෙනගම වැව, මුරුතමුරය වැව උයන්වැව හා බෙරුවේවෙල වැව යන වැව් පද්ධතිය පිහිටා ඇති අතර, එමඟින් මුළු භූමියෙන් 37%ක් වන කුඹුරු බිම් පද්ධතිය පාරිසරික හා සංචාරක කර්මාන්තයට විභවතාවයක් ලෙස යොදාගත හැකිය. විශේෂයෙන්ම සංවර්ධන ප්‍රදේශය ආශ්‍රිතව ඇති දෙනගම වැව අක්කර 81කින් සමන්විත වන අතර, අක්කර අඩි 1050 ක ධාරිතාවයකින් යුක්ත වේ. වර්ග කිලෝ මීටර් 6 - 7 පෝෂක ප්‍රදේශයකින් සමන්විත වන අතර, හීංදොළ ආර, මාදොළ ආර, සපුගහ ආර මඟින් වැව පෝෂණය කරනු ලබයි. වැවෙහි වැව් බැම්ම දිගින් මීටර් 650කින් යුක්ත වන අතර, හෙක්. 342.9 ක වී වගාවක් සඳහා ජලය සම්පාදනය කරයි. එම තෙත් බිම් පරිසරය ආශ්‍රිතව පවත්නා ජෛව විවිධත්වය උපයෝගී කරගෙන ප්‍රදේශයේ සංචාරක කර්මාන්තය දියුණු කරගත හැකිය. ඒ අනුව, සංචාරක කර්මාන්තය හා බැඳුනු කෘෂිකාර්මික සංවර්ධනයේදී ගොවීන්ට නව ආදායම් මාර්ග ඇති වන බැවින් දැනට වගා කරන කුඹුරු බිම් සහ අනෙකුත් ඒ ආශ්‍රිත කෘෂිකාර්මික කටයුතු එලෙසම පවත්වා ගැනීමට උනන්දුවක් දක්වයි. එබැවින් කෘෂිකර්මය පදනම් කරගත් සුරැකි නීල හරිත පරිසරයක් සුරැකීමට දායකත්වයක් ලබාදෙයි. රූප සටහන් අංක 11 මඟින් නගරයේ කෘෂි හා පාරිසරික සංචාරක කර්මාන්තයට විභවතාවයක් ලෙස යොදා ගත හැකි වැව් හා කුඹුරු බිම් පද්ධතිය පෙන්නුම් කරයි.

**රූප සටහන් අංක 11 : තෙත් බිම් පද්ධතිය: හක්මන ප්‍රදේශීය ලේකම් කොට්ඨාශය - 2017**




මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණ වාර්තා - නාගරික සංවර්ධන අධිකාරිය, මාතර දිස්ත්‍රික් කාර්යාලය, 2017

**4. රැකියා නියුක්තියෙන් ස්වයං රැකියාවල නියුක්තිය ඉහල අගයක පැවතීම.**

හක්මන නාගරික ප්‍රදේශයේ මුළු ජනගහනයෙන් 2210 ක් පමණ රැකියාවල නියුක්ත වී ඇත. රජයේ රැකියාවල නියුක්ත ප්‍රමාණය 721ක් හෙවත් 32.7% ක් පමණ වන අතර, පුද්ගලික අංශයේ රැකියාවල නියුක්ත වී ඇති ප්‍රමාණය 573 කි. එය ප්‍රතිශතයක් ලෙස 25.9% ක් පමණ වේ. ස්වයංරැකියාවල නියුක්ත ප්‍රමාණය 796ක් වන අතර, එය 36% ක් පමණ වේ. ඉන් බහුතරයක් කෘෂිකර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තවල (සුළු අපනයන බෝග) නිරතව ඇත. මේ නිසා ශ්‍රම සූක්ෂම කෘෂිකර්මාන්තයට අවශ්‍ය ශ්‍රම දායකත්වය නොඅඩුව ලබාගත හැකි බැවින් එය විභවතාවයක් ලෙස හඳුනාගෙන ඇත. (වගු අංක 06)

**වගු අංක 06 : රැකියා නියුක්තිය : හක්මන නාගරික සංවර්ධන ප්‍රදේශය - 2017**

| රැකියා වර්ගය | නිරත වූ සංඛ්‍යාව | ප්‍රතිශතය % |
|---|---|---|
| රජයේ රැකියා | 721 | 32.7 |
| පුද්ගලික රැකියා | 573 | 25.9 |
| ස්වයං රැකියා | 796 | 36.0 |
| විදේශ රැකියා | 120 | 5.4 |
| එකතුව | 2210 | 100 |

මූලාශ්‍රය: සම්පත් පැතිකඩ - 2017, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, හක්මන

## දුබලතා

**1. ස්වභාවික ජල වහනයට බාධාවන අයුරින් කුඹුරු ඉඩම් ගොඩකිරිම.**

2008 භූමි පරිහරණ සමීක්ෂණයට අනුව කුඹුරු ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් 118 ක් වන අතර, 2017 භූමි පරිහරණ සමීක්ෂණයට අනුව එය හෙක්ටයාර් 113 දක්වා අඩු වී ඇත. විශේෂයෙන්ම ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා අක්කර 05 රූඩ් 02 ක්ද, සතිපොල සඳහා අක්කර 02 රූඩ් 01ක් පිරවීම සහ බුද්ධ ජයන්ති කණිෂ්ඨ විද්‍යාලය ප්‍රතිස්ථානගත කිරිම සඳහා අක්කර 02 පර්. 32ක ප්‍රමාණයක් පස් පිරවීම නිසා කුඹුරු බිම් ප්‍රමාණය අඩු වී ඇත. මෙලෙස කුඹුරු බිම් ප්‍රමාණය අඩුවීම නිසා නීල හරිත පරිසරය අවක්‍රමණය වන අතර, යාබඳ කුඹුරු බිම්වල රොන් මඩ තැන්පත් වීම ආදිය නිසා වගා කටයුතු වලට බාධා ඇතිවේ. පහත රූප සටහන් අංක 12 හා 13 මඟින් දැනට ගොඩකර ඇති කුඹුරු ඉඩම් සහ ගොඩකිරිමට සැලසුම් කර තිබූ කුඹුරු ඉඩම් පෙන්නුම් කරයි.

**රූප සටහන් අංක 12 : කුඹුරු ඉඩම් ගොඩකිරීම නිසා ජලය බැසයාමට බාධා ඇතිවී ඇති ආකාරය**





මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණ වාර්තා - නාගරික සංවර්ධන අධිකාරිය, මාතර දිස්ත්‍රික් කාර්යාලය, 2017

**රූප සටහන් අංක 13 : ගොඩකර ඇති සහ ගොඩකිරීමට යෝජිතව තිබූ කුඹුරු ඉඩම්**




මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය, මාතර දිස්ත්‍රික් කාර්යාලය, ක්ෂේත්‍ර සමීක්ෂණ වාර්තා 2017

## 2. කෘෂිකර්මාන්තය ආශ්‍රිත රෝගාබාධ

වී වගාව ප්‍රධානතම කෘෂි බෝග වගාව වන අතර, ඒ ආශ්‍රිත රෝග වර්ධනය වීම නිසා නව පරපුර වී වගාවට පෙළඹීමට මැලිකමක් දක්වයි. එමනිසා යන්ත්‍රෝපකරණ භාවිතයද සීඝ්‍රයෙන් වැඩිවීමේ ලක්ෂණයක් පෙන්වයි. මේ නිසා ශ්‍රමය පදනම් කරගත් කෘෂිකර්මාන්තයට බාධාවක් ඇති වේ. ඒ අනුව වගු අංක 07 මඟින් 2010 සිට 2017 දක්වා බෝ නොවන රෝග පැතිරීම පෙන්නුම් කර ඇත.

**වගු අංක 07 : බෝ නොවන රෝග (මී උණ) ව්‍යාප්තිය : 2010, 2017**

| වර්ෂය | මී උණ රෝගීන් සංඛ්‍යාව | වර්ෂය | මී උණ රෝගීන් සංඛ්‍යාව |
|---|---|---|---|
| **2010** | 11 | **2014** | 09 |
| **2011** | 28 | **2015** | 21 |
| **2012** | 03 | **2016** | 06 |
| **2013** | 07 | **2017** | 12 |

මූලාශ්‍රය : සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය , හක්මන (2011, 2017)

## අවස්ථා

1. **දකුණු පළාත තුල පාරිසරික සංචාරක කර්මාන්තයට ඇති විභවතාවය.**

   දකුණු පළාතේ වෙරළාශ්‍රිත නගර වන තංගල්ල, දික්වැල්ල, මිරිස්ස වැනි නගර විදේශීය සංචාරක නගර ලෙස වැඩිදියුණු වී ඇත. කෙසේ නමුදු එවැනි නගර ආශ්‍රිතව පාරිසරික සංචාරක කර්මාන්තය දියුණු කිරිමට විභවතාවයක් සහිත ප්‍රදේශ නොමැත. තවද, කතරගම, උඩවලව, සිංහරාජ වැනි සංචාරක ආකර්ශනයක් සහිත ප්‍රදේශ වලට ගමන් ගන්නා සංචාරකයින් විශාල ප්‍රමාණයක් හක්මන හරහා ගමන් කිරිම ද ප්‍රබලතාවක් වේ. එමෙන්ම ප්‍රාථමික අධ්‍යාපන විෂය ධාරාව යටතේ රජයේ පාසල්වල කමත් භාෂාව හා සාම්ප්‍රදායික කෘෂිකර්මාන්තය පිළිබඳ දැනුම විෂය ධාරාවට ඇතුලත් කර ඇත.

   ඒ අනුව, හක්මන නගරය ආශ්‍රිතව පාරිසරික සංචාරක කර්මාන්තයට ඇති විභවතාවය ඉවහල් කරගෙන සංචාරක කර්මාන්තය හඳුන්වාදීම තුලින් එම ප්‍රදේශවල කෘෂි බෝග වගාකරුවන්ගේ ආදායම් මාර්ග වැඩිවීම නිසා ඔවුන් තවදුරටත් එම කර්මාන්තයේ නියැලීමට උත්සාහ ගනී. ඒ තුළින් කෘෂිකර්මය පදනම් කරගත් නීල හරිත පරිසරය සුරැකීමට අවස්ථාව සැලසේ.

## තර්ජන

1. **කාලගුණික විපර්යාස මඟින් සිදුවන වර්ෂාපතන රටාවේ වෙනස්වීම්**

   ගෝලීය උෂ්ණත්වය වැඩිවීම හේතුවෙන් කාලගුණික හා දේශගුණික විපර්යාසයන්ට ලක්වෙමින් පවතී. මේ නිසා වර්ෂාපතන රටාව වෙනස්වීම, වර්ෂාපතනයේ තීව්‍රතාවය වෙනස්වීම ආදී සංසිද්ධීන්ට මුහුණ පෑමට සිදුවේ. කෘෂිකර්මාන්තය හා බැඳුණු ආර්ථික ක්‍රමයක් පවතින හක්මන ප්‍රදේශයේ කාලගුණික හා දේශගුණික විපර්යාස හේතුවෙන් බෝග වගා රටාවන් (යල, මහ කන්න) සහ බෝගවල අස්වැන්න අඩුවීම, කෘමි උවදුරු වැඩිවීම සහ හදිසි ජල ගැලීම්, නියඟ වැනි පාරිසරික තත්ත්වයන්ට මුහුණපායි. මේ නිසා කෘෂි ආශ්‍රිත ආදායම් මාර්ගවල කාලීන උච්චාවචනයන් සිදුවේ. එය කෘෂිකර්මය සංරක්ෂණයට තර්ජනයක් ලෙස පවතී.

# 6. සංවර්ධන සැලැස්ම

## 6.1. සංකල්පිත සැලැස්ම


හක්මන නගර සංකල්පිත සැලැස්ම මඟින් නගරයේ අනාගත සංවර්ධනය පිළිබඳ සමස්ථ අර්ථකථනයක් ලබාදෙයි. මෙම සංකල්පනාත්මක සැලැස්ම ප්‍රදේශයේ භූගෝලීය පිහිටීම, පාරිසරික පද්ධතීන් හා භාවිතයන් ප්‍රතිස්ථානගත කිරීම පදනම් කොට සකස් කර ඇති අතර, එය ප්‍රධාන අංශ 03කින් සමන්විත වේ. එනම්, නේවාසික සංවර්ධනය, කෘෂිකාර්මික සංවර්ධනය හා පාරිසරික සංරක්ෂණයයි.

මාතර - මිද්දෙනිය ප්‍රධාන මාර්ගයේ හක්මන - බෙලිඅත්ත හා හක්මන - කඹුරුපිටිය මාර්ග මංසන්ධිගතව හක්මන නගරය පිහිටා ඇත. නගරයේ ප්‍රධානතම විභවතාවය වන්නේ නගරය අතක ඇඟිලි මෙන් දිස්වන යල, මහ දෙකන්නයේම වගා කරන කුඹුරු බිම් පද්ධතියයි. තවද, එම කුඹුරු බිම් පද්ධතිය මඟින් නගරයේ පාරිසරික සමතුලිතතාවය ආරක්ෂා කිරීම, වැසි ජලය පාලනය, නගරයේ ස්වභාවික සෞන්දර්ය ආරක්ෂාවීම මෙන්ම මෙම නගරයේ විවෘත ඉඩකඩ සැපයීම සිදුකරයි. තවද, ආපදා අවමවීම හා පිවිසීමේ හැකියාව (සුගමතාවය) ද ප්‍රධාන ශක්තීන් වේ.

නගර සංවර්ධන සැලැස්මේ මූලික දැක්ම වන්නේ හක්මන නගරය "හරිත නිම්නයේ නිවසන" ලෙස සංවර්ධනය කිරිමයි. එහිදී ස්වභාව ධර්මයේ ආශිර්වාදයත් නීල හරිත සංවර්ධනයත් කැටිවූ කෘෂි වටපිටාව ආරක්ෂා කරගනිමින් හක්මන වැසියන්ට හා පෝෂක ප්‍රදේශයේ ජනයාට 2030 වන විට ස්වභාව ධර්මයට අනුරූප වූ නේවාසික නගරයක් ලෙස සංවර්ධනය කිරීම මෙහෙවර වේ. මෙම මෙහෙවර ඉටු කරගනිමින් දැක්ම ළඟා කර ගැනීම අරභයා නගරය සතු ශක්තීන් හා අවස්ථා ප්‍රශස්ථ ලෙස උපයෝගී කරගැනීමට බලාපොරොත්තු වේ.

ඒ අනුව, ඉදිරි සංවර්ධන කටයුතු වලදී හරිත පරිසරය ආරක්ෂා කර උස් බිම් ප්‍රදේශවලට පමණක් සංවර්ධනය ඒකරාශී කිරීම අපේක්ෂාව වේ. එම සංවර්ධනය ඇඟිලි අතර ඇති තීරු ප්‍රදේශවල පමණක් ව්‍යාප්ත වීම නිසා නාගරීකරණය අතක ඇඟිලි මෙන් ව්‍යාප්ත වීම, නේවාසිකයන් හරිත බිම් කඩට ඉතා සමීපව ජීවත්වීම හා කුඩා මංසන්ධි ස්ථානයක නූලකින් ගැට ගැසුනු මුතු මාලයක් ලෙස සංවර්ධනය වීම වැනි මූලධර්ම අන්තර්ගත වේ.

**රූප සටහන් අංක 14 : සංකල්පනාත්මක සැලැස්ම**



***"හරිත නිම්නයේ නිවසන"***
***Living in Green Valley"***

## 6.2. යෝජිත ඉඩම් පරිහරණ සැලැස්ම

වසර 2030 වන විට හක්මන නගරය තුල භූමියෙහි අපේක්ෂිත ව්‍යුහය විදහාපාන සැලැස්ම ඉඩම් පරිහරණ සැලැස්ම වේ. ඒ අනුව, නගරය "හරිත නිම්නයේ නිවසන" ලෙස සංවර්ධනය කිරිම සඳහා නොගැලපෙන භාවිතයන් සුදුසු ස්ථාන කරා යොමු කිරිම පදනම් කරගෙන යෝජිත ඉඩම් පරිහරණ සැලැස්ම සකස් කර ඇති අතර, ඒ තුළින් නගරයේ රාජ්‍ය ආයතන, වාණිජ කටයුතු, සංචාරක කටයුතු, ජල මාර්ග, මහා මාර්ග, භූ දර්ශන කටයුතු වසර 2030 වන විට පැවතිය යුතු ආකාරය දක්වා ඇත.

යෝජිත සංවර්ධන සැලැස්මේ ප්‍රබලතා හා ශක්තීන් මත නේවාසික සංවර්ධනය කෙරෙහි වැඩි අවධානයක් යොමු කර ඇත. ඒ අනුව, මධ්‍ය ඝනත්ව කලාපය සහ අඩු ඝනත්ව කලාපය තුල නේවාසික කටයුතු ව්‍යාප්ත කිරිමට සැලසුම් කර ඇත. තවද, ඝනත්ව කලාපය තුල නේවාසික කටයුතු අවම මට්ටමකින් පවත්වා ගනිමින් ඉහල වාණිජ සංවර්ධනයක් ළඟාකර ගැනීම සඳහා වාණිජ කටයුතු වලට ප්‍රමුඛත්වය දෙනු ලැබේ. එහිදී තිරස් සංවර්ධනයට වඩා සිරස් සංවර්ධනය කෙරෙහි වැඩි අවධානයක් යොමුකර ඇත. එමෙන්ම, අධ්‍යාපන ආයතන සහ වැඩි ඉඩකඩක් අවශ්‍ය වන ඉඩම් පරිහරණ කටයුතු සඳහා එම කලාපය තුල අවසර දෙනු නොලැබේ.

නගරය තුල පවතින කුඹුරු පද්ධතිය ඒ ආකාරයෙන්ම පවත්වාගෙන යාම සඳහා හරිත සංරක්ෂණ කලාපයක් සැලැස්ම තුලින් හඳුනාගෙන ඇත. ඊට අමතරව හරිත මංතීරු සහිතව මාර්ග සංවර්ධනය කිරිමට හඳුනාගෙන ඇති අතර, ජලවහන පද්ධතිය ආරක්ෂා කර ගැනීම සඳහා හරිත කලාප වෙන්කර ඇත. කෙසේ නමුත්, එම කලාපය තුල පවත්නා ප්‍රබලතාවය වටහාගෙන ස්ථාන 02ක් කෘෂි පාදක සංචාරක කර්මාන්තය සඳහා යොදාගැනීමට භූමි පරිහරණ සැලැස්ම තුලින් හඳුනාගෙන ඇත. එමඟින් තෙත් බිම් පරිසර පද්ධතියට හානියක් නොවන පරිදි සහ නගරයේ අලංකාරය සහ වාණිජ පරමාර්ථය ළඟා කර ගැනීම සඳහා රටා වී වගාව එම කලාපය තුල ස්ථාන 02ක හඳුනාගෙන ඇත.

විශේෂයෙන්ම සතිපොල ඉදිරිපිට කුඹුරු තීරය සිංහයෙකුගේ හැඩය ගන්නා පරිදි වී වගා රටාව ව්‍යාප්ත කිරිමට හඳුනාගෙන ඇත. තවද, බස් නැවතුම්පලට ආසන්න කුඹුරු තීරය මෙන්ම යෝජිත බුද්ධ ජයන්ති විද්‍යාලය ඉදිකරන භූමිය අවටද කෘෂි පාරිසරික සංචාරක කර්මාන්තය ඉවහල් වන ආකාරයේ නිර්මිත පරිසරයක් ඇතිකිරිමට භූමි පරිහරණ සැලැස්ම තුලින් සැලසුම් කර ඇත. තවද, අතක ඇඟිලි මෙන් දිස්වන කුඹුරු පද්ධතියේ අතක රේඛා මෙන් ඇති ජල පද්ධතිය සංරක්ෂණය කිරිමට මෙන්ම එම ඇළ ඉවුරු සංරක්ෂණය කිරිම පාදක කරගෙන එම ඉවුරු විශේෂ හරිත සෙවණ සහිත ඇවිදින මංතීරු සැලසුම් කර ඇත. යෝජිත ඉඩම් පරිහරණ සැලැස්ම


සිතියම් අංක 11 මඟින් පෙන්නුම් කරන අතර, එහි හරස්කඩ කිහිපයක් රූප සටහන් අංක 14 මඟින් පෙන්නුම් කර ඇත.

යෝජිත ඉඩම් පරිහරණ සැලැස්මේ හරස්කඩ 02ක් A – A සහ B – B මඟින් පෙන්වා ඇත. A – A හරස්කඩ සැලැස්මේ ප්‍රධාන වාණිජ ප්‍රදේශය කැපී යන ලෙස ඊශාන නිරිත දිශානුගතව නිර්මාණය කර ඇත. ඒ අනුව, ඝනත්ව කලාපයට වැඩි ප්‍රමුඛතාවයක් දෙන ලෙස එම හරස්කඩ නිර්මාණය කර ඇති අතර, දෙපසට යත්ම අනෙකුත් කලාපවල ගොඩනැගිලි භූමියට අනුව නිර්මාණය වී ඇති බව පෙන්වයි. තවද, B – B හරස්කඩ මඟින් මාතර - වලස්මුල්ල මාර්ගයට සමාන්තරව එක් එක් කලාප මත 2030 වන විට යෝජිත නිර්මිත තත්ත්වය විදහා පෙන්වයි.


C-C දරණ හරස්කඩ හක්මන නගරයේ සතිපොල ආසන්නයේදී දර්ශනය වන ආකාරය දක්වයි. එමඟින් ප්‍රධාන මාර්ගයේ හරස්කඩ මෙන්ම කුඹුරු ඉඩම් පද්ධතිය සහ 2030 වන විට ඝනත්ව කලාපය තුල ඇති වන නිර්මිත පරිසරයත් කඳු බිම් ප්‍රදේශවල සංවර්ධනය ව්‍යාප්ත වන ආකාරයත් පෙන්නුම් කරයි.

හරස්කඩ අංක D – D වලස්මුල්ල - මාතර මාර්ගයට සම්බන්ධව බෙලිඅත්ත දිශාව පෙනෙන ලෙස සකස් කර ඇත. විශේෂයෙන්ම සමාජ ආකර්ශනයක් ලඟාකර ගැනීම සඳහා හඳුනාගෙන ඇති වී වගාව මත කණු මත ඉදිකිරිමට යෝජිත කුඩා සංචාරක මධ්‍යස්ථානය සහ කඳු බිම්, කුඹුරු ඉඩම් සහ අනෙකුත් යටිතල පහසුකම් වල ව්‍යාප්තිය එමඟින් දක්වා ඇත. තවද, නාගරික ප්‍රදේශයේ සංචාරය කරන පුද්ගලයෙකුට නගරයෙන් ක්‍රමයෙන් ඈත්වත්ම නාගරික, අර්ධ නාගරික සහ ග්‍රාමීය වශයෙන් නැමියාවක් ලෙස නගරය සංවර්ධනය කිරිමට කලාපීය සැලැස්ම සහ ඉඩම පරිහරණ සැලැස්ම මඟින් සැලසුම් කර ඇත. එම තත්ත්වය මැනවින් විද්‍යාමාන වන ලෙස E – E හරස්කඩ නිර්මාණය කර ඇත.

**සිතියම් අංක 11 : යෝජිත ඉඩම් පරිහරණ සැලැස්ම : හක්මන නාගරික සංවර්ධන ප්‍රදේශය -2030**




**රූප සටහන් අංක 15 : යෝජිත ඉඩම් පරිහරණ සැලැස්මේ හරස්කඩ**




හරස්කඩ C – C



හරස්කඩ D – D



හරස්කඩ E – E



## 6.3. භෞතික හා සාමාජීය අපරව්‍යුහ පහසුකම් සංවර්ධන උපක්‍රම

### 6.3.1. යෝජිත සේවා සැලැස්ම

නගරය තුළ නාගරික ජනයාට අවශ්‍ය විවිධ සේවා පවතී. ඒවා අතර නිවාස, සෞඛ්‍යය, අධ්‍යාපනය, ජලය, විදුලිය, මාර්ග හා ගමනාගමනය යනාදිය ප්‍රධාන වේ.

යෝජිත සේවා සැලැස්මේදී නගරයෙහි 2030 වර්ෂය වන විට අපේක්ෂිත ජනගහනයත් දැනට පවත්නා සේවා පහසුකම් ප්‍රමාණයත් පදනම් කොටගෙන සේවා අවශ්‍යතාවය හඳුනාගෙන ඇති අතර, අපේක්ෂිත ජනගහනය සඳහා අවශ්‍ය ප්‍රමාණය නැතහොත් ඉල්ලුමට සරිලන පරිදි සේවා සැපයුම කෙසේ සිදුකරන්නේ ද යන්න සැලසුම් කර ඇත.

හක්මන නගරයෙහි 2030 වර්ෂය වන විට අපේක්ෂිත ජනගහනය සඳහා අවශ්‍ය නිවාස, සෞඛ්‍ය හා අධ්‍යාපනික සේවා සැලසුම් කිරිම මෙම සේවා සැලැස්ම මගින් සිදුකරනු ලැබේ.

හක්මන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය වර්ග කිලෝ මීටර් 53.8 ක භූමි ප්‍රමාණයකින් සමන්විත වන අතර, ඉන් වර්ග කිලෝ මීටර් 3.06 ක ප්‍රමාණයක් නාගරික සංවර්ධන ප්‍රදේශයට අයත් වේ. එහි 2030 වන විට අපේක්ෂිත ජනගහනය පහත වගු අංක 08 පරිදි වේ.

**වගු අංක 08 : ජනගහනය හා නිවාස : හක්මන නාගරික සංවර්ධන ප්‍රදේශය**

| විස්තරය | 2011 වර්ෂය | | 2030 වර්ෂය |
|---|---|---|---|
| භූමි ප්‍රමාණය | දළ | 306.93 | 306.93 |
| | ශුද්ධ | 194.47 | 194.47 |
| මුළු ජනගහනය | 3093 | | 3220 |
| නිවාස සංඛ්‍යාව | 820 | | 854 |
| නිවාස ඝනත්වය | දළ | 2.67 | 2.78 |
| | ශුද්ධ | 4.21 | 4.39 |
| ජන ඝනත්වය | දළ | 10.07 | 10.49 |
| | ශුද්ධ | 15.9 | 16.55 |

මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය, මාතර දිස්ත්‍රික් කාර්යාලය (2017)

ඉහත වගුවට අනුව හක්මන නාගරික ප්‍රදේශයෙහි අපේක්ෂිත ජනගහන වර්ධනය 2011-2030 වර්ෂ අතර වෙනස පුද්ගලයින් 127කි. ඒ අනුව, පවතින නිවාස සංඛ්‍යාවට අමතරව නව නිවාස 34ක අවශ්‍යතාවයක් පෙන්නුම් කරයි. මෙයට වර්තමානයෙහි පවතින තාවකාලික නිවාස ද එකතු කළ විට නිවාස අවශ්‍යතාවය 41 ක් වනු ඇත.

සංවර්ධන සැලැස්මේ දැක්මට අනුව නේවාසික නගරයක් ලෙස නගරය සංවර්ධනය කිරිමට හඳුනාගෙන ඇත. ඒ අනුව මධ්‍ය ඝණත්ව කලාපය හා අඩු ඝනත්ව කලාපය තුළ නේවාසික

කටයුතු සඳහා ප්‍රමුඛතාවය ලබාදෙන අතර, සනත්ව කලාපය තුළ නේවාසික කටයුතු සඳහා භූමියෙන් 25% ක පමණ ප්‍රමාණයක් සංවර්ධනය කිරිමට අපේක්ෂා කරයි. එය අනාගත නිවාස අවශ්‍යතාවය සපුරා ගැනිම සඳහා උපක්‍රමයක් ලෙස යොදාගනු ලැබේ.

මේ අනුව සංවර්ධන සැලැස්මෙන් අපේක්ෂා කරන හක්මන නගරය නේවාසික නගරයක් ලෙස සංවර්ධනය කිරිමට අවශ්‍ය ඉඩම් ප්‍රමාණය නගරය තුළ පවතින අතර, එක් පවුලක් සඳහා නැතහොත් එක් නිවසක් සඳහා හෙක්ටයාර් 1ක පමණ ඉඩම් ප්‍රමාණයක් හිමිවනු ඇත. එය සංවර්ධන සැලැස්මේ දැක්ම කරා යාමේ ප්‍රබලතාවයක් වේ.

**සෞඛ්‍ය අංශය**

සෞඛ්‍ය අංශය සම්බන්ධයෙන් හක්මන නාගරික ප්‍රදේශයට සේවා සපයන රජයේ රෝහල් 02ක් නාගරික ප්‍රදේශයෙන් පිටත පෝෂක ප්‍රදේශයේ නගරයට ඉතා ආසන්නව පිහිටා ඇත. ඉන් නරවැල්පිට රජයේ රෝහල නගරයේ සිට කි.මී. 4ක් පමණ දුරින් පිහිටා ඇති අතර, ගංගොඩගම රජයේ රෝහල කි.මී. 3ක් පමණ දුරින් පිහිටා ඇත. තවද, නාගරික ප්‍රදේශය තුළ මහජන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය හා රජයේ බෙහෙත් ශාලාවක් පිහිටා ඇත. මීට අමතරව පෞද්ගලික වෛද්‍ය මධ්‍යස්ථාන 06ක් නගරය තුළ ස්ථාපිතව ඇත.

ප්‍රදේශය තුළ ඇති රජයේ රෝහල් තොරතුරු පහත වගු අංක 09 හි පරිදි වේ.

**වගු අංක 09 : රජයේ රෝහල් තොරතුරු : හක්මන නාගරික සංවර්ධන ප්‍රදේශය - 2016**

| රෝහල | වාර්ෂික නේවාසික රෝගීන් සංඛ්‍යාව | වාර්ෂික බාහිර රෝගීන් සංඛ්‍යාව | ඇඳන් සංඛ්‍යාව | ඇඳ අනුපාතය ( %) | වෛද්‍යවරු සංඛ්‍යාව | හෙද නිලධාරීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| 1. ගංගොඩගම රජයේ රෝහල | 4000 | 11362 | 54 | 30 | 03 | 11 |
| 2. නරවැල්පිට රජයේ රෝහල | 3387 | 51968 | 66 | 38 | 03 | 08 |

මූලාශ්‍රය : ලේඛනාගාර තොරතුරු, රජයේ රෝහල ගංගොඩගම, රජයේ රෝහල, නරවැල්පිට - 2016

ඉහත වගුවට අනුව, ප්‍රදේශය තුළ පවත්නා රෝහල් දෙකෙහිම වාර්ෂික බාහිර රෝගීන් සංඛ්‍යාව නේවාසික රෝගීන් සංඛ්‍යාවට වඩා ඉහල අගයක් ගනී. ඇඳ අනුපාතය 2016 වර්ෂයේදී ගංගොඩගම රෝහලෙහි 30% ක් වන අතර, නරවැල්පිට රෝහලෙහි 38% ක් වේ. ඒ අනුව ඇඳන් ඌණ භාවිතයේ පවතින බව පැහැදිලි වේ.

2030 වර්ෂය වන විට අපේක්ෂිත නේවාසික ජනගහන වර්ධනය පුද්ගලයින් 127 ක් වැනි සුළු ප්‍රමාණයකි. ඒ අනුව, වර්තමානයෙහි පවතින සෞඛ්‍ය අංශයේ පහසුකම් 2030 වසර වන විට ද ප්‍රමාණවත් වනු ඇත.

**අධ්‍යාපන අංශය**

හක්මන නගරය තුල ප්‍රාථමික පාසල් 02ක් හා මධ්‍ය මහා විද්‍යාල 02 ක් පවතී. මෙම පාසල් තුල වර්තමානය වන විට පවත්නා මානව හා භෞතික සම්පත් ප්‍රමාණය පහත වගුව මඟින් දක්වා ඇත. 2011 ජන හා නිවාස සංගණනයට අනුව හක්මන නගරයේ සාක්ෂරතා මට්ටම 98% ක් පමණ වන අතර, එය දිස්ත්‍රික්කයේ සාක්ෂරතා මට්ටමට සමාන අගයක් ගනී. මේ අනුව, හක්මන නගරයේ සාක්ෂරතාවය සතුටුදායක මට්ටමක පවතින බව හඳුනාගත හැකිය.

ප්‍රදේශයේ අධ්‍යාපන පහසුකම් සැපයීම සම්බන්ධයෙන් වැදගත් වන රජයේ පාසල් 04 ක් පවතින අතර, ඉන් බුද්ධ ජයන්ති විද්‍යාලය සහ කෝංගල ප්‍රාථමික විද්‍යාලය ප්‍රාථමික පාසල් වන අතර, කෝංගල මධ්‍ය විද්‍යාලය හා මෙතෝදිස්ත විද්‍යාලය ජාතික පාසල් වේ. ඒවායේ තොරතුරු වගු අංක 10 මගින් දක්වා ඇත.

**වගු අංක 10 : පාසල් පිළිබඳ තොරතුරු : හක්මන නාගරික සංවර්ධන ප්‍රදේශය - 2016**

| අනු අංකය | විදුහලේ නම | ගුරුවරුන් ප්‍රමාණය | සිසුන් ප්‍රමාණය | ගුරු සිසු අනුපාතය | ගොඩනැගිලි ඉඩකඩ ව.මී. | ශිෂ්‍යයෙක් සඳහා පන්ති කාමර ඉඩකඩ | ක්‍රීඩා පිටි |
|---|---|---|---|---|---|---|---|
| 01 | කෝංගල ප්‍රාථමික විදුහල | 28 | 703 | 25 | 1004 | 1.43 | නැත |
| 02 | කෝංගල මධ්‍ය මහා විද්‍යාලය | 62 | 656 | 11 | 1376 | 2.10 | ඇත |
| 03 | බුද්ධ ජයන්ති ප්‍රාථමික විදුහල | 24 | 632 | 26 | 802 | 1.28 | නැත |
| 04 | මෙතෝදිස්ත මහා විද්‍යාලය | 65 | 1267 | 19 | 1097 | 0.87 | ඇත. |
| **එකතුව** | | **179** | **3258** | **18** | **4279** | **1.3** | |

මූලාශ්‍රය : පාසල් පිළිබඳ වාර්ෂික වාර්තාව, කොට්ඨාශ අධ්‍යාපන කාර්යාලය, මුලටියන - 2016

ඉහත වගුවට අනුව සමස්ථයක් ලෙස හක්මන නගරයෙහි පාසල් තුල සිසුන් 3258 ක් අධ්‍යාපනය ලබන අතර, ගුරුවරු 179 ක් සේවය කරනු ලබයි. මේ අනුව ගුරු සිසු අනුපාතය එක් ගුරුවරයකු සඳහා සිසුන් 18කි. මෙහි සම්මත තත්ත්වය එක් ගුරුවරයෙකු සඳහා සිසුන් 19ක් වන බැවින්, ප්‍රදේශයේ පාසල් තුළ ගුරු සිසු අනුපාතය සතුටුදායක මට්ටමක පවතින බව හඳුනාගත හැකිය.


සමස්තයක් ලෙස එක් ශිෂ්‍යයකු සඳහා වන පන්ති කාමර ඉඩකඩ ප්‍රමාණය වර්ග මීටර් 1.3 ක් වන අතර, එය සම්මත අගය වන 0.9 ට වඩා වැඩි අගයක් ගැනීම සතුටුදායක තත්ත්වයකි.

අධ්‍යාපන කටයුතු සම්බන්ධයෙන් පවතින ප්‍රධාන ගැටළුවක් වන්නේ ක්‍රීඩාපිටි පහසුකම් ප්‍රමාණවත් නොවීමය. ඒ සඳහා උපක්‍රමයක් ලෙස බුද්ධ ජයන්ති විද්‍යාලය ප්‍රතිස්ථානගත කිරිමේදී ක්‍රීඩාපිටියක් සඳහා දැනට එම විද්‍යාලය පවතින භූමියට ඉදිරිපස අක්කර 02ක පමණ ඉඩමක් හඳුනාගෙන ඇත. තවද, මහජන ක්‍රීඩාංගනය සියළුම පාසල් සඳහා පහසුවෙන් ප්‍රවේශ විය හැකි පරිදි පාසල් භූමි අසල  සිට ක්‍රීඩාංගනය දක්වා හරිත මංතීරු ඉදිකිරිමට හඳුනාගෙන ඇත.

ඉහත රජයේ පාසල්වලට අමතරව ජාතික ආධුනිකත්ව මණ්ඩලය මඟින් පවත්වාගෙන යනු ලබන පරිගණක පුහුණු ආයතනයක් නගරය තුළ පවතී. තවද, උපකාරක පන්ති 07 ක් හා පෙර පාසල් 05ක් නාගරික ප්‍රදේශය තුළ පවතී.

බුද්ධ ජයන්ති විද්‍යාලයෙහි පවත්නා ගොඩනැගිලි අබලන් තත්ත්වයේ පවතින බැවින් විධිමත් පංතිකාමර ඉඩකඩ ලබාදීම සඳහා නව ගොඩනැගිල්ලක් ඉදිකිරිමට හා ක්‍රීඩා පිටියක් ඉදිකිරීම සඳහා භූමිය හඳුනාගෙන ඇත.

**සිතියම් අංක 12 : අධ්‍යාපන සේවා පෝෂක ප්‍රදේශය : හක්මන නාගරික සංවර්ධන ප්‍රදේශය**




**යොමුව**

**අධ්‍යාපන පහසුකම් ව්‍යාප්තිය**

- කි.මී. 1
- කි.මී. 2

1:16,000

**සිතියම් අංක : 12**

**අධ්‍යාපන සේවා පෝෂක ප්‍රදේශය : හක්මන නාගරික සංවර්ධන ප්‍රදේශය - 2017**

හක්මන නාගරික සංවර්ධන සැලැස්ම (2019 - 2030)

නාගරික සංවර්ධන අධිකාරිය

| | |
|---|---|
| සකස් කළ දිනය | : 2018 දෙසැම්බර් 10 |
| යාවත්කාලීන කලේ | : 2019 |
| මූලාශ්‍රය | : නා.සං.අ. මාතර කාර්යාලය |
| සකස් කළේ | : ජේ.බී.බී. ජීවන්දර |

නාගරික සංවර්ධන අධිකාරිය

### 6.3.2 යෝජිත ප්‍රවාහන සැලැස්ම

හක්මන නගරය මාතර, වලස්මුල්ල, කඹුරුපිටිය හා බෙලිඅත්ත යන ප්‍රධාන නගර සම්බන්ධ වන මාර්ග මංසන්ධියක පිහිටි නගරයකි. එබැවින් එම නගර හා සම්බන්ධ වන විධිමත් බස් සේවාවක් වර්තමානය වන විට ද නගරය තුල ක්‍රියාත්මක වේ. එසේම, අකුරැස්ස, මිද්දෙනිය, ඇඹිලිපිටිය, කතරගම, කොළඹ වැනි නගර හා සම්බන්ධ වන දුර ගමන් සේවා බස් රථ ද හක්මන නගරයෙන් ආරම්භ වේ. තවද, නගරය හරහා යන බස් රථ සේවාව ද නගරය සංවර්ධනයේදී ප්‍රබලතාවයක් වී ඇත. ඒ අනුව, දැනට පවත්නා ප්‍රවාහන පහසුකම් පිළිබඳ වගු අංක 11 මඟින් පෙන්නුම් කෙරේ.

**වගු අංක 11 : ප්‍රවාහන තත්ත්වය: හක්මන නාගරික සංවර්ධන ප්‍රදේශය 2017**

| අනු අංකය | විස්තරය | 2017 | |
|---|---|---|---|
| | | බස් රථ සංඛ්‍යාව | ගමන් වාර සංඛ්‍යාව |
| 01 | හක්මන නගරය හරහා යන බස් රථ සංඛ්‍යාව | 36 | 149 |
| 02 | හක්මන නගරයෙන් ආරම්භ වන බස් රථ සංඛ්‍යාව | 69 | 353 |

මූලාශ්‍රය : මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය

සංවර්ධන සැලැස්මෙහි දැක්ම කරා ළඟා වීමේදී අපේක්ෂා කරන නාගරික ජනගහනය සඳහා යෝජිත ප්‍රවාහන සැලැස්ම මඟින් පහත උපාය මාර්ග හඳුනාගෙන ඇත.

**ප්‍රවාහන උපාය මාර්ග :**

නේවාසික සංවර්ධනයට ප්‍රමුඛතාවය දෙමින් පරිසර හිතකාමී සංවර්ධනයක් ළඟා කර ගැනීම අරමුණු කොටගෙන සකස් කරන ලද ප්‍රවාහන උපාය මාර්ග පහත දක්වා ඇත.

පොදු ප්‍රවාහනය විධිමත් කිරීම සහ නගරයේ අනන්‍යතාවය ආරක්ෂා වන පරිදි සහ සියළුම ප්‍රධාන මාර්ග ආවරණය වන පරිදි මීටර් 500ක අන්තරයකින් දුරින් පෞද්ගලික ආයෝජකයින්ගේ දායකත්වයෙන් බස් නැවතුම් ස්ථාන ඉදිකිරීමට හඳුනාගෙන ඇත. (සිතියම් අංක 13) තවද, නගරය තුල විධිමත් රථවාහන ගමනාගමන රටාවක් ඇතිකිරීම සඳහා සහ රථවාහන තදබදය අවම කිරීමේ උපක්‍රමයක් ලෙස දැනට සතිපොල පවතින භූමියෙන් කොටසකද, දැනට පොදු වෙළඳපොල පවතින භූමිය ද බුද්ධ ජයන්ති විද්‍යාලය අසල ද රථවාහන නැවතුම් ස්ථාන ඉදිකිරීමට හඳුනාගෙන ඇත.

අපේක්ෂිත 15,500 ක් වන දෛනික සංසරණ ජනගහනය සඳහා දැනට පවතින බස් නැවතුම්පොළ ප්‍රමාණවත් නොවන බැවින් ඒ සඳහා උපාය මාර්ගයක් ලෙස පවතින බස් නැවතුම්පොළ පුළුල් කිරිම සඳහා දෙවන අදියර ක්‍රියාත්මක කිරිමට හා එළිමහන් දුර ගමන් සේවා බස් නැවතුම් ස්ථාන පහසුකම් සැපයීමට හඳුනාගෙන ඇත.

එමෙන්ම, පයින් ගමන් කරන්නන් දිරිමත් කිරිම, වායුගෝලීය කාබන්ඩයොක්සයිඩ් සහ ඊයම් ප්‍රතිශතය අඩු කිරිම සහ වායුගෝලීය උෂ්ණත්වය අඩු කිරිම සඳහා හරිත මංතීරු සහිතව පදික මංතීරු ඉදිකිරිම සහ ඇළ ඉවුරු හරිත මංපෙත් සහිතව සංවර්ධනය කිරිමට හඳුනාගෙන ඇත.

තවද, 2030 වන විට අපේක්ෂිත නේවාසික සහ සංසරණ ජනයාගේ ප්‍රවාහන අවශ්‍යතා සඳහා පොදු ප්‍රවාහන සේවයෙහි විශාල වර්ධනයක් අවශ්‍ය නොවන අතර, පුද්ගලික ප්‍රවාහන සේවය සඳහා අවශ්‍ය පහසුකම් වැඩිදියුණු කළ යුතු වේ. ඒ අනුව, පවතින මාර්ග වැඩිදියුණු කිරිම, විකල්ප මාර්ග සංවර්ධනය, නව මාර්ග සංවර්ධනය, අතුරු මාර්ග සංවර්ධනය, රථවාහන නැවතුම් ස්ථාන සංවර්ධනය කිරිම ප්‍රධාන ප්‍රවාහන උපක්‍රමයක් ලෙස හඳුනාගෙන ඇත.

2030 වන විට හක්මන නගරයේ රථ වාහන කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරිම සහ පදිකයින්ගේ ආරක්ෂාව තහවුරු කිරීම සහ නගර අලංකරණය වර්ධනය කිරිම මාර්ග හා ගමනාගමන උපාය මාර්ග තුළින් බලාපොරොත්තු වේ. (සිතියම් අංක 13) එහිදී කාර්යක්ෂම ගමනාගමන රටාවක් ඇති කිරිම සඳහා පහත සඳහන් පරිදි මාර්ග සංවර්ධන උපක්‍රම හඳුනාගෙන ඇත.

**ප්‍රධාන මාර්ග සංවර්ධනය**

පදිකයින් ධෛර්යමත් කිරිම සඳහා මාතර - වලස්මුල්ල ප්‍රධාන මාර්ගය (B ශ්‍රේණිය) නගර සීමාවේදී මංතීරු 02 ක් සහිතව සහ බස් නැවතුම් පොලේ සිට කෝංගල මහා විද්‍යාලය දක්වා පදික මංතීරු සහිතව සංවර්ධනය කිරිමට සහ හක්මන - කඹුරුපිටිය මහා මාර්ගය (B ශ්‍රේණිය) ප්‍රධාන මාර්ගයේ සිට මුරුතමුරය වැව දක්වා මංතීරු 02 ක් සහිතව සංවර්ධනය කිරිමට හඳුනාගෙන ඇත.

**වට රවුම් මාර්ග සංවර්ධනය**

මාතර - වලස්මුල්ල මාර්ගයේ සිට පුෂ්පාරාම මාර්ගය හරහා ඇල්ලෙවෙල මාර්ගයට ද, ඇල්ලෙවෙල මාර්ගයේ සිට බැන්ටිස් සමරවීර මාවත ඔස්සේ මුරුතමුරය මාර්ගය හරහා යලිත් හක්මන - මාතර ප්‍රධාන මාර්ගයටද, එතැන් සිට පෙරහැර මාවත මාර්ගය ඔස්සේ බෙලිඅත්ත මාර්ගයටද යලිත් උඩුපීල්ලගොඩ මාර්ගයෙන් කෝංගල ප්‍රාථමික විද්‍යාලය දක්වාත්, නගරය වටා පවත්නා මාර්ග පද්ධතිය සංවර්ධනය කිරිමට හඳුනාගෙන ඇත.

**නව මාර්ග සංවර්ධනය**

බෙලිඅත්ත මාර්ගය හා මාතර - මීද්දෙනිය මහා මාර්ගය හමුවන මංසන්ධිය සමඟ ඇල්ලෙවෙල මාර්ගයේ ආරම්භක ස්ථානය සම්බන්ධ වන ලෙස නව මාර්ගයක් සංවර්ධනය කිරීම. (හතර මං සන්ධියක් වන ලෙස)


**අතුරු මාර්ග සංවර්ධනය**

පදිකයන්ගේ ප්‍රයෝජනයට යොදාගත හැකි පරිදි අතුරු මාර්ග කීපයක් සංවර්ධනය කිරීමට හඳුනාගෙන ඇත.

1. බස් නැවතුම්පොළෙහි සිට යෝජිත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය දක්වා වන මාර්ගය.
2. බස් නැවතුම්පොළෙහි සිට යෝජිත බුද්ධ ජයන්ති ප්‍රාථමික විද්‍යාලයෙහි ගොඩනැගිල්ල සහ සති පොල සම්බන්ධ වන ලෙස කුඹුර හරහා ඇළ ඉවුරු ඔස්සේ යෝජිත පදික මංතීරුව.
3. බස් නැවතුම්පොළ සහ ඇල්ලෙවෙල මාර්ගය සම්බන්ධ වන මංතීරු 02 ක් සහිත මාර්ගය.

මාර්ග සංවර්ධනයට සමගාමීව නගරයේ රථවාහන ගමනාගමනය විධිමත් කිරීම සහ මාර්ගවල රථවාහන තදබදයක් ඇතිවීම වැළැක්වීමේ උපක්‍රමයක් ලෙස නගරයේ තෝරාගත් ස්ථාන කීපයක රථවාහන නැවතුම් ස්ථාන සැලසුම් කර ඇත. එම ස්ථාන ලෙස දැනට සතිපොළ භූමියේ ප්‍රයෝජනයට නොගන්නා කොටස, පවත්නා පොදු වෙළඳ පොළ භූමියේ පිටුපස කොටස, යෝජිත ප්‍රාථමික පාසල් භූමියට ආසන්නව දැනට පාසල පවතින භූමියෙන් කොටසක් ප්‍රධාන වශයෙන් සඳහන් කළ හැකිය

**සිතියම් අංක 13 : ප්‍රවාහන සැලැස්ම : හක්මන නාගරික සංවර්ධන ප්‍රදේශය**




**යොමුව**

| | | |
|---|---|---|
| ප්‍රධාන මාර්ග | හරිත මංතීරු | වාහන නැවතුම් ස්ථාන |
| ඇවිදින මංතීරු | ඇල | බස් නැවතුම්පළ |
| පදික මංතීරු | බස්නැවතුම | හක්මන නගර සභා සීමාව |

1:11,000

**සිතියම් අංක : 13**

**යෝජිත ප්‍රවාහන සැලැස්ම : හක්මන නාගරික සංවර්ධන ප්‍රදේශය - 2030**

හක්මන නාගරික සංවර්ධන සැලැස්ම (2019 - 2030)

නාගරික සංවර්ධන අධිකාරිය

සකස් කළ දිනය : 2018 දෙසැම්බර් 10
යාවත්කාලීන කලේ : 2019
මූලාශ්‍රය : නා.සං.අ. මාතර කාර්යාලය
සකස් කළේ : ජේ.ඕ.බී. ජීවන්දර

නාගරික සංවර්ධන අධිකාරිය

### 6.3.3 යෝජිත ජල සැපයුම

හක්මන නගරය සඳහා ජල සම්පාදන මණ්ඩලය මඟින් නල ජලය බෙදා හැරීම සිදුකරනු ලබන අතර, එම ජලය පරිහරණය කරනු ලබන්නේ නාගරික ජනගහනයෙන් 32% ක් පමණි. වර්තමානය වන විට හක්මන නගරයෙහි 68% ක් නේවාසික ජනතාව ළිං ජලය පරිහරණය කරනු ලබයි. මෙම සංවර්ධන සැලැස්ම තුලින් 2030 වන විට අපේක්ෂිත ජනගහනය සහ ජල අවශ්‍යතාවය ප්‍රමාණය පහත දක්වා ඇත.

**වගු අංක 12 : ජල අවශ්‍යතාව පුරෝකථනය : හක්මන නාගරික සංවර්ධන ප්‍රදේශය - 2030**

| වර්ෂය | ජනගහනය | ජල අවශ්‍යතාවය (ඝන මීටර්) |
|---|---|---|
| 2011 | 3093 | 2273.1 |
| 2015 | 3113 | 2276.7 |
| 2020 | 3144 | 2282.3 |
| 2025 | 3180 | 2288.4 |
| 2030 | 3220 | 2296.0 |

මූලාශ්‍රය : ජාතික ජල සම්පාදන මණ්ඩලය, හක්මන - 2017

ඉහත වගුව පහත උපකල්පන මත ගොඩනගා ඇත.

ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයෙහි සම්මත අගයන්ට අනුව නේවාසික ජනගහනය සඳහා දෛනික ඒක පුද්ගල ජල අවශ්‍යතාවය ලීටර් 180ක් වේ.

**වගු අංක 13 : දෛනික සංසරණ ජනගහනය සඳහා ජල අවශ්‍යතාවය : හක්මන නාගරික සංවර්ධන ප්‍රදේශය - 2030**

| වර්ෂය | දෛනික සංසරණ ජනගහනය | ජල අවශ්‍යතාවය (ඝන මීටර්) |
|---|---|---|
| 2011 | 7500 | 240 |
| 2015 | 9500 | 264 |
| 2020 | 11500 | 288 |
| 2025 | 13500 | 332 |
| 2030 | 15500 | 356 |

මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය, මාතර දිස්ත්‍රික් කාර්යාලය (2017)

ඉහත වගුව පහත උපකල්පන මත ගොඩනගා ඇත.

**උපකල්පන :**

1. වර්තමානය වන විට නගරය තුල සිදුවී ඇති අපරව්‍යුහ පහසුකම් හා සංවර්ධන සැලැස්මෙන් අපේක්ෂිත සංවර්ධනයක් කරා ලඟා වීමේදී දෛනික සංසරණ ජනගහනය 2030 වර්ෂය වන විට දෙගුණ වන බව

2. ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයෙහි සම්මත අගයන්ට අනුව දෛනික සංසරණ ජනගහනය සඳහා දෛනික ඒක පුද්ගල ජල අවශ්‍යතාවය ලීටර් 12 ක් වේ.

**වගු අංක 14 : දෛනික ජල අවශ්‍යතාවය : හක්මන නාගරික සංවර්ධන ප්‍රදේශය**

| වර්ෂය | දෛනික නේවාසික ජල අවශ්‍යතාවය (ඝණ මීටර්) | දෛනික සංසරණ ජනගහනය සඳහා ජල අවශ්‍යතාවය (ඝණ මීටර්) | එකතුව (ඝණ මීටර්) |
|---|---|---|---|
| 2011 | 2273.1 | 240 | 2513.1 |
| 2015 | 2276.7 | 264 | 2540.7 |
| 2020 | 2282.3 | 288 | 2570.3 |
| 2025 | 2288.4 | 332 | 2620.4 |
| 2030 | 2296.0 | 356 | 2652.0 |


**මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය, මාතර දිස්ත්‍රික් කාර්යාලය - 2017**

2030 වර්ෂය වන විට නගරයෙහි අපේක්ෂිත නේවාසික ජනගහනය 3220 ක් වන අතර, දෛනික සංසරණ ජනගහනය 15500 ක් වේ. 2016 වර්ෂයෙහි කරන ලද ක්ෂේත්‍ර සමීක්ෂණයට අනුව නගරයෙහි නල ජලය පරිභරණය කරනු ලබන්නේ ජනගහනයෙන් 32% කි. ඒ අනුව, 2030 වර්ෂය වන විට අපේක්ෂිත සංවර්ධනයත් සමඟ නල ජල අවශ්‍යතාවය මුළු ජනගහනයෙන් 50%ක් යැයි උපකල්පනය කළ විට ඒ සඳහා දෛනික ජල අවශ්‍යතාවය ඝන මීටර් 1148කි. 2030 වන විට අපේක්ෂිත දෛනික සංසරණ ජනගහනය සඳහා අවශ්‍ය ජල ප්‍රමාණය ඝන මීටර් 356කි. ඒ අනුව, අවශ්‍ය දෛනික ජල ධාරිතාවය ඝන මීටර් 1504 කි. වර්තමානය වන විටද එම ජල ප්‍රමාණය සැපයීමේ හැකියාව (ජල සම්පාදන මණ්ඩලය/ ප්‍රාදේශීය සභාව) පවතී.

### 6.3.4 යෝජිත විදුලි සැපයුම

හක්මන නාගරික සංවර්ධන බල ප්‍රදේශය මුළුමනින්ම ආවරණය වන පරිදි විදුලි බල අවශ්‍යතාවය ලංකා විදුලි බල මණ්ඩලය විසින් සම්පූර්ණ කර ඇත. තවද, යෝජිත නේවාසික නගරයක අවශ්‍යතා වලට සරිලන පරිදි අනාගත විදුලි අවශ්‍යතාවයද සම්පූර්ණ කළ හැකි මට්ටමක පවතී. එම විදුලි ව්‍යාප්තිය සිතියම් අංක 14 මඟින් දක්වා ඇත.

**සිතියම් අංක 14 : විදුලි සැපයුම : හක්මන නාගරික සංවර්ධන ප්‍රදේශය**




**යොමුව**

- ▲ විදුලිබල උප පොළ
- විදුලි රැහැන්
- පවතින මාර්ග
- හක්මන නගර සභා සීමාව

N W E S

1:11,000

**සිතියම් අංක : 14**

**විදුලි සැපයුම : හක්මන නාගරික සංවර්ධන ප්‍රදේශය -2017**

හක්මන නාගරික සංවර්ධන සැලැස්ම (2019 - 2030)

නාගරික සංවර්ධන අධිකාරිය

| | |
|---|---|
| සකස් කළ දිනය | : 2018 දෙසැම්බර් 10 |
| යාවත්කාලීන කලේ | : 2019 |
| මූලාශ්‍රය | : නා.සං.අ. මාතර කාර්යාලය |
| සකස් කලේ | : ජේ.ඕ.බී. ජීවන්දර |

නාගරික සංවර්ධන අධිකාරිය

### 6.3.5 මලාපවහනය හා ජලාපවහනය

හක්මන නාගරික බල ප්‍රදේශයෙහි භෞතික පිහිටීම අනුව නගර මධ්‍යයේ අතක ඇඟිලි මෙන් දිස්වන කුඹුරු බිම් පද්ධතියක් පිහිටා ඇත. එහි දෙපස නේවාසික හා වාණිජ සංවර්ධනයන් ස්ථානගත වී ඇත. එබැවින් වැසි ජලය ගලායාම පිළිබඳ ගැටළු ඇති නොවේ. තවද, බෙලිඅත්ත මාර්ගය, වලස්මුල්ල මාර්ගය, මාතර මාර්ගය ආදී මාර්ග මේ වන විටත් අවශ්‍ය ස්ථානවල කාණු පද්ධතිය සහිතව සංවර්ධනය කර ඇත. යෝජිත සැලැස්මට අනුව මාර්ග සංවර්ධනයේදී පදික වේදිකා සහ කාණු පද්ධතියද සහිතව ඉදිකිරිමට සැලසුම් කර ඇත.

යෝජිත කලාප සැලැස්මේ බිම් කැබලි වල ප්‍රමාණය පර්චස් 10.0 පමණ වන බැවින් ගෙවත්ත තුලම පූතික වළක් සකස් කර ගැනීම මඟින් මලාපවහන පහසුකම් සපයා ගැනීමට යෝජිතය.

### 6.3.6 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

ගෘහස්ත කටයුතු, වෙළඳ හා වාණිජ කටයුතු කාර්මික හා කෘෂි කාර්මික කටයුතු වලදී මෙන්ම අනෙකුත් පොදු කටයුතු වලදී ද ජනනය වන අපද්‍රව්‍ය ඝන අපද්‍රව්‍ය ලෙස සලකනු ලැබේ. ආහාරමය අපද්‍රව්‍ය, ඇසුරුම් වශයෙන් ඉවත් කරන කඩදාසි, ලෝහ, ප්ලාස්ටික්, වීදුරු ආදිය, ඉවතලන රෙදි, ගෙවත්තේ එකතුවන කැලි කසල ඉදිකිරීම් වලදී ඇතිවන ඝන අපද්‍රව්‍ය, කාර්මාන්ත ශාලාවලින් ඉවතලන දෑ යනාදී විවිධ කොටස්වලින් යුත් අපද්‍රව්‍යවලින් ඝන අපද්‍රව්‍ය සංයුක්ත වී ඇත.

හක්මන ප්‍රාදේශීය සභාව විසින් සපයන ලද දත්තයන්ට අනුව දෛනිකව ජනනය වන ඝන අපද්‍රව්‍ය ප්‍රමාණය දළ වශයෙන් 2000kg පමණ වේ. ඒවායින් 1600kg පමණ දිරණ අපද්‍රව්‍ය වන අතර 400kg නොදිරන ඒවා වෙයි. මෙම අපද්‍රව්‍ය නේවාසිකව 1000kg ක් පමණද , වෙළඳසැල් වලින් 800kg ක් පමණද , හෝටල් මගින් 150kg ක් පමණද , බැංකු, රජයේ ගොඩනැගිලි සහ වෙනත් ස්ථාන වලින් 50kg ක් වශයෙන් දෛනිකව ජනනය වේ. හක්මන නාගරික ප්‍රදේශයේ (වෙන්කරන ලද කසළ සහ මිශ්‍ර) කසල එකතු කිරීම ප්‍රාදේශිය සභාව මගින් සතියකට දෙවරක් සිදු කරනු ලබයි. ඊට අමතරව සතියේ බදාදා දිනයේදී ප්ලාස්ටික් සහ පොලිතින් පමණක් එකතු කිරීමේ ට්‍රැක්ටරයක්ද ක්‍රියාත්මක වේ.

ප්‍රදේශයේ එක්රැස් වන කසළ එක්රැස් කිරිමේ ක්‍රියාවලිය සඳහා ප්‍රාදේශීය සභාව සතුව ට්‍රැක්ටර් 03 ක්, කම්පැක්ටරයක්, අත්කරත්ත 05 ක් යොදා සිදු කරනු ලබයි. මෙම කාර්යය සඳහා පුහුණු සේවකයන් අට දෙනෙකු සහ නුපුහුණු සේවකයෙකු යොදවා ඇති අතර රියදුරන් දෙදෙනෙකු සහ කම්කරුවන් 05 ක් ද, වැඩ පරිපාලකවරයෙකුගේද සහයෝගය ලබාගනී.

ප්‍රාදේශීය සභා සීමාව තුළ අතුරු මාර්ගවල ජෛව හායනය වන අපද්‍රව්‍ය එකතු නොකරන අතර සෑම නිවසකටම කොම්පෝස්ට් බඳුන් ලබාදී තිබේ. ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සැලැස්ම සිතියම් අංක 15 මඟින් දක්වා ඇත.

හක්මන නගරයේ දෛනිකව ජනනය වන ඝන අපද්‍රව්‍ය සංයුතිය පහත පරිදි වේ.

**වගු අංක 15 : දෛනිකව ජනනය වන ඝන අපද්‍රව්‍ය : හක්මන නාගරික සංවර්ධන ප්‍රදේශය**

| අනු අංකය | ඝණ අපද්‍රව්‍ය | ප්‍රතිශතය |
|---|---|---|
| 1. | එළවළු | 63% |
| 2. | කඩදාසි | 20% |
| 3. | වීදුරු | 04% |
| 4. | ලෝහ | 03% |
| 5. | සායනික අපද්‍රව්‍ය | 01% |
| 6. | කාර්මික අපද්‍රව්‍ය | 04% |
| 7. | වෙනත් | 05% |

මූලාශ්‍රය : ප්‍රාදේශීය සභාව - හක්මන, 2017

මෙසේ එකතු කරනු ලබන දිරාපත්වන සහ දිරාපත් නොවන කසළ හක්මන ප්‍රාදේශීය සභාව සතු කෝංගල පිහිටි අක්කර දෙකක භූමිය තුළ විවෘත බිම් පිරවුමක් තාවකාලිකව සිදු කරනු ලැබේ. මෙම භූමිය තුළ ස්ථාපිත කරමින් පවතින කසළ අංගනය ඉදිවූ විට එම බිම් පිරවීම වෙනුවට එකතුවන කසළ වෙන් කිරීම සහ කොම්පොස්ට් නිෂ්පාදනය කිරීම හක්මන ප්‍රාදේශීය සභාවේ අනාගත අපේක්ෂාව වේ. නමුත් තවමත් නිසි කළමනාකරණයක් සහිතව කසළ බැහැර කිරීමට හෝ කසළ අවසන් බැහැර කිරීමේ පහසුකම් නොමැති වීම ගැටලුවක්ව පවතී.

මෙයට අමතරව වෙන් කරන ලද නොදිරන කසළ හක්මන පොදු වෙළඳ පොළේ භූමි භාගයක එකතු කරනු ලැබේ. මෙම එකතු කරන නොදිරන කසළ විකිණීම හෝ ප්‍රතිචක්‍රීයකරණය කිරීමට හෝ තවමත් නිසි ක්‍රමවේදයක් අනුගමනය නොකරන අතර අවසානයේ මෙම කසළද කලින් සඳහන් කරනු ලැබූ කෝංගල බිම් පිරවුම වෙත යොමු වීමේ හැකියාවක් පවතී. මෙය වර්තමානයේ පවතින ගැටලුවක්ව පවතී.

**ඝන අපද්‍රව්‍ය කළමනාකරණ උපක්‍රම**

01. විධිමත් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම
    කෝංගල ප්‍රදේශයෙහි ප්‍රාදේශීය සභාව විසින් පවරා ගෙන ඇති අක්කර 02ක් වන ඉඩමෙහි කොම්පෝස්ට් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට හඳුනාගෙන ඇත.
02. නගරය තුල අවිධිමත් ලෙස ඝන අපද්‍රව්‍ය බැහැරලීම තුලින් සිදුවන පාරිසරික බලපෑම අවම කිරීමේ උපක්‍රමයක් ලෙස කසල බඳුන් ස්ථාපිත කිරීමට හඳුනාගෙන ඇති අතර, එම ස්ථාන සිතියම් අංක 15 මඟින් දක්වා ඇත.

සිතියම් අංක 15 : යෝජිත ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ සැලැස්ම




**යොමුව**

- ස්ථාපිත කසළ බඳුන්
- යෝජිත ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය
- ප්‍රධාන මාර්ග
- ඇවිදින මංතීරු
- පදික මංතීරු
- හරිත මංතීරු
- ඇළ

N W E S

1:11,000

**සිතියම් අංක : 15**

**යෝජිත ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ සැලැස්ම: හක්මන නාගරික සංවර්ධන ප්‍රදේශය - 2030**

හක්මන නාගරික සංවර්ධන සැලැස්ම (2019 - 2030)

නාගරික සංවර්ධන අධිකාරිය

| | |
|---|---|
| සකස් කළ දිනය | : 2018 දෙසැම්බර් 10 |
| යාවත්කාලීන කලේ | : 2019 |
| මූලාශ්‍රය | : නා.සං.අ. මාතර කාර්යාලය |
| සකස් කළේ | : ජේ.ඕ.බී. ජීවන්දර |

නාගරික සංවර්ධන අධිකාරිය

## 6.4 යෝජිත ආර්ථික සංවර්ධන උපක්‍රම

### 6.4.1 ආර්ථික සැලැස්ම


නගරය ආර්ථික වශයෙන් සංවර්ධනය කිරිම සංවර්ධන සැලැස්මේ ප්‍රධාන අවශ්‍යතාවයකි. නගරයේ පවතින ප්‍රධාන දුබලතාවයන් අතර ගොඩනැගිලි වල ඌණ භාවිතය, ප්‍රාදේශීය සභාව සතු ආයෝජන ශක්තිය අඩුවීම, ආදායම් ව්‍යාප්ති විෂමතාවය වැඩිවීම යන කරුණු ශක්තීන්, දුර්වලතා, අවස්තා හා තර්ජන විශ්ලේෂණය මගින් හඳුනාගෙන ඇත. තවද, සංවර්ධන සැලැස්මේ පළමු අරමුණ වන්නේ දැනට පවතින ගොඩනැගිලිවල 50% ක් වන ඌණ භාවිතය 2030 වන විට 10% දක්වා අඩු කිරිම අපේක්ෂා කෙරේ. එමෙන්ම දෙවන අරමුණ යටතේ 2025 වන විට සාම්ප්‍රදායික කෘෂිකර්මාන්තය ප්‍රවර්ධනය කිරිමේ උපක්‍රමයක් ලෙස කෘෂිකර්මය පදනම් කරගත් සංචාරක කර්මාන්තය හඳුන්වාදීම තුළින් වාර්ෂිකව සංචාරකයින් 3500 ආකර්ශනය කර ගැනීමට අපේක්ෂා කෙරේ.

2011 වර්ෂයේ ජන හා සංඛ්‍යා ලේඛණ දත්ත අනුව හක්මන නගරයේ වැඩ කළ හැකි වයසේ ජන සංඛ්‍යාව 59.6% වන අතර, ඉන් 24.6% ප්‍රමාණයක් ළමා යැපෙන්නන් වේ. 15.8% ප්‍රමාණයක් වැඩිහිටි ජන සංඛ්‍යාව වේ. මෙලෙස ශ්‍රම බලකාය ඉහළ අගයක් ගැනීම නගරයට ප්‍රබලතාවයක වේ. කෙසේ නමුදු මාසික ආදායම රු. 12,000ට අඩු ආදායම් ලබන අයගේ ප්‍රතිශතය 56% ක් වැනි ඉහල අගයක් ගැනීම ආර්ථික වශයෙන් සුබදායක නොවේ. එබැවින් වැඩිහිටි ජනගහනයට ආදායම් ලබාදීමේ උත්පාදන අවස්ථා ලබාදීම සහ ශ්‍රම බලකාය ප්‍රශස්ථ ලෙස ආර්ථිකයට දායක කර ගැනීම අරඹයා ආර්ථික සංවර්ධන උපක්‍රමයක් ලෙස කෘෂිපාදක සංචාරක කර්මාන්තය හඳුනාගෙන ඇත. ඒ සඳහා දැනට බුද්ධ ජයන්ති විද්‍යාලය ප්‍රතිස්ථාන ගත කරන ස්ථානය අවට ප්‍රදේශය සහ සතිපොළ පවතින භූමිය ඉදිරිපිට පවතින කුඹුරු යාය හඳුනාගෙන ඇත.

නාගරික ආර්ථිකයේ ප්‍රධාන අංශය (Base Sector) වන්නේ කෘෂිකර්මාන්තයයි. (Non base Sector) 2012 වර්ෂයේ සංඛ්‍යා ලේඛණ දත්ත අනුව හක්මන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පොල් නිෂ්පාදනය මාතර දිස්ත්‍රික්කයේ මුළු නිෂ්පාදිතයෙන් 9.32% කි. එය දිස්ත්‍රික්කයේ දෙවන ස්ථානය හිමිකර ගන්නා අතර, කෘෂි අංශයේ ඊළඟට වැදගත් ස්ථානයක් හිමිකර ගන්නේ වී නිෂ්පාදනයයි. 2017 වර්ෂයේ මාතර දිස්ත්‍රික්කයේ සමස්ථ වී නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 56529 වන අතර, ඉන් මෙට්‍රික් ටොන් 4486 හෙවත් 7.9 % නිෂ්පාදනය කර ඇත්තේ හක්මන ගොවිජන සංවර්ධන බල ප්‍රදේශයයි. ඒ අනුව මෙම නිෂ්පාදන වලට වෙළඳපොලක් ලබාදීමේ උපක්‍රමයක් ලෙස යෝජිත පොදු වෙළඳපොල ආසන්නව කෘෂි නිෂ්පාදන ඉලක්ක කරගත් තොග වෙළඳපලක් සඳහා ඉඩකඩ වෙන් කිරීමට හඳුනාගෙන ඇත.

ඉහත කරුණු සැලකිල්ලට ගෙන හක්මන නගරය ආර්ථික වශයෙන් සංවර්ධනය කිරිම සඳහා පහත සඳහන් ආර්ථික සංවර්ධන උපක්‍රම කිහිපයක් හඳුනාගෙන ඇත. මෙම ආර්ථික සංවර්ධන උපක්‍රම වල මූලික පරමාර්ථය වන්නේ විධිමත් භූ දර්ශනයක් ඇතිකිරීම මඟින් සංසරණ ජනයාගේ ආකර්ශනයක් ලබාගැනීම සහ නව ආර්ථික උපක්‍රම මඟින් නාගරික ජනතාවගේ ආර්ථික ශක්තිය ඉහළ මට්ටමකට ළඟා කර ගැනීමයි. එම අරමුණු ළඟා කර ගැනීම සඳහා පහත සඳහන් උපක්‍රම හඳුනාගෙන ඇත.

**සිතියම් අංක 16 : යෝජිත සංවර්ධන ව්‍යාපෘති : හක්මන නාගරික සංවර්ධන ප්‍රදේශය (2030)**



**නාගරික ආර්ථික පුනර්ජීවන උපක්‍රම**


නගරයේ ආර්ථික සංවර්ධනය සඳහා වැදගත්වන සාධකයක් ලෙස නාගරික ජනයාගේ ක්‍රය ශක්තිය මට්ටම ඉහල නැංවීම දැක්විය හැකිය. එය වර්ධනය කිරීම සංවර්ධන සැලැස්මේ ප්‍රධාන බලාපොරොත්තුවකි. තවද, නගරයේ දෛනික සංසරණ ජන සංඛ්‍යාව වැඩි කිරීම තුලින්ද නාගරික ආර්ථික මට්ටම වර්ධනය කල හැකිය. ඒ සඳහා සැලැස්ම තුලින් ආර්ථික සංවර්ධන උපක්‍රම කීපයක් හඳුනාගෙන ඇත.

- කෘෂි සංචාරක මධ්‍යස්ථාන සහ රටා වී වගාව
- නාගරික වනාන්තර ඇති කිරිම.

හක්මන නගරයේ ප්‍රධාන ශක්තිය වන්නේ 36% ක් වන වී වගාවයි. එය නාගරික ආර්ථිකයේ ප්‍රධාන ශක්තිය වී ඇති නමුත්, කෘෂි ආර්ථිකය ලාබදායී නොවීම හා දෙවන පරම්පරාව කෘෂි කටයුතු වලින් ඉවත්වීමේ ලක්ෂණ කෘෂි ආර්ථිකය තුල පෙන්වයි. මෙයට විකල්පයක් ලෙස නාගරික ආර්ථිකය ශක්තිමත් කිරීම රැකියා අවස්ථා බිහි කිරීම හා නාගරික භූ දර්ශනය ඇති කිරීම සඳහා වර්ණවත් රටා සහිත වී වගා ප්‍රදේශ දෙකක් ඇති කිරීමට හඳුනාගෙන ඇත. එම ප්‍රදේශවල රටා වී වගාවට (Design Paddy) අමතරව කෘෂි පාරිසරික සංචාරක කර්මාන්තය ප්‍රචලිත කිරීමටද බලාපොරොත්තු වේ. විශේෂයෙන්ම පාසල් ළමයින් කේන්ද්‍ර කොටගෙන කමත් භාෂාව පිළිබඳ දැනුවත් කිරීම සහ ඒ තුලින් සංචාරක කර්මාන්තයේ ප්‍රවර්ධනයක් ඇති කිරීම මෙමගින් බලාපොරොත්තු වේ. ඒ අනුව, කෘෂි පාදක සංචාරක කර්මාන්තය නගා සිටුවීමේ ස්ථාන දෙකක් හඳුනාගෙන ඇත. එනම්, නව බුද්ධ ජයන්ති විද්‍යාලය ප්‍රතිස්ථානගත කිරීමට යෝජිත භූමිය ආශ්‍රිත කොටස සහ හක්මන - වලස්මුල්ල මාර්ගයේ සතිපොල ඉදිරිපිට කුඹුරු ඉඩම ආශ්‍රිත කොටස සංචාරක ආකර්ශනයක් සහිත ප්‍රදේශයක් ලෙස සංවර්ධනය කිරිම.

හක්මන - වලස්මුල්ල මාර්ගයේ සතිපොළ ඉදිරිපිට භූමිය වර්ණවත් රටා සහිතව වී වගා කිරිමේදී ප්‍රධාන වශයෙන් බලාපොරොත්තු වන්නේ අලංකාරවත් භූ දර්ශනයක් නිර්මාණය කිරිමයි. එමඟින් නගරයට පැමිණෙන සංචාරකයින් සංඛ්‍යාව වැඩිකිරිම ප්‍රධාන ආර්ථික සංවර්ධන උපක්‍රමයක් ලෙස හඳුනාගෙන ඇත.

**රූප සටහන් අංක 16 : සතිපොල ඉදිරිපිට භූමිය සංචාරක ආකර්ශනය සහිතව සංවර්ධනය කිරිම.**





තවද, හක්මන නගරයේ ප්‍රධාන ආර්ථික මධ්‍යස්ථාන ලෙස හක්මන පොදු වෙළඳපොල හා සතිපොල දැක්විය හැකිය. මෙම සතිපොල සෑම සෙනසුරාදා දිනකම දවස පුරා පැවැත්වෙන අතර, මහජන පොල සතියේ සෑම දිනකම පැවැත්වේ. එහි වෙළඳසැල් 125 ක් පමණ ඇත. මුලදී සතිපොල සහ මහජන පොල එකම ස්ථානයේ පවත්වා ඇත. නමුත් වර්තමානයේදී සතිපොල වෙනත් ස්ථානයක ස්ථාපිත කර ඇති අතර, වෙළඳුන් 300 – 350 පමණ පිරිසක් වෙළඳාම් කටයුතුවල නිරත වී සිටිති. සතිපොල පැවැත්වෙන දිනවල මහජන පොළේ වෙළඳුන් ද සති පොළට පැමිණීම හේතුවෙන් මහජන පොළ සහ ඒ අවට ප්‍රදේශය ඌණ උපයෝජනයේ යෙදීම වැළැක්වීමේ උපක්‍රමයක් ලෙස සතිපොළ, මහජන පොළ සහ තොග වෙළඳපොළ එකම ස්ථානයක ස්ථාපිත කිරිමට හඳුනාගෙන ඇත.

හක්මන නගරය පිහිටා ඇත්තේ මාතර ඇඹිලිපිටිය ප්‍රධාන මාර්ගයේය. ඒ අනුව, ඇඹිලිපිටිය මිද්දෙනිය වැනි ප්‍රදේශවල කෘෂි නිෂ්පාදන බොහොමයක් නගරය හරහා ප්‍රවාහනය කරයි. තවද, දිස්ත්‍රික්කයේ පිහිටි වැදගත් පූජනීය ස්ථාන වන වැවුරුකන්නල, දෙවුන්දර, වෙහෙරහේන මෙන්ම කතරගම, උඩවලව ආදී ප්‍රදේශවලට සංචාරය කරන සංචාරකයින් හා පාසල් ළමයින් කේන්ද්‍ර කරගෙන මුරුතමුරය ප්‍රදේශයේ අක්කර 2½ ක පමණ අත් හරින ලද කුඹුරු ඉඩමක් නාගරික වනෝද්‍යානයක් ලෙස සංවර්ධනය කිරිමට හඳුනාගෙන ඇත.

තවද, නගරයේ දැනට පවතින අවිධිමත් භූමි පරිහරණය විධිමත් කිරීම සහ සැලසුම් සහගත නිර්මිත පරිසරයක් ඇති කිරීම තුළින් ආර්ථික පුනර්ජීවනයක් ඇතිකිරිමේ උපක්‍රමයක් ලෙස ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වැඩි ඉඩකඩක් සහිත බෙරුවේවෙල, කොටුගොඩැල්ල ඉඩමට ප්‍රතිස්ථානගත කිරිම, තැපැල් කාර්යාලය ප්‍රතිසංවර්ධනය කිරිම, පැරණි ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ල තානායමක් ලෙස සංවර්ධනය කිරිම සහ බස් ඩිපෝ උප කාර්යාලය ප්‍රාදේශිය සභාව පවතින ඉඩමට ආසන්නව පිහිටි ඉඩමෙහි ප්‍රතිස්ථානගත කිරීමට හඳුනාගෙන ඇත.

## 6.5 පාරිසරික තිරසර උපාය මාර්ග

### 6.5.1 සංරක්ෂණ ප්‍රදේශ

#### 1. තෙත්බිම්

හක්මන නාගරික බල ප්‍රදේශයෙහි තෙත්බිම් පහත ආකාරයට වර්ගීකරණය කර දැක්විය හැකිය.

i. මිරිදිය ජල මාර්ග
ii. අත්හරින ලද කුඹුරු බිම් (පුරන් වූ කුඹුරු) /දෙනිය/ඕවිට
iii. කුඹුරු බිම්

මේ අනුව හක්මන නාගරික බල ප්‍රදේශයෙහි තෙත්බිම් කලාපීකරණ ඉලක්කය වනුයේ, තිරසාර සමාජයීය, ආර්ථික සහ පාරිසරික භාවිතයන් සඳහා තෙත් බිම් යොදා ගැනීමත්, ඒවායේ විභවයන් සලකා බලා ජලය රඳවා ගැනීමේ හැකියාව සහ අනෙකුත් පාරිසරික ප්‍රතිලාභ සැලකීමට ගැනීමත් එමඟින් අනවසර අත්පත් කර ගැනීම් සහ නුසුදුසු භාවිතයන් වැලැක්වීමත් ය.


ඉහත කරුණු සැලකිල්ලට ගෙන කුඹුරු වගා බිම්, පුරන්වූ කුඹුරු බිම් සහ ඊට සම්බන්ධ දෙනිය/ඕවිට එලෙසම පවත්වාගත යුතු ප්‍රදේශ ජල රැඳවුම් අවශ්‍යතාවයද සලකා බලා "විශේෂ කුඹුරු වගා කලාපය" ලෙස නම් කර ඇත. මෙම විස්තරය සිතියම් අංක 17 මඟින් දක්වා ඇති අතර කලාපය සඳහා වූ මාර්ගෝපදේශ ඇමුණුම අංක 03 යටතේ දක්වා තිබේ. එහිදී විශේෂ කුඹුරු වගා කලාපයේ අනුමත භාවිතයන් පහත පරිදි වේ.

i. කුඹුරු වගා කිරීම.
ii. ගොවිජන සංවර්ධන පනතට සහ චක්‍රලේඛ අංක 19/2018 ට අනුකූල වන අනුමත භාවිතයන් පමණක් සිදු කල හැකිය.

#### 2. දර්ශනීය ස්ථාන (Scenic view points)

දර්ශනිය ස්ථාන බොහොමයක් හක්මන නාගරික බල ප්‍රදේශය තුළ පවතින කුඹුරු ආශ්‍රිත පරිසරයේ පිහිටා ඇත. සංවර්ධන කටයුතු සිදු කිරීමේදී මෙම දර්ශනීය ස්ථාන සුරකෙන අයුරින් සිදුකිරීම තුලින් මෙම සුන්දර පරිසරය ආරක්ෂා කරගත යුතුය.

සිතියම් අංක 17 : යෝජිත තෙත්බිම් කලාපීකරණ සැලැස්ම : හක්මන නාගරික සංවර්ධන ප්‍රදේශය (2030)




යොමුව

| | |
|---|---|
| | හක්මන ග්‍රාම නිලධාරී වසම් මායිම |
| | විශේෂ කුඹුරු වගා කලාපය |
| | ජල පද්ධති |

1:11,500

සිතියම් අංක : 17

**යෝජිත තෙත් බිම් කලාප සැලැස්ම : හක්මන නාගරික සංවර්ධන ප්‍රදේශය - 2030**

හක්මන නාගරික සංවර්ධන සැලැස්ම (2019 - 2030)

නාගරික සංවර්ධන අධිකාරිය

යාවත්කාලීන කලේ : 2018
මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත
සකස් කළේ : ගයාන් සමරකෝන්

පරිසර හා භූ දර්ශන අංශය

**සංරක්ෂණ උපාය මාර්ග**

- යෝජිත කලාපීකරණ සැලැස්ම තුලින් හරිත සංරක්ෂණ කලාපයක් වෙන් කිරිම.
- කලාපය තුල ඇතුලත් කුඹුරු, තෙත් බිම්, වැව් හා ඇළ මාර්ග එම තත්ත්වයෙන්ම පවත්වාගෙන යාම හා කිසිදු ආකාරයක සංවර්ධනයට ඉඩ නොදීම.
- සංවර්ධන සැලැස්මෙහි දැක්ම ලෙස කෘෂි වටපිටාවෙන් යුත් හරිත පද්ධතිය ආරක්ෂා කරමින් නීල හරිත පරිසරයක් ගොඩනැගීමේ සංකල්පය අන්තර්ගත වීම.
- කෘෂිකර්මය හා තෙත් බිම් ආශ්‍රිත ජෛව විවිධත්වය උපයෝගී කරගෙන සංචාරක කර්මාන්තය දියුණු කිරිම.
- වැව්, ජලාශ හා ඇළ මාර්ග සඳහා රක්ෂිත සීමාවන් වෙන් කිරිම.

### 6.5.2. භූදර්ශන කළමනාකරණ උපක්‍රම

හක්මන ප්‍රදේශයේ දර්ශනිය ස්ථාන ලෙස කුඹුරු, ජලවහන පද්ධතිය සහ උස් බිම් පද්ධතිය දැක්විය හැකිය. සංවර්ධන කටයුතු වලදී එම ප්‍රදේශවල ඉදිකිරිම් සිදුනොකරන අතර, එහි දර්ශනයට බාධා නොවන අයුරින් සංවර්ධන කටයුතු සිදුකිරිමට කලාපීකරණ සැලැස්ම මඟින් උපාය මාර්ග හඳුනාගෙන ඇත. විශේෂයෙන් සංවර්ධන සැලැස්මක හරිත සංරක්ෂණ කලාපය එම අයුරින්ම පවත්වා ගැනීමට සැලසුම් කර ඇති අතර, එම කලාපයේ දෘෂ්ඨිපථයට බාධාවන ස්ථානවල ඉදිකිරිම් අවම කිරිමටද කලාපීය රෙගුලාසි මඟින් හඳුනාගෙන ඇත.

### 6.5.3. හක්මන නාගරික ප්‍රදේශයේ යෝජිත ආපදා අවම කිරීමේ සැලැස්ම

හක්මන නාගරික ප්‍රදේශය ආපදා අවදානම් කලාපයෙන් පිටත පිහිටා ඇති බව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මඟින් සකස් කර ඇති සිතියම් අංක 06 අනුව පැහැදිලි වේ. එසේම වෙරළබඩ කලාපයෙන් අභ්‍යන්තරව පිහිටීම නිසා සුනාමි, මුහුදු මට්ටම ඉහළ යාම වැනි සාගර බලපෑම් තොර නගරයක් වන අතර, ප්‍රදේශය පුරා ඇති කුඹුරු, වැව්, ජලාශ හා තෙත් බිම් නිසා වැසි ජලය බැසයාමේ ගැටළුව මෙන්ම ගංවතුර ආපදා බලපෑම අවම වී ඇත.

කෙසේ නමුදු ගෝලීය වශයෙන් ඇතිවන කාලගුණික හා දේශගුණික වෙනස්වීම් සඳහා මුහුණදීමට සරිලන පරිදි භූගත ජල මට්ටම ආරක්ෂා කිරිමේ උපක්‍රම ලෙස කලාපීකරණ සැලැස්ම මඟින් එළිමහන් ප්‍රදේශ ආරක්ෂා කිරිමට හඳුනාගෙන ඇත.

### 6.5.4 හක්මන නාගරික ප්‍රදේශය සඳහා වන යෝජිත පොදු එළිමහන් විනෝද කටයුතු පිළිබද සැලැස්ම

සෑම පුද්ගලයෙකුගේම කායික මානසික වර්ධනයේ ගුණාත්මකභාවය නගා සිටුවීම සඳහා පොදු එළිමහන් විනෝද කටයුතු බෙහෙවින් වැදගත් වේ. එම නිසා නාගරික සංවර්ධන අධිකාරියේ සංවර්ධන සැලසුම් සැකසීමේදී පොදු එළිමහන් විනෝද කටයුතු පිළිබද අවකාශිය සැලැස්ම, සංවර්ධන සැලසුම් වලට අන්තර්ග්‍රහනය කරනු ලැබේ.

**හක්මන නාගරික බල ප්‍රදේශයේ වර්තමානයේ පවතින පොදු එළිමහන් විවෘත භූමි**

සෘජු සහ වක්‍ර විනෝද පහසුකම් ලෙස ප්‍රධාන සංඝටක දෙකක් යටතේ විනෝද පහසුකම් සලකා බලනු ලැබේ. සෘජු විනෝද කටයුතු පහසුකම් යටතේ ජනතාවට ක්‍රියාකාරී ලෙස සහභාගී විය හැකි ඉඩකඩ ප්‍රමාණයක් සලකා බලන අතර ඒ යටතේ,

i. ක්‍රීඩා කිරීම
ii. පිහිනීම
iii. දිවීම
iv. ඇවිදීම
v. බෝට්ටු පැදීම
vi. සාම්ප්‍රදායික මසුන් ඇල්ලීම නිදසුන් ලෙස දැක්විය හැක.

හක්මන නාගරික බල ප්‍රදේශයේ ඉහත අවශ්‍යතාවයන් අතරින් කිහිපයක් සපුරාගත හැකි අතර එම ස්ථාන පිළිබඳව විස්තර වගු අංක 16 යටතේ සඳහන් කර ඇත.

**වගු අංක 16 :සෘජු විනෝද පහසුකම් සපුරාගත හැකි ස්ථාන - හක්මන නාගරික ප්‍රදේශය**

| අනු අංකය | උද්‍යාන වර්ගය | විවෘත භූමියේ නම | ප්‍රමාණය හෙක්ටයාර් |
|---|---|---|---|
| 01 | පවතින අසල උද්‍යාන (ELP01) | ඩැනී අබේවික්‍රම ක්‍රීඩාංගනය | 1.10 |
| 02 | පවතින ඉතා කුඩා උද්‍යාන (EPP01) | ළමා උද්‍යානය (නව වෙළඳපොළ අසල) | 0.17 |
| | **එකතුව :** හෙක්ටයාර් **- 1.27** | | |

වක්‍ර විනෝද පහසුකම් සලසාගත හැකි ස්ථාන පහත පරිදි වේ.

1. පුස්තකාල සංඛ්‍යාව - 1
2. රැස්වීම් ශාලා - 1 (ප්‍රාදේශීය සභා නගර ශාලාව)

**යෝජිත පොදු එළිමහන් විවෘතභූමි සැලැස්ම - 2030**

නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම්වලට අනුව ජනගහනය 1000 කට හෙක්ටයාර් 1.4ක් අවම වශයෙන් පොදු එළිමහන් විවෘත භූමි ලෙස සංවර්ධන සැලැස්ම සැකසීමේදී වෙන්කළ යුතුය. හක්මණ නාගරික බල ප්‍රදේශයේ 2015 වසර වන විට ජනගහනය 3113 වන අතර 2017 වසරේ ප්‍රදේශයේ පොදු එළිමහන් විවෘත භූමි ඉඩම් හෙක්ටයාර් 1.27 ක් පිහිටා ඇත. ඒ අනුව නගරයේ ජනගහනයට ප්‍රමාණවත් තරම් පොදු විනෝද පහසුකම් නොමැති අතර දැනට පවතින ස්ථානවලද පහසුකම් ප්‍රමාණවත් නොවේ.

සංවර්ධන සැලැස්මේ දත්ත විශ්ලේෂණයන්ට අනුව 2030 වන විට ජනගහනය 3220 ලෙස පුරෝකථනය කර ඇත. ඒ අනුව 2030 වන විට පොදු එළිමහන් විවෘත භූමි ලෙස ඉඩම් හෙක්ටයාර් 4.5 ක් අවම වශයෙන් වෙන්කළ යුතුය.

හක්මන නාගරික සංවර්ධන බල ප්‍රදේශය සඳහා 2018 – 2030 වසර සඳහා යෝජිත පොදු එළිමහන් විවෘත භූමි සැලැස්ම සඳහා වැඩිදුර විස්තර වගු අංක 17 යටතේද සිතියම් අංක 18 සහ ඇමුණුම අංක 04 මගින්ද දක්වා ඇත.

**වගු අංක 17 : පවතින සහ යෝජිත පොදු එළිමහන් විවෘතභූමි ප්‍රමාණය - හක්මන නාගරික බල ප්‍රදේශය**

| | ප්‍රමාණය (හෙක්ටයාර්) |
|---|---|
| පවතින පොදු එළිමහන් විවෘතභූමි ප්‍රමාණය | 1.27 |
| යෝජිත පොදු එළිමහන් විවෘතභූමි ප්‍රමාණය | 3.23 |
| **එකතුව** | **4.50** |

**උපාය මාර්ග**

**1. යෝජිත පොදු එළිමහන් විවෘතභූමි සැලැස්ම සඳහා උපාය මාර්ග**

i. දැනට පවතින සියළුම ක්‍රීඩා බිම් සහ ක්‍රීඩා කල හැකි මෙන්ම පොදු විවෘත භූමි ලෙස පවතින හිස් ඉඩම් හැකිතාක් දුරට ප්‍රයෝජනයට ගැනිම, වර්ගීකරණය කිරීම හා ප්‍රතිසංවර්ධනය කිරීම.

ii. ඉඩම් සහ අනු බෙදීම්වලදී වෙන් කරනු ලබන 10% අදාළ විවෘත භූමි සම්බන්ධ නීති රෙගුලාසි බලාත්මක කිරීම සහ එම ඉඩම් ඍජු විනෝද පහසුකම් සඳහා පමණක් යොදා ගැනීම.

iii. රේඛිය උද්‍යාන සංකල්පය ක්‍රියාත්මක කිරීම.

ප්‍රදේශයේ පවතින රේඛිය උද්‍යාන ලෙස සංවර්ධනය හැකි ඇල මාර්ග රක්ෂිතයන් ජනතාවට අවශ්‍ය ප්‍රමාණවත් විනෝදාස්වාද කටයුතු සහ පහසුකම් සැලසීමට යොදා ගත යුතුය.

iv. මාර්ග දෙපස රුක් රෝපණ තීරු ප්‍රදේශ ඇති කිරීම.
මාර්ග සඳහා පවතින සහ යෝජිත රක්ෂිතයන්ද රුක් රෝපණ තීරු සංකල්පය ඔස්සේ හැකි සෑම මාර්ගයකම දෙපස සංවර්ධනය කරමින් හරිත මංපෙත් වැඩි දියුණු කල යුතුය.

**2. 2030 වන විට උෂ්ණත්වය අඩු කිරීම - ක්‍රමවේදය**

i. සියළුම රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ගොඩනැගිලි නිල හරිත ශ්‍රී ලංකා ජාතික ගොඩනැගිලි හරිතකරණය අනුව සිදු කිරීම.


ii. සියළුම කාර්යාල සහ නිවාස ඉදිකිරීමේදී වහල මත හරිත පියසි ඉදිකිරීම සහ හරිත පියසි තුල ජල විහිදුම් ක්‍රම (Water sprinkler) භාවිතයට යොමු කිරීම.

iii. ගොඩනැගිලි වර්ණ ගැන්වීමේදී ලා වර්ණ යෙදීම පිළිබඳව දැනුවත් කිරීම.

iv. යෝජිත සියළුම වාහන නැවතුම්හලවල් සඳහා හරිත නැවතුම් සංකල්පය හඳුන්වාදීම සහ පවතින වාහන නැවතුම්පලවල් හරිත නැවතුම්පලවල් ලෙස ප්‍රතිසංවර්ධනය කිරීම.

v. බිම් ඇතුරුම් ක්‍රමය ජලය පොලවට උරාගන්නා ක්‍රම වේදයන්ට පමණක් සීමා කිරීම (interlocking ).

**සිතියම් අංක 18 : පොදු එළිමහන් විවෘත භූමි සැලැස්ම : හක්මන නාගරික සංවර්ධන ප්‍රදේශය (2030)**



### 6.5.5 කෘෂිකාර්මික සැලැස්ම

හක්මන සංවර්ධන ප්‍රදේශය මූලික වශයෙන් වී වගාව පදනම් කරගත් කෘෂි වටපිටාවකින් යුත් ප්‍රදේශයකි. නගර මධ්‍ය යෙහි මුළු භූමියෙන් 53% ක් හරිත ආවරණයෙන් යුක්ත වන අතර, ඉන් 37% ක් කුඹුරු ඉඩම් ද, 10.5% ක් ගෙවතු වලින් හා 5.5% වෙනත් බෝගවලින් ද සමන්විත වේ. කෘෂිකාර්මික ඉඩම් අතර කුඹුරු ප්‍රධාන වන අතර, පොල්, කුරුඳු හා වෙනත් වගාද කෘෂිකර්මාන්තයට දායක වී තිබේ.

වැව් ආශ්‍රිත වාරි ජලය මඟින් කෘෂි කටයුතු සිදුවන අතර, කෘෂි අංශයේ වී නිෂ්පාදනය සලකන විට මාතර දිස්ත්‍රික්කයේ සමස්ථ වී නිෂ්පාදනයෙන් 7.9% දායක වී ඇත්තේ හක්මන ගොවිජන සංවර්ධන බල ප්‍රදේශයෙනි. එසේම පොල් නිෂ්පාදනය දිස්ත්‍රික් ප්‍රතිශතය අනුව 9.2%කි.

හක්මන නගරයේ ප්‍රධාන ශක්තිය වන 36% වී වගා ප්‍රදේශ වුවද, කෘෂි ආර්ථිකය ලාභදායී නොවීම හා දෙවන පරම්පරාව කෘෂි කටයුතු වලින් ඉවත්වීමේ නැඹියාවක් පවතී.

තවද, හක්මන නගරයේ ප්‍රධාන ආර්ථික අංශය (Base Factor) වන්නේ කෘෂිකර්මාන්තයයි. තවද, ඒ හා බැඳුනු සමාජීය සංවර්ධනයක්ද ඇත. විශේෂයෙන්ම කෘෂිකාර්මික කමිටු කීපයක් ප්‍රදේශයේ දක්නට ඇත. එමෙන්ම කෘෂිකර්මාන්තය ප්‍රබල ලෙස සිදුකිරිම නිසා ප්‍රදේශයේ භෞතික පරිසරය සංරක්ෂණ කිරිමට එය ඉවහල් වී ඇත.

**උපාය මාර්ග :-**

ප්‍රදේශයේ ආර්ථිකයට, භෞතික පරිසරයට හා සාමාජීය වශයෙන් වැදගත් වීම නිසා කෘෂිකර්මාන්තය ප්‍රවර්ධනය හා සංරක්ෂණය අරමුණු කොට කෘෂි සංවර්ධන උපාය මාර්ග කීපයක් සකස් කර ඇත. ඒ අනුව, කෘෂි සංචාරක මධ්‍යස්ථාන සකස් කර ඇත. ඒ අනුව, කෘෂි සංචාරක මධ්‍යස්ථාන සහ රටා වී වගාව හඳුන්වාදීම සහ කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරිමේ අරමුණින් කෘෂි පාරිසරික සංචාරක කර්මාන්තය නඟා සිටුවීමට කටයුතු කිරිම උපක්‍රමයක් ලෙස හැඳින්විය හැකිය.

කෘෂි සංචාරක මධ්‍යස්ථාන සහ රටා වී වගාව සිදුකිරිම සඳහා ප්‍රධාන වශයෙන් ස්ථාන 03ක් තෝරාගෙන ඇත. ප්‍රධාන මාර්ගයට ආසන්නවීම සහ වැඩිපුර ජනතාව ගැවසෙන ප්‍රදේශ ආශ්‍රිතව හක්මන - වලස්මුල්ල මාර්ගයේ සතිපොළ ඉදිරිපිට, බෙලිඅත්ත මාර්ගයේ නව බුද්ධ ජයන්ති විද්‍යාල භූමිය ආශ්‍රිතව සහ මාතර මාර්ගයේ බස් නැවතුම ඉදිරිපිට සහ කෝංගල ප්‍රාථමික විද්‍යාලය අසල පිහිටි කුඹුරු බිම් මේ සඳහා තෝරාගෙන ඇත.
ඒ අනුව, එම ප්‍රදේශය සංචාරක ආකර්ශනයක් සහිත ප්‍රදේශ ලෙස සංවර්ධනය වීමේදී එයට යාබඳව ඇති කෘෂිකාර්මික ඉඩම් වඩාත් ඵලදායී ලෙස කෘෂි සංවර්ධනයට යොදා ගැනීමට ගොවීන්

යොදා ගැනීම ප්‍රධාන කෘෂි සංවර්ධනය උපක්‍රමය වේ. තවද, කෘෂි පාදක සංචාරක කර්මාන්තය හඳුන්වාදීම උපක්‍රමයක් ලෙස යොදා ගැනීම නිසා වී වගාව සාම්ප්‍රදායික වගා තාක්ෂණය ප්‍රචලිත කිරීමට හක්මන ගොවිජන සේවා දෙපාර්තමේන්තුව දැනටමත් එකඟ වී ඇත. ඒ තුලින් ගොවීන්ගේ නිෂ්පාදන පිරිවැය අඩුවීම සහ නිෂ්පාදන වලට වැඩි මිලක් ලැබීම නිසා ගොවීන්ගේ ආදායම ප්‍රවර්ධනය වනු ඇත.

හක්මන නගරයේ කෘෂිකාර්මික සංවර්ධන උපක්‍රම අතර ප්‍රධාන තැනක් ගනු ලබන්නේ සංවර්ධන සැලැස්මේ අඩංගු කලාපීය සැලැස්මයි. ඒ අනුව, කලාප සැලැස්ම මඟින් දැනට පවත්නා කුඹුරු ඉඩම් තවදුරටත් තෙත් බිම් හා කුඹුරු ඉඩම් වශයෙන්ම පවත්වා ගැනීමේ උපක්‍රමයක් ලෙස පවත්නා කුඹුරු ඉඩම් සහිත ප්‍රදේශය හරිත සංරක්ෂණ කලාපය (GCZ) ලෙස නම් කර ඇති අතර, එම කලාපය තුල කිසිදු පස් පිරවීමක් සඳහා ඉඩ නොලැබෙන අතර, කෘෂිපාදක සංචාරක කර්මාන්තය සංවර්ධනය සඳහා පමණක් කොන්දේසිවලට යටත්ව අවසර ලබාදීම සිදුකරයි.

තවද, කෘෂිකාර්මික සංවර්ධනයේදී ජලාශ සහ ඇළ මාර්ග සංවර්ධනය ඉතාමත් වැදගත් වේ. ඒ අනුව, සියළුම ඇළ මාර්ග සංරක්ෂණය කිරීමේ උපක්‍රමයක් ලෙස එම ජලාශයට සහ ඇළ මාර්ග සඳහා රක්ෂිත සීමාවන් හඳුන්වා දී ඇත.

හක්මන නගරයේ කෘෂිකර්මාන්තයට බලපාන ප්‍රධාන ගැටළුවක් ලෙස කෘෂි නිෂ්පාදන සඳහා හොඳ මිලක් නොලැබීම සැලැස්ම තුලින් හඳුනාගෙන ඇත. එහිදී කලින් තිබූ තොග වෙළඳපොල නොමැතිකමින් අතරමැදියන්ගේ ග්‍රහනයට හසුවීම නිසා මෙම තත්ත්වය උදා වී ඇත. එම තත්ත්වය වළක්වා කෘෂි නිෂ්පාදන ද්‍රව්‍යවලට හොඳ මිලක් ලබාදීමේ උපක්‍රමයක් ලෙස දැනට සතිපොළ පවත්නා භූමිය සංවර්ධනයේදී කුඩා තොග පොල, මහජන පොල සහ සතිපොල එකම ස්ථානයකට වන ලෙස සංවර්ධනය කිරීමට හඳුනාගෙන ඇත.

## 6.6. සංස්කෘතික හා උරුමයන් කළමනාකරණ උපාය මාර්ග

හක්මන නාගරික බල ප්‍රදේශය තුළ පෞරාණික වශයෙන් ඉතා වැදගත් ස්ථානයක් ලෙස ජයසුමනාරාම මහා විහාරය හඳුනාගත හැකිය.

**ජයසුමනාරාම මහා විහාරය**

හක්මන නාගරික බල ප්‍රදේශයේ හමුවන පෞරාණික බෞද්ධ සිද්ධස්ථානයක් ලෙස ජයසුමනාරාම මහා විහාරය දැක්විය හැකිය. මීට වසර 200 කට පෙර මෙම විහාරස්ථානය හඳුන්වා ඇත්තේ "මැන්ඩිකෙල් පන්සල" ලෙසිනි. මුල් කාලීනව රාමඤ්ඤ නිකායට අයත් දකුණු පළාතේ බෞද්ධ අධ්‍යාපන මධ්‍යස්ථාන වලින් "ජයසුමනාරාම මහා විහාරය" ප්‍රධාන මධ්‍යස්ථානයක් වී තිබූ බවට හඳුනාගත හැකිය.

**උපාය මාර්ග**

i. සංස්කෘතික, ඓතිහාසික සහ පුරාවිද්‍යාත්මක වශයෙන් වැදගත් වන ස්ථාන පුරා විද්‍යාත්මක ක්‍රමවේදයන්ට අනුව සංරක්ෂණය කිරීම.

ii. සංරක්ෂණය කරන ලද ස්ථාන නිසි පරිදි නඩත්තු කිරීම සහ කළමනාකරණය කිරීම.

iii. මෙම ස්ථානවල ඓතිහාසික හා සංස්කෘතික, පුරාවිද්‍යාත්මක වටිනාකම පිළිබඳව දැනුවත් කිරීම සහ ඒ හරහා ආර්ථිකමය වශයෙන් දායකත්වය ලබා ගැනීමට කටයුතු කිරීම සඳහා දේශීය හා විදේශීය සංචාරක ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

## 6.7 ක්‍රියාත්මක කිරීමේ උපක්‍රම



හක්මන නගර සංවර්ධන සැලැස්මෙහි අරමුණු හා උපක්‍රම සාක්ෂාත් කරගැනීමේ අරමුණින් සංවර්ධන ව්‍යාපෘති කීපයක් ක්‍රියාත්මක කිරිමට හඳුනාගෙන ඇත. එහිදී නගරයේ විධිමත් නිර්මිත පරිසරයක් ඇතිකිරිම සහ නාගරික වැසියන්ගේ ආර්ථිකය නගාසිටුවීම ප්‍රධාන අරමුණු වේ. එම ව්‍යාපෘතීන් සංවර්ධන සැලැස්මේ දැක්ම, අවශ්‍යතාවය හා සංවර්ධන ප්‍රතිලාභ අනුව බර තැබීම් සිදුකරන ලද අතර, එම බර තැබීම් අනුව හඳුනාගන්නා ලද ව්‍යාපෘති ලේඛණය පහත පරිදි දැක්විය හැකිය. එම බර තැබීම් වර්ගීකරණය ඇමුණුම් අංක 02 යටතේ දක්වා ඇත.

1. මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය
2. සතිපොල සංවර්ධන ව්‍යාපෘතිය
3. මහජන පොළ ප්‍රතිසංවර්ධන ව්‍යාපෘතිය
4. බස් නැවතුම්පල හා අවට සංවර්ධන ව්‍යාපෘතිය
5. බස් ඩිපෝව ප්‍රතිස්ථාන ගත කිරිම
6. තානායම ඉදිකිරිම
7. කෘෂි සංචාරක ප්‍රවර්ධන මධ්‍යස්ථාන සහ රටා වී වගාව සිදුකිරිම.
8. පිහිනුම් තටාකය හා ක්‍රීඩා පහසුකම් සංවර්ධනය
9. බුද්ධ ජයන්ති විද්‍යාලය ප්‍රතිස්ථානගත කිරිම
10. තැපැල් කාර්යාලය ප්‍රතිසංවර්ධන ව්‍යාපෘතිය
11. නව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ඉදිකිරීම

## 6.7.1 උපාය මාර්ගික ව්‍යාපෘති හා අනෙකුත් ව්‍යාපෘති

| *ව්‍යාපෘති මාතෘකාව* | *හක්මන නගර සංවර්ධන ව්‍යාපෘතිය* |
|---|---|
| *ව්‍යාපෘතිය* | *නව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ඉදිකිරීම - හක්මන* |
| ව්‍යාපෘති යෝජනාව | දෛනික සේවා ලබාගැනීමට පැමිණෙන මහජනතාවට අවශ්‍ය ප්‍රශස්ථ හා කාර්යක්ෂම සේවාවක් සැපයීම |

ව්‍යාපෘති ස්ථානය

| | | | | |
|---|---|---|---|---|
| ස්ථානය | පළාත | දකුණු පළාත | දිස්ත්‍රික්කය | මාතර |
| | ප්‍රා.ලේ. කොට්ඨාශය | හක්මන | පළාත් පාලන ආයතනය | හක්මන ප්‍රා.ස. |
| මායිම් | උතුරු | නැගෙනහිර | දකුණු | බටහිර |
| | පුෂ්පාරාම මාවත | නේවාසික | අබේවික්‍රම මාවත | ගොවිජන සේවා කාර්යාලය සහ ඉඩම |
| ප්‍රවේශය | අබේවික්‍රම මාවත (ප්‍රාදේශීය සභා මාර්ගය) | | | |
| පිහිටීම සිතියම |    | | | |
| යාබද ඉඩම් පරිහරණය |   | යෝජිත ව්‍යාපෘතිය සඳහා බෙරුවේවෙල ග්‍රාම නිලධාරී වසමෙහි කොටුගොඩැල්ල නැමති ඉඩම තෝරා ගෙන ඇත. ඊට ආසන්න භූමි පරිහරණ රටාව අනුව රාජ්‍ය ආයතන (ගොවිජන සේවා කාර්යාලය හා මධ්‍යම බෙහෙත් ශාලාව) සහ නේවාසික භාවිතයන් පවතී. | | |

**ව්‍යාපෘති සාධාරණීකරණය**


| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| **ව්‍යාපෘති වර්ගය** | නව | √ | වැඩිදියුණු කිරීම | | ව්‍යාපෘතිය | | ඉඩම් සංවර්ධනය පමණක් |
| **ව්‍යාපෘති වර්ගය** | සංරක්ෂණ | වාණිජ | භූ දර්ශනය සහ විනෝද කටයුතු | උරුමය | නිවාස | **ප්‍රතිස්ථාපනය** | **යටිතල පහසුකම්** |
| | | | | | | √ | √ |
| **ව්‍යාපෘති අංශ** | පාරිසරික | | ආර්ථික | | සමාජ | | √ |
| **ව්‍යාපෘතියේ අරමුණු** | හක්මන නගරය මාතර දිස්ත්‍රික්කයේ උප කලාපීය නාගරික මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය වෙමින් පවතී. දෛනිකව තම සේවා අවශ්‍යතා සපුරා ගැනීම සඳහා පැමිණෙන 7500 – 8000ත් අතර වන මහජනතාවට අවශ්‍ය සේවා පහසුකම් ලබාදීම සිදුකෙරේ. මාතර, කඹුරුපිටිය, වලස්මුල්ල, කිරින්ද, බෙලිඅත්ත වැනි උප කලාපීය සේවා පථයක් ඇති නාගරික මධ්‍යස්ථාන සමග දෙවන පෙල මාර්ග පද්ධතියක් මගින් සම්බන්ධ වී ඇත.<br>ඒ අනුව මෙම ව්‍යාපෘතිය මඟින් පහත සඳහන් අරමුණු ඉටුකිරිමට යෝජිතය.<br>1. ඉඩ පහසුකම් සහිත නවීකරණය කළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් ඉදිකිරිම.<br>2. දැනට පවත්නා ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පවතින තදබදය හා අවිධිමත්භාවය නිසා මහජනතාවට ඇතිවන අපහසුතාවය අවම කිරිම. | | | | | | | |
| **ව්‍යාපෘතියේ අවශ්‍යතාවය** | හක්මණ නගරය දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ නැගෙනහිර මායිමෙහි පිහිටා ඇත.<br>එසේම යාබද නගර අතර අරීය විහිදුනු මාර්ග ජාලයකින් හක්මණ නගරය සම්බන්ධ වී ඇත. ඒ අනුව, මාතර, කඹුරුපිටිය, වලස්මුල්ල, බෙලිඅත්ත වැනි උපකලාපීය සේවාපථයක් ඇති නාගරික මධ්‍යස්ථාන සමග දෙවන පෙළ මාර්ග පද්ධතියක් මගින් සම්බන්ධ වී ඇත. හක්මණ නගරයට සංක්‍රමණය වන දෛනික සංක්‍රමන ජනගහනය 7,500 – 8,000 ක් අතර ප්‍රමාණයක් දෛනික සේවා හා වෙනත් අවශ්‍යතා සඳහා පැමිණේ.<br>දැනට පවත්නා ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැගිල්ල ප්‍රමාණවත් ඉඩකඩ පහසුකම් නොමැති බැවින් යෝජිත නව ගොඩනැගිල්ල යෝජනා කර ඇත | | | | | | | |


**ව්‍යාපෘති විස්තරය**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| **වර්තමාන ඉඩම් හිමිකම** | පුද්ගලික | | රජයේ | √ | වෙනත් | | |
| **හිමිකම පිළිබඳ විස්තර** | පෞද්ගලික කුඹුරු ඉඩම හක්මන ප්‍රාදේශීය ලේකම් විසින් යෝජිත ව්‍යාපෘතිය පවරා ගෙන ඇත. | | | | | | |
| **මැනුම් සැලැස්මේ විස්තර** | **පිඹුරු අංකය** | **මිනින්දෝරුවරයාගේ නම** | **දිනය** | **ඉඩම් ප්‍රමාණය** | | | |
| | අනුරේඛන අංක MR/HKM/2014/169 | ජොෂ්ඨ මිනින්දෝරු අධිකාරී, මාතර | 2014.07.07 | අක්. 2.0 | රූඩ් 3.0 | පර්. 17.0 | |

**ව්‍යාපෘති විස්තරය**

| ව්‍යාපෘති කාලය | **කෙටි කාලීන (වසර 1)** | | මධ්‍ය කාලීන **(වසර 1-3)** | √ | **දිගු කාලීන (වසර 3)** | | **මූළු ඇස්තමේන්තු ගත පිරිවැය** | |
|---|---|---|---|---|---|---|---|---|
| **මූල්‍ය ක්‍රමය** | මහා භාණ්ඩාගාරය | | | | | | | |
| **ව්‍යාපෘතියේ විස්තරය (සිතියම් සමග)** |  | | | | | | | |
| **යටිතල පහසුකම් ලබා ගැනීම** | **ජලය**<br>ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය | | | | **විදුලිය**<br>ලංකා විදුලි බල මණ්ඩලය | | | |
| | සන අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතිය | ඔව් | | නැත | | | සුදුසු නොවේ SWM යෝජනාව ඉදිරිපත් කරන්න | |
| **කලාපය** | අඩු සනත්ව කලාපය | | කලාපීය අනුකූලතාව | ඔව් | √ | නැත | | |

| | |
|---|---|
| **වර්තමාන තත්ත්වය** |  |
| **පවත්නා තත්ත්වය :**<br><br>ඉඩම සංවර්ධනය කර ඇත | **ඡායාරූපය**<br><br> |

| | |
|---|---|
| **සැලසුම් කළ සැලැස්ම හා ගොඩනැඟිලි සැලසුම් කිරීමේ අවශ්‍යතා** |  |

**ව්‍යාපෘති අයවැය**

| **ක්‍රියාකාරිත්වය** | **වියදම (රු. මිලියන)** |
|---|---|
| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ඉදිකිරීම | 67.0 |

**අනුමත කරන ආයතන**

| | **අදාල වන ආයතන** | **වගකිව යුතු ආයතන** |
|---|---|---|
| **ක්‍රියාකාරිත්වය** | හක්මන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය<br>ගොඩනැගිලි දෙපාර්තමේන්තුව<br>නාගරික සංවර්ධන අධිකාරිය | ප්‍රාදේශීය ලේකම්<br>ප්‍රධාන ඉංජිනේරු<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ (සැලසුම්) |



| | **නීති රීති** | **මාර්ගෝපදේශ** |
|---|---|---|

| | | |
|---|---|---|
| **රෙගුලාසි සහ මාර්ගෝපදේශ** | නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් හා ගොඩනැගිලි රෙගුලාසි | සංවර්ධන සැලැස්මේ අඩු ඝනත්ව කලාපයට අයත් රෙගුලාසි |

| ***ව්‍යාපෘති මාතෘකාව*** | ***හක්මන නගර සංවර්ධන ව්‍යාපෘතිය*** |
|---|---|
| *ව්‍යාපෘතිය* | ***රටා වී වගාව පදනම් කරගත් කෘෂි උපදේශන හා කෘෂි බෝග අලෙවි මධ්‍යස්ථානයක් ඉදිකිරීම*** |
| **ව්‍යාපෘති යෝජනාව** | නගරයට අලංකාරයක් ගෙන දෙන පරිසර හිතකාමී උපදේශන හා කෘෂි බෝග |

| | |
|---|---|
| | අලෙවි මධ්‍යස්ථානයක් ඇති කිරීම. |

**ව්‍යාපෘති ස්ථානය**

| | | | | |
|---|---|---|---|---|
| **ස්ථානය** | **පළාත** | **දකුණු පළාත** | **දිස්ත්‍රික්කය** | **මාතර** |
| | **ප්‍රා.ලේ. කොට්ඨාශය** | **හක්මන** | **පළාත් පාලන ආයතනය** | **හක්මන ප්‍රා.ස.** |
| **මායිම්** | උතුරු | නැගෙනහිර | දකුණු | බටහිර |
| | වාරි ඇළ | කුඹුර | කුඹුර හා මාර්ගය | හක්මන - වලස්මුල්ල මාර්ගය |
| **ප්‍රවේශය** | **මාර්ග සංවර්ධන අධිකාරී මාර්ගය (හක්මන - වලස්මුල්ල මාර්ගය)** | | | |
| **පිහිටීම සිතියම** |    | | | |
| **යාබද ඉඩම් පරිහරණ** |  හක්මන සති පොළට ඉදිරි පසින් පිහිටි කුඹුරු යාය යෝජිත ව්‍යාපෘතිය සඳහා හඳුනාගෙන ඇත. හක්මන - වලස්මුල්ල මාර්ගය හා හක්මන - බෙලිඅත්ත මාර්ගයට ආසන්නව පාරිසරික සංවේදී කලාපයක පිහිටා ඇත. | | | |

**ව්‍යාපෘති සාධාරණීකරණය**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| **ව්‍යාපෘති වර්ගය** | නව | √ | වැඩිදියුණු කිරීම | | ව්‍යාපෘතිය | | ඉඩම් සංවර්ධනය පමණක් |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ව්‍යාපෘති වර්ගය | සංරක්ෂණ | වාණිජ | භූ දර්ශනය සහ විනෝද කටයුතු | උරුමය | නිවාස | ප්‍රතිස්ථාපනය | යටිතල පහසුකම් |
| | | | √ | | | | |


| | | | | | | |
|---|---|---|---|---|---|---|
| ව්‍යාපෘති අංශ | පාරිසරික | √ | ආර්ථික | | සමාජ | √ |

| | |
|---|---|
| ව්‍යාපෘතියේ අරමුණු | 1.පාරම්පරික කෘෂි බෝග වගාව සම්බන්ධව ගොවීන් හා මහජනතාව දැනුවත් කිරිම.<br>2.වැඩමුළු සංවිධානය කිරිම.<br>3.වස විස නැති කෘෂිබෝග අලෙවි කිරිම.<br>4.නූතන පරපුර කෘෂිබෝග වගාවට යොමු කිරිම හා එහි නිරතවීමට ඇල්මක් ඇතිකිරිම.<br>5.ප්‍රාදේශීය සභාවට ආදායම් මාර්ගයක් ඇති කිරිම.<br>6.නූතන හා පාරම්පරික වී වගාව සම්බන්ධ තාක්ෂණික දැනුම ලබාදීම. |
| ව්‍යාපෘතියේ අවශ්‍යතාවය | හක්මන නගරය වටා පවතින කුඹුරු ඉඩම් නගරයට අලංකාරත්වයක් ගෙන දෙන පරිදි රටා වී වගා කිරිම හා නගරයට හා නගරය හරහා ගමන් ගන්නා ජනතාවට අවශ්‍ය පාරම්පරික වස විස නැති කෘෂි බෝග මිලට ගැනීමට අවශ්‍ය පහසුකම් සැපයීම. තවද, පාරම්පරික හා නූතන වී වගාව සම්බන්ධව ගොවීන් හා පාසැල් සිසුන් දැනුවත් කිරිම හා පැරණි හා නවීන තාක්ෂණික උපක්‍රම හඳුන්වා දීම. කෘෂිබෝග අලෙවි කිරිම තුලින් හක්මන ප්‍රාදේශීය සභාවට ආදායම් මාර්ගයක් ලබාදීම. |

**ව්‍යාපෘති විස්තරය**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| වර්තමාන ඉඩම් හිමිකම | පුද්ගලික | | රජයේ | √ | වෙනත් | | |
| හිමිකම පිළිබඳ විස්තර | හක්මන ප්‍රාදේශීය ලේකම් විසින් අත්පත් කරගෙන ඇත. | | | | | | |
| මැනුම් සැලැස්මේ විස්තර | පිඹුරු අංකය | මිනින්දෝරුවරයාගේ නම | දිනය | ඉඩම් ප්‍රමාණය | | | |
| | 2013/623 | පී. සමරසිංහ | 2013.03.16 | අක්.8.0 | 0 | 0 | |

**ව්‍යාපෘති විස්තරය**

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ව්‍යාපෘති කාලය | කෙටි කාලීන (වසර 1) | | මධ්‍ය කාලීන (වසර 1-3) | √ | දිගු කාලීන (වසර 3) | | මුළු ඇස්තමේන්තුගත පිරිවැය | රු.මි. 50 |
| මූල්‍ය ක්‍රමය | හදබිම අධිකාරිය | | | | | | | |
| ව්‍යාපෘතියේ විස්තරය (සිතියම් සමග) |   | | | | | | | |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| **යටිතල පහසුකම් ලබා ගැනීම** | **ජලය**<br>ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය | | | | **විදුලිය**<br>ලංකා විදුලි බල මණ්ඩලය | | |
| | ඝන අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතිය | ඔව් | ✓ | නැත | | | සුදුසු නොවේ SWM යෝජනාව ඉදිරිපත් කරන්න |
| **කලාපය** | හරිත සංරක්ෂණ කලාපය | | | කලාපීය අනුකූලතාව | ඔව් | √ | නැත |

**වර්තමාන තත්ත්වය**



හක්මන - වලස්මුල්ල මාර්ගයේ පිහිටි සතිපොල ඉදිරිපිට පිහිටි කුඹුරු ඉඩම යෝජිත ව්‍යාපෘතිය සඳහා තෝරාගෙන ඇත. එය වර්තමානයේ ප්‍රාදේශීය සභාව මඟින් අත්පත් කරගැනීමට අවශ්‍ය මූලික කටයුතු සකස් කර මැනීම් සිදුකර ඇත. යෝජිත ඉඩමේ ප්‍රමාණය අක්කර 08ක් පමණ වන අතර, කුඹුරු ඉඩම හරහා දැනට මුරුතමුරය වැවේ සිට ගලා එන ජල මාර්ගයකින් වී වගාව සිදුකරයි. තවද, ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරිම සඳහා අවශ්‍ය නල ජලය හා විදුලිය වැනි පහසුකම් වලින් යුක්ත වේ.

**පවත්නා තත්ත්වය**
දැනට කුඹුරු ඉඩමක් ලෙස පවතී

**ඡායාරූපය**



**සැලසුම් කළ සැලැස්ම හා ගොඩනැඟිලි සැලසුම් කිරීමේ අවශ්‍යතා**

1. රටා වී වගා සැලැස්ම
2. කෘෂි භෝග අලෙවි මධ්‍යස්ථානයේ සැලසුම්
3. භූ දර්ශන සැලැස්ම

**ව්‍යාපෘති අයවැය**

| ක්‍රියාකාරිත්වය | වියදම (රු. මිලියන) |
|---|---|
| කෘෂි අලෙවි මධ්‍යස්ථානය ඉදිකිරීම | 25.0 |
| රටා වී වගාව සහ භූ දර්ශනය | 25.0 |
| එකතුව | 50.0 |



**අනුමත කරන ආයතන**

| **ක්‍රියාකාරිත්වය** | **අදාල වන ආයතන** | **වගකිව යුතු ආයතන** |
|---|---|---|
| 1. භූ දර්ශන සැලැස්ම<br>2. අලෙවි මධ්‍යස්ථානයේ සැලැස්ම | හක්මන ප්‍රාදේශීය සභාව<br>නාගරික සංවර්ධන අධිකාරිය | හක්මන ප්‍රාදේශීය සභාව<br>නාගරික සංවර්ධන අධිකාරිය |

| | **නීති රීති** | **මාර්ගෝපදේශ** |
|---|---|---|
| **රෙගුලාසි සහ මාර්ගෝපදේශ** | නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් හා ගොඩනැගිලි රෙගුලාසි | 1. හරිත සංරක්ෂණ කලාපයට අයත් රෙගුලාසි<br>2. ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ නිර්දේශය<br>3. මධ්‍යම පරිසර අධිකාරියේ නිර්දේශය,<br>4. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ නිර්දේශය. |

| ව්‍යාපෘති මාතෘකාව | හක්මන නගර සංවර්ධන ව්‍යාපෘතිය |
|---|---|
| ව්‍යාපෘතිය | බුද්ධ ජයන්ති විද්‍යාලය ප්‍රතිස්ථානගත කිරිම හා පාරම්පරික කෘෂිකර්මය පදනම් කරගත් අධ්‍යාපනික මධ්‍යස්ථානය |
| **ව්‍යාපෘති යෝජනාව** | බුද්ධ ජයන්ති විද්‍යාලයේ අඩුපාඩු සකස් කිරිම හා විධිමත් පහසුකම් වලින් සමන්විත නව ගොඩනැගිලි ඉදිකිරිම, පාරම්පරික කෘෂිකර්මය සම්බන්ධ දැනුවත් කිරිමේ හා පුහුණු පාඨමාලා පාසල් මට්ටමින් පැවැත්වීමේ මධ්‍යස්ථානයක් ඉදිකිරිම. |

**ව්‍යාපෘති ස්ථානය**

| | | | | |
|---|---|---|---|---|
| **ස්ථානය** | **පළාත** | **දකුණු පළාත** | **දිස්ත්‍රික්කය** | **මාතර** |
| | **ප්‍රා.ලේ. කොට්ඨාශය** | **හක්මන** | **පළාත් පාලන ආයතනය** | **හක්මන ප්‍රා.ස.** |
| **මායිම්** | උතුරු | නැගෙනහිර | දකුණු | බටහිර |
| | හක්මන - බෙලිඅත්ත මාර්ගය | කුඹුර | කුඹුර | කුඹුර |
| **ප්‍රවේශය** | හක්මන - බෙලිඅත්ත මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය) | | | |
| **පිහිටීම සිතියම** |   | | | |
| **යාබඳ ඉඩම් පරිහරණ** |  | බුද්ධ ජයන්ති විද්‍යාලය දැනට පවතින ස්ථානයේ හක්මන - බෙලිඅත්ත මාර්ගයෙන් දකුණු දෙසින් පවතින කුඹුරු ඉඩම් යෝජිත ව්‍යාපෘති භූමියට අයත් වන අතර, භූමි පරිහරණ රටාව අනුව එක් පසකින් මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ගයද අනෙකුත් දෙසින් කුඹුරු ඉඩම් ද පවතී. | | |

| | |
|---|---|

**ව්‍යාපෘති සාධාරණීකරණය**


| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ව්‍යාපෘති වර්ගය | නව | √ | වැඩිදියුණු කිරීම | | ව්‍යාපෘතිය | | ඉඩම් සංවර්ධනය පමණක් | |
| ව්‍යාපෘති වර්ගය | සංරක්ෂණ | වාණිජ | භූ දර්ශනය සහ විනෝද කටයුතු | උරුමය | නිවාස | ප්‍රතිස්ථාපනය | යටිතල පහසුකම් | |
| | | | | | | | √ | |
| ව්‍යාපෘති අංශ | පාරිසරික | √ | ආර්ථික | | සමාජ | √ | | |
| ව්‍යාපෘතියේ අරමුණු | මාතර, කඹුරුපිටිය, වලස්මුල්ල, කිරින්ද, බෙලිඅත්ත වැනි උප කලාපීය සේවා පථයක් ඇති නාගරික මධ්‍යස්ථාන සමග දෙවන පෙල මාර්ග පද්ධතියක් මගින් සම්බන්ධ වී ඇත. එම ප්‍රදේශවල සිට දෛනිකව පාසල් ළමුන් අධ්‍යාපන කටයුතු සඳහා මෙම විද්‍යාලය වෙත පැමිණේ.<br>ඒ අනුව මෙම ව්‍යාපෘතිය මඟින් පහත සඳහන් අරමුණු ඉටුකිරිමට යෝජිතය.<br><br>1. විද්‍යාලයේ දැනට පවත්නා ගැටළු හා තදබදය අවම කිරිම.<br>2. පාසල් ළමයින්ට අධ්‍යාපනය ලැබීමට අවශ්‍ය පහසුකම් වලින් යුත් සාමකාමී පරිසරයක් ඇතිකිරීම.<br>3. විධිමත් පහසුකම් සපිරි නව ගොඩනැගිලි, විවේකාගාර හා පුහුණු මධ්‍යස්ථාන ඉදිකිරිම.<br>4. පාරම්පරික හා සාම්ප්‍රදායික කෘෂිකර්මය සම්බන්ධව ප්‍රදේශයේ හා ඉන් බාහිරව පාසල් ළමුන්ට නේවාසික පුහුණු පාඨමාලා හා වැඩමුළු සංවිධානය කිරිමේ හා දැනුවත් කිරිමේ මධ්‍යස්ථානයක් ලෙස පවත්වාගෙන යාම. | | | | | | | | |
| ව්‍යාපෘතියේ අවශ්‍යතාවය | හක්මන නගරයේ දැනට පවත්නා ප්‍රධාන පාසලක් වන බුද්ධ ජයන්ති විද්‍යාලයේ පවතින අඩුපාඩු සහ ශාලා පහසුකම් වලින් යුත් නවීකරණය කරන ලද පාසල් ගොඩනැගිලි ඉදිකිරිම. එසේම පාරම්පරික හා නවීන කෘෂිකාර්මික දැනුම ලබාගැනීම සඳහා නවීන තාක්ෂණික අංගෝපාංගයන්ගෙන් යුත් දේශන ශාලා, විවේකාගාර හා පුහුණු මධ්‍යස්ථාන ඇතිකිරිම. තවද, ප්‍රදේශයේ හා ඉන් පිට පළාත් වලින් පැමිණෙන පාසල් ළමුන්ට අවශ්‍ය නේවාසික පුහුණුව හා පාඨමාලා, වැඩමුළු පැවැත්වීම සඳහා අවශ්‍ය පහසුකම් ලබාදීම. | | | | | | | | |

**ව්‍යාපෘති විස්තරය**

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| වර්තමාන ඉඩම් හිමිකම | පුද්ගලික | | රජයේ | √ | වෙනත් | |
| හිමිකම පිළිබඳ විස්තර | පෞද්ගලික කුඹුරු ඉඩම හක්මන ප්‍රාදේශීය ලේකම් විසින් යෝජිත ව්‍යාපෘතිය පවරා ගෙන ඇත. | | | | | |
| මැනුම් සැලැස්මේ විස්තර | පිඹුරු අංකය | මිනින්දෝරුවරයාගේ නම | දිනය | ඉඩම් ප්‍රමාණය | | |

**ව්‍යාපෘති විස්තරය**

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ව්‍යාපෘති කාලය | කෙටි කාලීන (වසර 1) | | මධ්‍ය කාලීන | √ | දිගු කාලීන (වසර 3) | | මුළු ඇස්තමේන්තුගත | |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | (වසර 1-3) | | | | පිරිවැය | |
| **මූලාශ්‍ර ක්‍රමය** | මහා භාණ්ඩාගාරය | | | | | | | |
| **ව්‍යාපෘතියේ විස්තරය (සිතියම් සමග)** |    | | | | | | | |
| **යටිතල පහසුකම් ලබා ගැනීම.** | **ජලය**<br>ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය | | | | **විදුලිය**<br>ලංකා විදුලි බල මණ්ඩලය | | | |
| | ඝන අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතිය | ඔව් | √ | නැත. | | | සුදුසු නොවේ SWM යෝජනාව ඉදිරිපත් කරන්න | |
| **කලාපය** | මධ්‍ය ඝනත්ව කලාපය | | | කලාපීය අනුකූලතාව | ඔව් | √ | නැත | |
| **සැලසුම් කළ සැලැස්ම හා ගොඩනැඟිලි සැලසුම් කිරීමේ අවශ්‍යතා** | | | | | | | | |
| බුද්ධ ජයන්ති විද්‍යාලයේ ප්‍රාථමික අංශයේ සැලැස්ම<br>භූ දර්ශන සැලැස්ම<br>මිනින්දෝරු සැලැස්ම | | | | | | | | |

**ව්‍යාපෘති ඇස්තමේන්තුව**

| **ක්‍රියාකාරිත්වය** | **වියදම (රු. මිලියන)** |
|---|---|
| බුද්ධ ජයන්ති විද්‍යාලය ඉදිකිරිම<br>• නේවාසිකාගාර<br>• ක්‍රීඩාංගනය | **400.0** |


| | **අදාල වන ආයතන** | **වගකිව යුතු ආයතන** |
|---|---|---|
| | | |


**අනුමත කරන ආයතන**

| | | |
|---|---|---|
| **ක්‍රියාකාරිත්වය** | අධ්‍යාපන දෙපාර්තමේන්තුව<br>කෘෂි කර්ම දෙපාර්තමේන්තුව<br>නාගරික සංවර්ධන අධිකාරිය<br>හක්මන ප්‍රාදේශීය සභාව | අධ්‍යාපන දෙපාර්තමේන්තුව<br>කෘෂිකර්ම දෙපාර්තමේන්තුව<br>නාගරික සංවර්ධන අධිකාරිය<br>හක්මන ප්‍රාදේශීය සභාව |
| **රෙගුලාසි සහ මාර්ගෝපදේශ** | **නීති රීති** | **මාර්ගෝපදේශ** |
| | නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් හා ගොඩනැගිලි රෙගුලාසි | සංවර්ධන සැලැස්මේ මධ්‍ය සනත්ව කලාපයට අයත් රෙගුලාසි<br>ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ නිර්දේශය, මධ්‍යම පරිසර අධිකාරියේ නිර්දේශය, වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ නිර්දේශය, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ නිර්දේශය |

| | |
|---|---|
| ***ව්‍යාපෘති මාතෘකාව*** | ***හක්මන නගර සංවර්ධන ව්‍යාපෘතිය*** |
| **ව්‍යාපෘතිය** | සතිපොළ සංවර්ධන ව්‍යාපෘතිය |
| **ව්‍යාපෘති යෝජනාව** | සතිපොළ සංවර්ධන ව්‍යාපෘතිය |

**ව්‍යාපෘති ස්ථානය**

| | | | | |
|---|---|---|---|---|
| **ස්ථානය** | **පළාත** | **දකුණු පළාත** | **දිස්ත්‍රික්කය** | **මාතර** |
| | **ප්‍රා.ලේ. කොට්ඨාශය** | **හක්මන** | **පළාත් පාලන ආයතනය** | **හක්මන ප්‍රා.ස.** |
| **මායිම්** | **උතුරු** | **නැගෙනහිර** | **දකුණු** | **බටහිර** |
| | කුඹුර | යෝජිත විකල්ප මාර්ගය | වලස්මුල්ල - මාතර මාර්ගය | හක්මන - මුරුතමුරය මාර්ගය |
| **ප්‍රවේශය** | හක්මන - බෙලිඅත්ත මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය) | | | |
| **පිහිටීම සිතියම** |   | | | |

| | |
|---|---|
| **යාබද ඉඩම් පරිහරණ (සිතියම සමග විස්තර කරන්න)** |  මාතර - වලස්මුල්ල ප්‍රධාන මාර්ගයෙන් ප්‍රවේශය ලබාගන්නා අතර, හක්මන මුරුතමුරය මාර්ගයට යාබදව දැනට පවතින පොල භූමියට පිටුපස භූමිය ව්‍යාපෘතිය සඳහා හඳුනාගෙන ඇත. උතුරු සහ නැගෙනහිර දෙසින් කුඹුරු ඉඩම් පවතී. |

**ව්‍යාපෘති සාධාරණීකරණය**


| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| **ව්‍යාපෘති වර්ගය** | නව | | වැඩිදියුණු කිරීම | √ | ව්‍යාපෘතිය | | ඉඩම් සංවර්ධනය පමණක් | |
| **ව්‍යාපෘති වර්ගය** | සංරක්ෂණ | වාණිජ | භූ දර්ශනය සහ විනෝද කටයුතු | උරුමය | නිවාස | **ප්‍රතිස්ථාපනය** | යටිතල පහසුකම් | |
| | | √ | | | | √ | | |
| **ව්‍යාපෘති අංශ** | පාරිසරික | | ආර්ථික | √ | සමාජ | √ | | |
| **ව්‍යාපෘතියේ අරමුණු** | හක්මණ නාගරික සංවර්ධන බල ප්‍රදේශයේ 45% ක් පමණ ප්‍රමාණයක් කුඹුරු හා පාරිසරික සංවේදී ඉඩම් වේ. මෙම කුඹුරු ඉඩම් වැඩි කොටසක් ප්‍රධාන මාර්ග දෙපස ව්‍යාප්ත වී ඇත. දැනට සති පොළ පැවැත්වෙන භූමිය අතීතයේ කුඹුරු ඉඩමක් ලෙස පැවති ඉඩම දැනට ගොඩකර පොළ සඳහා යොදාගෙන ඇත. මේ හේතුවෙන් ප්‍රදේශයේ ස්වභාවික ජල බස්නාපද්ධතියට බාධා පැමිණෙන අතර. වැසි දිනවලදී ප්‍රධාන මාර්ගය ජලයෙන් යටවන බව නිරීක්ෂණය කළ හැකිය. මේ හේතුවෙන් වඩාත් විධිමත් ආකාරයට සංවර්ධනය වූ සති පොළක් ඉදිකිරීම අරමුණ වේ.<br><br>මීට අමතරව පහත සඳහන් ප්‍රතිලාභ මෙම ව්‍යාපෘතියෙන් බලාපොරොත්තු වේ.<br><br>1. වඩා විධිමත් ආකාරයට සංවර්ධනය වූ සංවිධිත සති පොළක් ඉදිකිරීම.<br>2. ප්‍රදේශයේ ස්වභාවික ජලාපවාහනයට ඇති බාධා ඉවත් කිරීම.<br>3. නගර අලංකරණය.<br>4. විධිමත් රථවාහන නැවතුම් ස්ථානයක් ඇති කිරීම.<br>නාගරික සංවර්ධන අධිකාරිය මගින් සකස් කරනු ලබන නගර සංවර්ධන සැලැස්ම තුළින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අදහස් කරනු ලබන අතර, ඉහත ප්‍රතිලාභ මහජනතාවට හා වෙළඳුන්ට ලබා දීමට අපේක්ෂිතය. | | | | | | | |
| | හක්මණ නගරය දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ නැගෙනහිර මායිමෙහි පිහිටා ඇත. එසේම යාබද නගර අතර අරීය විහිදුනු මාර්ග ජාලයකින් හක්මණ නගරය සම්බන්ධ වී ඇත. ඒ අනුව, මාතර, කඹුරුපිටිය, වලස්මුල්ල, බෙලිඅත්ත වැනි උපකලාපීය සේවාපථයක් ඇති නාගරික මධ්‍යස්ථාන සමග දෙවන පෙළ මාර්ග පද්ධතියක් මගින් සම්බන්ධ වී ඇත. හක්මණ නගරයට සංක්‍රමණය වන දෛනික | | | | | | | |

| | |
|---|---|
| ව්‍යාපෘතියේ අවශ්‍යතාවය | සංක්‍රමන ජනගහනය 7,500 – 8,000 ක් අතර ප්‍රමාණයක් දෛනික සේවා හා වෙනත් අවශ්‍යතා සඳහා පැමිණේ.<br><br>හක්මණ සති පොළ හක්මණ ප්‍රාදේශීය සභාව මගින් පාලනය වන අතර, හක්මණ ප්‍රධාන බස්නැවතුම් පොළේ සිට මීටර් 200 ක පමණ දුරින් පිහිටා ඇත. ප්‍රාදේශීය සභාව, පුස්තකාලය, නගර ශාලාව හා ක්‍රීඩාපිටිය සති පොළ ආසන්නයේ පිහිටා ඇත. |

**ව්‍යාපෘති විස්තරය**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| වර්තමාන ඉඩම් හිමිකම | පුද්ගලික | √ | රජයේ | √ | වෙනත් | | |
| හිමිකම පිළිබඳ විස්තර | පෞද්ගලික කුඹුරු ඉඩම හක්මන ප්‍රාදේශීය ලේකම් විසින් යෝජිත ව්‍යාපෘතිය සඳහා පවරා ගෙන ඇත. | | | | | | |
| මැනුම් සැලැස්මේ විස්තර | පිඹුරු අංකය | මිනින්දෝරුවරයාගේ නම | දිනය | ඉඩම් ප්‍රමාණය | | | |
| | අනුරේඛණ අංක MR/DSO/HKM/2009/398 | ජ්‍යෝෂ්ඨ මිනින්දෝරු අධිකාරී | 2009.09.30 | අක්. 1.0 | රූඩ් 3.0 | පර්. 25.8 | |

**ව්‍යාපෘති විස්තරය**

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ව්‍යාපෘති කාලය | කෙටි කාලීන (වසර 1) | | මධ්‍ය කාලීන (වසර 1-3) | √ | දිගු කාලීන (වසර 3) | | මුළු ඇස්තමේන්තුගත පිරිවැය | |
| මූල්‍ය ක්‍රමය | මහා භාණ්ඩාගාරය | | | | | | | |
| ව්‍යාපෘතියේ විස්තරය (සිතියම් සමග) |  | | | | | | | |
| යටිතල පහසුකම් ලබා ගැනීම. | ජලය<br>ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය | | | | විදුලිය<br>ලංකා විදුලි බල මණ්ඩලය | | | |
| | ඝන අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතිය | ඔව් | | නැත. | | | සුදුසු නොවේ SWM යෝජනාව ඉදිරිපත් කරන්න | |
| කලාපය | සනත්ව කලාපය | | කලාපීය අනුකූලතාව | | ඔව් | √ | නැත | |

| | |
|---|---|
| **වර්තමාන තත්ත්වය** | මෙම සති පොළ 2010 වර්ෂයේදී හක්මන ප්‍රාදේශීය සභාවේ REEP ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රතිපාදන මත ඉදිකරන ලදි. කලින් වී වගා කරන ලද ප්‍රදේශයක් ප්‍රාදේශීය සභාව විසින් අත්පත් කරගැනීමෙන් යෝජිත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර ඇති අතර, ඒ අනුව කුඹුරු ඉඩම් ගොඩකිරීම නිසා වැසි ජලය බැසයාම පිළිබඳ ගැටළු ඇතිවී ඇත. තවද, යෝජිත භූමියෙන් කොටසක දැනට ප්‍රාදේශීය සභාව විසින් ළමා උද්‍යානයක් ඉදිකර ඇති අතර, පොළ භූමියෙන් දැනට භාවිතා කරනු ලබන්නේ 65%ක් පමණ ප්‍රමාණයකි.  |

ව්‍යාපෘති අයවැය

| ක්‍රියාකාරිත්වය | වියදම (රු. මිලියන) |
|---|---|
| සතිපොල ඉදිකිරීම | 260.0 |

අනුමත කරන ආයතන


| ක්‍රියාකාරිත්වය | අදාල වන ආයතන | වගකිව යුතු ආයතන |
|---|---|---|
| | නාගරික සංවර්ධන අධිකාරිය<br>හක්මන ප්‍රාදේශීය සභාව | නාගරික සංවර්ධන අධිකාරිය<br>හක්මන ප්‍රාදේශීය සභාව |

| | නීති රීති | මාර්ගෝපදේශ |
|---|---|---|
| රෙගුලාසි සහ මාර්ගෝපදේශ | නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් හා ගොඩනැගිලි රෙගුලාසි | සංවර්ධන සැලැස්මේ සනත්ව කලාපයට අයත් රෙගුලාසි<br>ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ නිර්දේශය, මධ්‍යම පරිසර අධිකාරියේ නිර්දේශය, වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ නිර්දේශය |

| *ව්‍යාපෘති මාතෘකාව* | *හක්මන නගර සංවර්ධන ව්‍යාපෘතිය* |
|---|---|
| **ව්‍යාපෘතිය** | **මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය** |
| **ව්‍යාපෘති යෝජනාව** | දෛනික සේවා ලබාගැනීමට පැමිණෙන මහජනතාවට අවශ්‍ය ප්‍රශස්ථ හා කාර්යක්ෂම සේවාවක් සැපයීම. |

**ව්‍යාපෘති ස්ථානය**

| | | | | |
|---|---|---|---|---|
| **ස්ථානය** | **පළාත** | **දකුණු පළාත** | **දිස්ත්‍රික්කය** | **මාතර** |
| | **ප්‍රා.ලේ. කොට්ඨාශය** | **හක්මන** | **පළාත් පාලන ආයතනය** | **හක්මන ප්‍රා.ස.** |
| **මායිම්** | උතුරු | නැගෙනහිර | දකුණු | බටහිර |
| | - | - | - | - |
| **ප්‍රවේශය** | මාතර - වලස්මුල්ල මාර්ගය, හක්මන බෙලිඅත්ත මාර්ගය, හක්මන - කඹුරුපිටිය මාර්ගය | | | |
| | | | | |

| | |
|---|---|
| **පිහිටීම සිතියම** |  |
| **යාබද ඉඩම් පරිහරණය** |  සංවර්ධනය කිරීමට යෝජිත මාර්ගවල දෙපස කුඹුරු ඉඩම් සහ වාණිජ සංවර්ධනය දක්නට ලැබේ. |

**ව්‍යාපෘති සාධාරණීකරණය**


| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| **ව්‍යාපෘති වර්ගය** | නව | | **වැඩිදියුණු කිරීම** | √ | ව්‍යාපෘතිය | | ඉඩම් සංවර්ධනය පමණක් |
| **ව්‍යාපෘති වර්ගය** | සංරක්ෂණ | වාණිජ | භූ දර්ශනය සහ විනෝද කටයුතු | උරුමය | නිවාස | ප්‍රතිස්ථාපනය | **යටිතල පහසුකම්** |
| | | | | | | | √ |
| **ව්‍යාපෘති අංශ** | පාරිසරික | | ආර්ථික | | **සමාජ** | | √ |

| | |
|---|---|
| ව්‍යාපෘතියේ අරමුණු | හක්මන නගරය මාතර දිස්ත්‍රික්කයේ උප කලාපීය නාගරික මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය වෙමින් පවතී. දෛනිකව තම සේවා අවශ්‍යතා සපුරා ගැනීම සඳහා පැමිණෙන 7500 – 8000 ත් අතර වන මහජනතාවට අවශ්‍ය සේවා පහසුකම් ලබාදීම සිදුකෙරේ. මාතර, කඹුරුපිටිය, වලස්මුල්ල, කිරින්ද, බෙලිඅත්ත වැනි උප කලාපීය සේවා පථයක් ඇති නාගරික මධ්‍යස්ථාන සමග දෙවන පෙල මාර්ග පද්ධතියක් මගින් සම්බන්ධ වී ඇත.<br><br>මාතර - වලස්මුල්ල මාර්ගය, හක්මන - බෙලි අත්ත මාර්ගය, හක්මන - කඹුරුපිටිය මාර්ගය හක්මන නගරය හා සම්බන්ධ ප්‍රධාන මාර්ග වේ. මෙම මාර්ග හක්මන නගර මධ්‍යයේ සිට සෑම දිශාවකටම කි.මී. 01 දක්වා දුරකට මංතීරු 4 කින් යුක්තව සංවර්ධනය කිරීමට යෝජිතය.<br><br>මීට අමතරව, දෙකටු කැල්ල මාර්ගය හා උඩු පීල්ලේගොඩ මාර්ගය සම්බන්ධ කරමින් මීටර් 7 ක් පමණ පළලකින් යුත් මාර්ගයක් සැලසුම්කර ඇත.<br><br>මෙම මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය තුලින් පහත දැක්වෙන ප්‍රතිලාභ ලබා ගැනීමට බලාපොරොත්තු වේ.<br><br>1. හක්මන නාගරික සංවර්ධන බල ප්‍රදේශය තුල මාර්ග තදබදය අවම කිරීම.<br>2. ආකාරයට සංවර්ධනය වූ මාර්ග පද්ධතියක් ඇති කිරීම.<br>3. රථ වාහන නැවතුම් පහසුකම් ලබාදීම.<br>4. නගර අලංකරණය.<br>5. නගරයට පැමිණෙන හා නගරය හරහා ගමන් ගන්නා මහජනතාවට අවශ්‍ය සේවා පහසුකම් සැලසීම.<br><br>නාගරික සංවර්ධන අධිකාරිය මගින් සකස් කරනු ලබන නගර සංවර්ධන සැලැස්ම තුලින් මෙම ව්‍යාපෘති හඳුනාගෙන ඇති අතර, ඉහත ප්‍රතිලාභ හක්මන ජනතාවට හා පිටතින් පැමිණෙන ජනතාවට ලබාදීමට අපේක්ෂිතය. |
| ව්‍යාපෘතියේ අවශ්‍යතාවය | හක්මණ නගරය දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ නැගෙනහිර මායිමෙහි පිහිටා ඇත. එසේම යාබද නගර අතර අරීය විහිදුනු මාර්ග ජාලයකින් හක්මණ නගරය සම්බන්ධ වී ඇත. ඒ අනුව, මාතර, කඹුරුපිටිය, වලස්මුල්ල, බෙලිඅත්ත වැනි උපකලාපීය සේවාපථයක් ඇති නාගරික මධ්‍යස්ථාන සමග දෙවන පෙළ මාර්ග පද්ධතියක් මගින් සම්බන්ධ වී ඇත. හක්මණ නගරයට සංක්‍රමණය වන දෛනික සංක්‍රමන ජනගහනය 7,500 – 8,000 ක් අතර ප්‍රමාණයක් දෛනික සේවා හා වෙනත් අවශ්‍යතා සඳහා පැමිණේ.<br><br>වර්තමානයේ හම්බන්තොට නගරය කේන්ද්‍ර කරගත් සංවර්ධන ව්‍යාපෘතීන් වන දක්ෂිණ අධිවේගී මාර්ගය, මාතර - කතරගම දුම්රිය මාර්ගය වැනි මාර්ග සංවර්ධන ව්‍යාපෘතීන් හක්මණ නගරයේ සංවර්ධනයට අවස්ථාවක් ලෙස හැඳින්විය හැකි අතර, මේ හේතුවෙන් මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය ඉතා වැදගත් සාධකයකි. එසේම, රාජ්‍ය ආයතන පාසල් හා වෙනත් සේවා අවශ්‍යතා සඳහා හක්මන නගරයට, බෙලිඅත්ත, කිරින්ද, වලස්මුල්ල, කඹුරුපිටිය, මාතර ආදී ප්‍රදේශ වලින් දෛනිකව පැමිණෙන 7500 – 8000 ත් අතර වන ජනතාවට අවශ්‍යවන සේවා පහසුකම් සැපයීමේදී මෙම මාර්ග සංවර්ධනය ඉතා වැදගත් වේ. |

**ව්‍යාපෘති විස්තරය**

| වර්තමාන ඉඩම් හිමිකම | පුද්ගලික | | රජයේ | √ | වෙනත් | |
|---|---|---|---|---|---|---|



**ව්‍යාපෘති විස්තරය**

| ව්‍යාපෘති කාලය | කෙටි කාලීන (වසර 1) | | මධ්‍ය කාලීන (වසර 1-3) | √ | දිගු කාලීන (වසර 3) | | මුළු ඇස්තමේන්තු ගත පිරිවැය | |
|---|---|---|---|---|---|---|---|---|
| මූල්‍ය ක්‍රමය | | | | | | | | |
| ව්‍යාපෘතියේ විස්තරය |   | | | | නගර සංවර්ධන සැලැස්ම යටතේ මාර්ග අංශ කිහිපයකින් සංවර්ධනය කිරීමට තෝරාගෙන ඇත. ඒ අනුව, ප්‍රධාන මාර්ගය සංවර්ධනය, වටරවුම් මාර්ග සංවර්ධනය, නව මාර්ග සංවර්ධනය සහ අතුරු මාර්ග සංවර්ධනය වශයෙනි. ප්‍රධාන මාර්ග සංවර්ධනය යටතේ බී ශ්‍රේණියේ මාර්ග නගර සීමාවේදී මංතීරු 02ක් සහිතව සංවර්ධනය කිරිමට යෝජිතය. | | | |
| යටිතල පහසුකම් ලබා ගැනීම. | ජලය | | | | විදුලිය | | | |
| | ඝන අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතිය | ඔව් | | නැත. | | | සුදුසු නොවේ SWM යෝජනාව ඉදිරිපත් කරන්න | |
| කලාපය | | | | කලාපීය අනුකූලතාව | ඔව් | | නැත | |

| ව්‍යාපෘති මාතෘකාව | හක්මන නගර සංවර්ධන ව්‍යාපෘතිය |
|---|---|
| ව්‍යාපෘතිය | බස් නැවතුම්පල හා අවට සංවර්ධනය |
| ව්‍යාපෘති යෝජනාව | කාර්යක්ෂම ගමනාගමන රටාවක් සහ ඊට අවශ්‍ය සේවාවක් සැපයීම. |

| | |
|---|---|
| | |

**ව්‍යාපෘති ස්ථානය**

| | | | | |
|---|---|---|---|---|
| **ස්ථානය** | **පළාත** | **දකුණු පළාත** | **දිස්ත්‍රික්කය** | **මාතර** |
| | **ප්‍රා.ලේ. කොට්ඨාශය** | **හක්මන** | **පළාත් පාලන ආයතනය** | **හක්මන ප්‍රා.ස.** |
| **මායිම්** | උතුරු | නැගෙනහිර | දකුණු | බටහිර |
| | සමූපකාර ඉඩම | කුඹුර | හක්මන - වලස්මුල්ල ප්‍රධාන මාර්ගය | පුද්ගලික ඉඩම් |
| **ප්‍රවේශය** | හක්මන - වලස්මුල්ල මාර්ගය | | | |
| **පිහිටීම සිතියම** |   | | | |
| **යාබද ඉඩම් පරිහරණය** |  මෙම ව්‍යාපෘතිය සඳහා දැනට බස් නැවතුම්පලට අයත් භූමිය සහ යාබද ප්‍රාදේශීය සභාවට අයත් ඉඩම් කොටස යොදා ගන්නා අතර, ඊට අමතරව පුද්ගලික ඉඩම් සහ කුඹුරු ඉඩම් කොටසක් පවරා ගැනීමට යෝජිතය. නගරයේ ප්‍රධාන වාණිජ කලාපය තුල මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන අතර, අවම රජයේ කාර්යාල සහ වාණිජ කටයුතු | | | |

**ව්‍යාපෘති සාධාරණීකරණය**



| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ව්‍යාපෘති වර්ගය | නව | | වැඩිදියුණු කිරීම | √ | ව්‍යාපෘතිය | | ඉඩම් සංවර්ධනය පමණක් |
| ව්‍යාපෘති වර්ගය | සංරක්ෂණ | වාණිජ | භූ දර්ශනය සහ විනෝද කටයුතු | උරුමය | නිවාස | **ප්‍රතිස්ථාපනය** | **යටිතල පහසුකම්** |
| | | √ | √ | | | √ | √ |
| ව්‍යාපෘති අංශ | පාරිසරික | | ආර්ථික | √ | සමාජ | | √ |
| ව්‍යාපෘතියේ අරමුණු | 1. ඉඩ පහසුකම් සහිත නවීකරණය කළ බස් නැවතුම්පලක් ඉදිකිරිම.<br>2. දැනට පවත්නා බස් නැවතුම්පලෙහි හා ප්‍රාදේශීය සභාව සතු වාණිජ ඉඩකඩෙහි පවතින තදබදය හා අවිධිමත්භාවය නිසා මහජනතාවට ඇතිවන අපහසුතාවය අවම කිරිම. | | | | | | |
| ව්‍යාපෘතියේ අවශ්‍යතාවය | 1. දැනට පවත්නා බස් නැවතුම්පල ගොඩනැගිල්ලේ ප්‍රමාණවත් ඉඩකඩ පහසුකම් නොමැති බැවින් නව බස් නැවතුම් ස්ථාන 02ක් සහ රථගාලක් සහිතව බස් නැවතුම්පල ප්‍රතිසංවර්ධනය කිරිම.<br>2. මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය හේතුවෙන් ව්‍යාපාරික ස්ථාන අහිමිවූවන්ට ව්‍යාපාරික ස්ථාන ලබාදීම. | | | | | | |

**ව්‍යාපෘති විස්තරය**

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| **වර්තමාන ඉඩම් හිමිකම** | පුද්ගලික | √ | රජයේ | √ | වෙනත් | |
| **හිමිකම පිළිබඳ විස්තර** | පුද්ගලික ඉඩම් කොටසක් පවරා ගැනීමට යෝජිතය. පවතින බස් නැවතුම්පල ඉඩම ප්‍රාදේශීය සභාව සතුවේ. | | | | | |
| **මැනුම් සැලැස්මේ විස්තර** | **පිඹුරු අංකය** | | **මිනින්දෝරුවරයාගේ නම** | | **දිනය** | **ඉඩම් ප්‍රමාණය** |

**ව්‍යාපෘති විස්තරය**

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ව්‍යාපෘති කාලය | **කෙටි කාලීන (වසර 1)** | | **මධ්‍ය කාලීන (වසර 1-3)** | √ | **දිගු කාලීන (වසර 3)** | | **මුළු ඇස්තමේන්තු ගත පිරිවැය** | |
| **මූල්‍ය ක්‍රමය** | මහා භාණ්ඩාගාර අරමුදල් සහ පෙර විකුණුම් මුදල් | | | | | | | |
| **ව්‍යාපෘතියේ විස්තරය** | <br>බස් නැවතුම්පල දෙවන අදියර ඉදිකිරිම, පොරොත්තු ලේඛණයේ ඇති බස් රථ නවතා තැබීම සඳහා ඉඩකඩ වෙන්කිරිම, මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය හේතුවෙන් ව්‍යාපාරික ස්ථාන අහිමිවූවන්ට ව්‍යාපාරික ස්ථාන ලබාදීම | | | | | | | |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| **යටිතල පහසුකම් ලබා ගැනීම** | **ජලය**<br>ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය | | | | | **විදුලිය**<br>ලංකා විදුලි බල මණ්ඩලය | | |
| | ඝන අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතිය | ඔව් | √ | නැත. | | | සුදුසු නොවේ SWM යෝජනාව ඉදිරිපත් කරන්න | |
| **කලාපය** | සනත්ව කලාපය | | | කලාපීය අනුකූලතාව | | ඔව් | √ | නැත |
| **වර්තමාන තත්ත්වය** | පවතින බස් නැවතුම්පල, වාණිජ ස්ථාන 02ක් සහ මුලටියන ඩිපෝවෙහි උප කාර්යාලය පවතී. | | | | | | | |
| **සැලසුම් කළ සැලැස්ම හා ගොඩනැඟිලි සැලසුම් කිරීමේ අවශ්‍යතා** |   | | | | | | | |



**අනුමත කරන ආයතන**

| | අදාල වන ආයතන | වගකිව යුතු ආයතන |
|---|---|---|
| **ක්‍රියාකාරිත්වය** | හක්මන ප්‍රාදේශීය සභාව<br>ගොඩනැගිලි දෙපාර්තමේන්තුව<br>නාගරික සංවර්ධන අධිකාරිය | ලේකම් (හක්මන ප්‍රාදේශීය සභාව)<br>ප්‍රධාන ඉංජිනේරු<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ (සැලසුම්) |

| | නීති රීති | මාර්ගෝපදේශ |
|---|---|---|
| **රෙගුලාසි සහ මාර්ගෝපදේශ** | නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් හා ගොඩනැගිලි රෙගුලාසි | සංවර්ධන සැලැස්මේ සනත්ව කලාපයට අයත් රෙගුලාසි |

## 6.7.2 ආයතනික රාමුව

**හක්මන නාගරික සංවර්ධන ප්‍රදේශය : යෝජිත සංවර්ධන ව්‍යාපෘති සාරාංශය**

| අනු අංකය | ව්‍යාපෘතියේ නම හා විස්තරය | පිහිටීම | අයිතිය | ඉඩමේ ප්‍රමාණය | මූල්‍ය මූලාශ්‍රය | දළ ඇස්තමේන්තුව රු. මි. | වගකිව යුතු ආයතන | ව්‍යාපෘති කාලය | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | කෙටි කාලීන | මධ්‍ය කාලීන | දිගු කාලීන |
| 1 | නව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ඉදිකිරීම | අබේවික්‍රම මාවතේ ගොවිජන සේවා කාර්යාලයට යාබද ඉඩම | රජය | අක් 02 | මහා භාණ්ඩාගාරය | 300.0 | හක්මන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, නාගරික සංවර්ධන අධිකාරිය, ගොඩනැගිලි දෙපාර්තමේන්තුව | | ✓ | |
| 2 | රටා වී වගාව පදනම් කරගත් කෘෂි උපදේශන හා කෘෂි භෝග අලෙවි මධ්‍යස්ථානයක් ඉදිකිරීම. | පොල භූමිය ඉදිරිපස කුඹුරු ඉඩම | පෞද්ගලික | අක් 04 | හදබිම අධිකාරිය | 50.0 | කෘෂි කර්ම දෙපාර්තමේන්තුව, හක්මන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, නාගරික සංවර්ධන අධිකාරිය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව | | ✓ | |
| 3 | බුද්ධ ජයන්ති විද්‍යාලය ඉදිකිරීම හා පාරම්පරික කෘෂි කර්මය පදනම් කරගත් අධ්‍යාපනික මධ්‍යස්ථානයක් ඉදිකිරීම | දැනට බුද්ධ ජයන්ති විද්‍යාලය පවතින භූමියේ ඉදිරිපස භූමිය | රජය | අක් 03 | අධ්‍යාපන දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරය | 400 | අධ්‍යාපන දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, නාගරික සංවර්ධන අධිකාරිය. | | ✓ | |

| අනු අංකය | ව්‍යාපෘතියේ නම හා විස්තරය | පිහිටීම | අයිතිය | ඉඩමේ ප්‍රමාණය | මූල්‍ය මූලාශ්‍රය | දළ ඇස්තමේන්තුව රු. මි. | වගකිව යුතු ආයතන | ව්‍යාපෘති කාලය | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | කෙටි කාලීන | මධ්‍ය කාලීන | දිගු කාලීන |
| 4 | සතිපොළ සංවර්ධන ව්‍යාපෘතිය | මුරුතමුරය මාර්ගයට සමාන්තරව දැනට පවතින පොල භූමියට පිටුපස කොටස | පෞද්ගලික | අක්. 01 | මහා භාණ්ඩාගාරය | 80.0 | හක්මන ප්‍රාදේශීය සභාව නාගරික සංවර්ධන අධිකාරිය. | | ✓ | |
| 5 | මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය | - | රජය | - | මහා භාණ්ඩාගාරය | - | මාර්ග සංවර්ධන අධිකාරිය හක්මන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | | ✓ | |
| 6 | දෙමහල් වාණිජ සංකීර්ණය හා මහජන රථගාල ඉදිකිරිම. | දැනට මහජන පොල පවතින භූමිය | රජය | අක්. 01 | පෙර විකුණුම් (Pre Sale) | 100.0 | හක්මන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, හක්මන ප්‍රාදේශීය සභාව, නාගරික සංවර්ධන අධිකාරිය | | ✓ | |
| 7 | බස් නැවතුම් පොල හා අවට සංවර්ධන ව්‍යාපෘතිය | දැනට බස් නැවතුම් පොල පවතින භූමිය | රජය | අක්. 01 පර්. 12.0 | පෙර විකුණුම් හා මහා භාණ්ඩාගාරය | 175.0 | හක්මන ප්‍රාදේශීය සභාව, මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය, මාර්ග සංවර්ධන අධිකාරිය, නාගරික සංවර්ධන අධිකාරිය. | | ✓ | |

# ඇමුණුම්

## ඇමුණුම අංක 01

**ප්‍රධාන උපදේශන ආයතනය - ප්‍රාදේශීය සභාව - හක්මන**

**2017.12.17 දින පැවති පාර්ශවකරුවන්ගේ රැස්වීම සඳහා සහභාගී වූ නිලධාරීන්ගේ නාම ලේඛණය**

| පාර්ශවකරුවන් | තනතුර |
|---|---|
| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - හක්මන | ප්‍රාදේශීය ලේකම් |
| ප්‍රාදේශීය සභාව - හක්මන | ලේකම්, තාක්ෂණ සේවා නිලධාරී, |
| ප්‍රාදේශීය සභාව - හක්මන | සංවර්ධන නිලධාරී |
| පුරාවිද්‍යා කාර්යාලය - ගාල්ල | සහකාර අධ්‍යක්ෂ |
| ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය- හක්මන | ඩිපෝ අධිකාරී |
| මාර/ කෝංගල මහා විද්‍යාලය- හක්මන | විදුහල්පති |
| මාර/මෙතෝදිස්ත මධ්‍ය මහා විද්‍යාලය | විදුහල්පති |
| කලාප අධ්‍යාපන කාර්යාලය- හක්මන | සහකාර අධ්‍යක්ෂ |
| රුහුණු විශ්ව විද්‍යාලය - මාතර | ශිෂ්‍ය - භූගෝල විද්‍යා අධ්‍යනාංශය |
| මගී ප්‍රවාහන අධිකාරිය - දකුණු පළාත් කාර්යාලය | සහකාර අධ්‍යක්ෂ |
| මධ්‍යම පරිසර අධිකාරිය - මාතර | ප්‍රාදේශීය පරිසර නිලධාරී |
| වාරි මාර්ග දෙපාර්තමේන්තුව- මාතර | සහකාර අධ්‍යක්ෂ |
| පොල් වගා කිරීමේ මණ්ඩලය- මාතර | පොල් වගා කිරීමේ නිලධාරී |
| විදුලි බල මණ්ඩලය- මාතර | විදුලි අධිකාරී |
| විවිධ සේවා සමූපකාර සමිතිය - හක්මන | සභාපති |
| ගොවිජන සේවා කාර්යාලය - හක්මන | ගොවිජන සංවර්ධන නිලධාරී |
| ජාතික නිවාස සංවර්ධන අධිකාරිය- මාතර | සහකාර ඉංජිනේරු |
| සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය - හක්මන | මහජන සෞඛ්‍ය පරීක්ෂක |
| ජාතික ජල සම්පාදන මණ්ඩලය - මාතර | ස්ථාන භාර නිලධාරී |
| මාර්ග සංවර්ධන අධිකාරිය - මාතර | ප්‍රධාන ඉංජිනේරු |
| අපනයන කෘෂි කර්ම දෙපාර්තමේන්තුව - මාතර | අපනයන කෘෂිකර්ම ව්‍යාප්ත නිලධාරී |
| ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය | භූ විද්‍යාඥ |
| තැපැල් කාර්යාලය - හක්මන | තැපැල් ස්ථානාධිපති |
| නාගරික සංවර්ධන අධිකාරිය - ගාල්ල | අධ්‍යක්ෂ (දකුණු පළාත) |
| නාගරික සංවර්ධන අධිකාරිය - මාතර | නියෝජ්‍ය අධ්‍යක්ෂ, (සැලසුම්) |
| ගොවි සංවිධාන - හක්මන | සභාපති |
| ග්‍රාම නිලධාරී - හක්මන | |
| විද්‍යාතා මධ්‍යස්ථානය - හක්මන | සම්බන්ධීකාරක |
| සැලසුම් කණ්ඩායම | නා. සංවර්ධන අධිකාරිය |

## ඇමුණුම අංක 02

**ව්‍යාපෘති ප්‍රමුඛතා ගත කිරීම**

**සංවර්ධන සැලැස්මේ දැක්ම අනුව ව්‍යාපෘති ප්‍රමුඛතා ගත කිරීම**

| | මාර්ග සංවර්ධනය ව්‍යාපෘතිය | සතිපොළ සංවර්ධන ව්‍යාපෘතිය | මහජන පොළ ප්‍රති සංවර්ධන ව්‍යාපෘතිය | බස්නැවතුම්පළ හා අවට සංවර්ධන ව්‍යාපෘතිය | බස් ඩිපෝව ප්‍රතිස්ථාපනගත කිරීම | තානායම ඉදිකිරීම | කෘෂි සංචාරක ප්‍රවර්ධන මධ්‍යස්ථාන සහ රටා වී වගාව සිදු කිරීම | පිහිනුම් තටාකය හා ක්‍රීඩාපහසුකම් සංවර්ධනය | යෝජිත බුද්ධ ජයන්ති විද්‍යාලය ඉදිකිරීම | තැපැල් කාර්යාලය ප්‍රතිසංවර්ධන ව්‍යාපෘතිය | නව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ඉදිකිරීම | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| මාර්ග සංවර්ධනය ව්‍යාපෘතිය | 0 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 0 | 1 | 1 | **9** |
| සතිපොළ සංවර්ධන ව්‍යාපෘතිය | 0 | 0 | 0 | 1 | 1 | 1 | 0 | 1 | 0 | 1 | 1 | **6** |
| මහජන පොළ ප්‍රති සංවර්ධන ව්‍යාපෘතිය | 0 | 1 | 0 | 1 | 1 | 1 | 0 | 1 | 0 | 1 | 1 | **7** |
| බස්නැවතුම්පළ හා අවට සංවර්ධන ව්‍යාපෘතිය | 1 | 1 | 0 | 0 | 0 | 1 | 0 | 1 | 0 | 1 | 1 | **6** |
| බස් ඩිපෝව ප්‍රතිස්ථාපනගත කිරීම | 1 | 1 | 0 | 1 | 0 | 1 | 0 | 1 | 0 | 1 | 1 | **7** |
| තානායම ඉදිකිරීම | 1 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 1 | 0 | 1 | 1 | **5** |
| කෘෂි සංචාරක ප්‍රවර්ධන මධ්‍යස්ථාන සහ රටා වී වගාව සිදු කිරීම | 1 | 1 | 1 | 1 | 1 | 1 | 0 | 1 | 1 | 1 | 1 | **10** |
| පිහිනුම් තටාකය හා ක්‍රීඩාපහසුකම් සංවර්ධනය | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | **2** |
| යෝජිත බුද්ධ ජයන්ති විද්‍යාලය ඉදිකිරීම | 1 | 1 | 1 | 1 | 1 | 1 | 0 | 1 | 0 | 1 | 1 | **9** |
| තැපැල් කාර්යාලය ප්‍රතිසංවර්ධන ව්‍යාපෘතිය | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | **0** |
| නව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ඉදිකිරීම | 0 | 0 | 0 | 1 | 1 | 0 | 0 | 0 | 0 | 1 | 0 | **3** |

**1. වැදගත්කම අනුව ව්‍යාපෘති ප්‍රමුඛතා ගත කිරිම**

| | මාර්ග සංවර්ධනය ව්‍යාපෘතිය | සතිපොළ සංවර්ධන ව්‍යාපෘතිය | මහජන පොළ ප්‍රති සංවර්ධන ව්‍යාපෘතිය | බස්නැවතුම්පළ හා අවට සංවර්ධන ව්‍යාපෘතිය | බස් ඩිපෝව ප්‍රතිස්ථානගත කිරීම | තානායම ඉදිකිරීම | කෘෂි සංචාරක ප්‍රවර්ධන මධ්‍යස්ථාන සහ රටා වී වගාව සිදු කිරීම | පිහිනුම් තටාකය හා ක්‍රීඩාපහසුකම් සංවර්ධනය | යෝජිත බුද්ධ ජයන්ති විද්‍යාලය ඉදිකිරීම | තැපැල් කාර්යාලය ප්‍රතිසංවර්ධන ව්‍යාපෘතිය | නව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ඉදිකිරීම | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| මාර්ග සංවර්ධනය ව්‍යාපෘතිය | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 1 | 0 | 1 | 1 | 4 |
| සතිපොළ සංවර්ධන ව්‍යාපෘතිය | 0 | 0 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 0 | 1 | 1 | 8 |
| මහජන පොළ ප්‍රති සංවර්ධන ව්‍යාපෘතිය | 1 | 0 | 0 | 1 | 1 | 1 | 0 | 1 | 1 | 1 | 1 | 8 |
| බස්නැවතුම්පළ හා අවට සංවර්ධන ව්‍යාපෘතිය | 1 | 0 | 0 | 0 | 1 | 1 | 1 | 1 | 0 | 1 | 1 | 7 |
| බස් ඩිපෝව ප්‍රතිස්ථානගත කිරීම | 0 | 0 | 0 | 0 | 0 | 1 | 1 | 1 | 0 | 1 | 1 | 5 |
| තානායම ඉදිකිරීම | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 1 | 0 | 1 | 1 | 4 |
| කෘෂි සංචාරක ප්‍රවර්ධන මධ්‍යස්ථාන සහ රටා වී වගාව සිදු කිරීම | 1 | 1 | 1 | 1 | 1 | 1 | 0 | 1 | 1 | 1 | 1 | 10 |
| පිහිනුම් තටාකය හා ක්‍රීඩාපහසුකම් සංවර්ධනය | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 1 |
| යෝජිත බුද්ධ ජයන්ති විද්‍යාලය ඉදිකිරීම | 1 | 1 | 1 | 1 | 1 | 1 | 0 | 1 | 0 | 1 | 1 | 9 |
| තැපැල් කාර්යාලය ප්‍රතිසංවර්ධන ව්‍යාපෘතිය | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| නව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ඉදිකිරීම | 0 | 0 | 0 | 0 | 1 | 1 | 0 | 0 | 1 | 1 | 0 | 4 |

## 2. සමාජ ප්‍රතිලාභ අනුව ව්‍යාපෘති ප්‍රමුඛතා ගත කිරීම

| | මාර්ග සංවර්ධනය ව්‍යාපෘතිය | සතිපොළ සංවර්ධන ව්‍යාපෘතිය | මහජන පොළ ප්‍රති සංවර්ධන ව්‍යාපෘතිය | බස්නැවතුම්පළ හා අවට සංවර්ධන ව්‍යාපෘතිය | බස් ඩිපෝව ප්‍රතිස්ථානගත කිරීම | තානායම ඉදිකිරීම | කෘෂි සංචාරක ප්‍රවර්ධන මධ්‍යස්ථාන සහ රටා වී වගාව සිදු කිරීම | පිහිනුම් තටාකය හා ක්‍රීඩාපහසුකම් | යෝජිත බුද්ධ ජයන්ති විද්‍යාලය ඉදිකිරීම | තැපැල් කාර්යාලය ප්‍රතිසංවර්ධන ව්‍යාපෘතිය | නව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ඉදිකිරීම | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| මාර්ග සංවර්ධනය ව්‍යාපෘතිය | 0 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | **10** |
| සතිපොළ සංවර්ධන ව්‍යාපෘතිය | 1 | 0 | 0 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | **9** |
| මහජන පොළ ප්‍රති සංවර්ධන ව්‍යාපෘතිය. | 0 | 1 | 0 | 0 | 1 | 1 | 1 | 1 | 0 | 1 | 0 | **6** |
| බස්නැවතුම්පළ හා අවට සංවර්ධන ව්‍යාපෘතිය | 0 | 1 | 1 | 0 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | **9** |
| බස් ඩිපෝව ප්‍රතිස්ථානගත කිරීම | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 1 | 0 | 1 | 0 | **3** |
| තානායම ඉදිකිරීම | 0 | 0 | 0 | 0 | 1 | 0 | 1 | 0 | 0 | 0 | 0 | **2** |
| කෘෂි සංචාරක ප්‍රවර්ධන මධ්‍යස්ථාන සහ රටා වී වගාව සිදු කිරීම | 0 | 1 | 0 | 0 | 1 | 1 | 0 | 1 | 1 | 1 | 1 | **7** |
| පිහිනුම් තටාකය හා ක්‍රීඩාපහසුකම් සංවර්ධනය | 0 | 0 | 0 | 0 | 1 | 1 | 0 | 0 | 0 | 0 | 1 | **3** |
| යෝජිත බුද්ධ ජයන්ති විද්‍යාලය ඉදිකිරීම | 0 | 1 | 0 | 0 | 1 | 1 | 1 | 1 | 0 | 1 | 1 | **7** |
| තැපැල් කාර්යාලය ප්‍රතිසංවර්ධන ව්‍යාපෘතිය | 0 | 0 | 0 | 0 | 1 | 1 | 1 | 1 | 0 | 0 | 0 | **4** |
| නව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ඉදිකිරීම | 0 | 0 | 0 | 0 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 0 | **6** |

## ඇමුණුම අංක 03

**හක්මන නාගරික බල ප්‍රදේශයේ තෙත්බිම් කලාපය සඳහා වූ මාර්ගෝපදේශ**

i. දේශගුණික විපර්යාස හේතුවෙන් ඇති වන ආන්තික කාලගුණික තත්ත්වයන්වල තීව්‍රතාවය වැඩිවීම හා තෙත් බිම්වල සිදු කර ඇති ගොඩ කිරීම් හා ඉදිකිරීම් හේතුවෙන් වැසි ජලය ගලා යන තීව්‍රතාවය සැළකිල්ලට ගනිමින් ගංවතුර ධාරිතාවය නඩත්තු කිරීම සහ අනෙකුත් සංවර්ධන කටයුතු පහත උපලේඛනයේ සඳහන් ආයතනවල සම්බන්ධීකරණය තුළින් ලබා ගන්නා තීරණ අනුව සිදු කළ යුතුය.

ii. පහත් බිම් / පුරන් කුඹුරු සහ වගා කුඹුරු සංවර්ධනය කිරීමට පෙර නාගරික සංවර්ධන අධිකාරියේ 1990 සැප්තැම්බර් මස 29 වන දින නිකුත් කර ඇති සැලසුම් චක්‍රලේඛ අංක. 13 (12.7, 12.8) ට අනුව පහත උපලේඛනයේ සඳහන් අංක. 01, 03, 04, 05 හා 09 දරණ ආයතන වලින් අනුමැතිය ලබා ගත යුතුය. එසේම විවිධ පනත් මගින් තෙත් බිම්වල අයිතිය අදාළ ආයතන වල විෂය පථයට අයත් වන අවස්ථාවලදී උපලේඛනයේ සඳහන් ආයතනවලින් සහ අනෙකුත් අදාළ ආයතනවලින් අවශ්‍ය නිර්දේශය සහ අනුමැතිය ලබා ගත යුතුය.

iii. තෙත් බිම් ආශ්‍රිත පරිසරයට බලපෑම් ඇති විය හැකි ඕනෑම සංවර්ධන කටයුත්තක් සඳහා පහත උපලේඛනයේ සඳහන් අංක. 03 හා 05 දරණ ආයතනවලින් පරිසර නිරවුල් කිරීමේ සහතිකය හෝ පරිසර ආරක්ෂණ බලපත්‍රය ලබා ගත යුතු අතර නියමිත කාලය ඉක්මවීමට පෙර එකී බලපත්‍රය වාර්ෂිකව යාවත්කාලීන කළ යුතුය.

iv. පහත උපලේඛනයේ සඳහන් අංක. 01 දරණ ආයතනයට අයත් තෙත් බිමක් සංවර්ධන කාර්යයක් සඳහා ලබා දෙන නිර්දේශ/අනුමැතිය (අවසන් නිරවුල් සහතිකය) එම සැලසුම් කමිටු තීරණය පරිදි වාර්ෂිකව අලුත් කළ යුතුය.

v. පහත උපලේඛනයේ සඳහන් අංක. 01,02 දරණ ආයතන මඟින් ප්‍රකාශිත ඇල මාර්ග/ජලාශ රක්ෂිත බිම් තීරු පවත්වා ගත යුතුය.

vi. ජල බැස යාම් හා ගංවතුර රැඳවුම් ධාරිතාවයන්ට බාධා වන කිසිම ඉදිකිරීමක් තෙත් බිමක ජලාශ්‍රිතව හෝ ජල මාර්ගවල සිදු නොකළ යුතුය.නමුත් මහා සැලසුමකට (Master Plan) හෝ නිර්මාණ උපදේශක මාර්ගෝපදේශ සැලැස්මකට අනුව නාගරික සංවර්ධන අධිකාරිය මඟින් අනුමත කරන ලද විශේෂ ව්‍යාපෘතීන්ට හෝ ජල ගැලීම්වලට හා ගංවතුර ඉසිලුම් ධාරිතාවයන්ට බාධා නොවන ලෙස අනුමත ඉදිකිරීම් පහත උපලේඛනයේ සඳහන් අංක. 01 දරණ ආයතනයෙන් හා අංක. 02 සිට 18 දක්වා ඇති අදාළ ආයතනයන්වල නිර්දේශය හා අනුමැතියට යටත්ව සිදු කළ යුතුය.

vii. පාරිසරික සංවේදී වටිනාකම සහිත තෙත් බිම්වල ආගන්තුක ආක්‍රමණශීලී ශාක හා සතුන් හැර වෙනත් වන ජීවීන් ඉවත් නොකළ යුතුය.

viii. තෙත් බිම් කලාපවල අවසරලත් සෑම ඉදිකිරීමක්ම නියම කරන ලද ශිල්පීය ප්‍රමිතීන් සහිත හරිත ගොඩනැගිලි සංකල්පයට අනුව නිර්මාණය විය යුතුය.

ix. ජල රැඳවුම් ධාරිතාවය විශේෂයෙන් වැදගත් වන සෑම තෙත් බිමකම සිදු කරන අනුමත භාවිතයකදී ජල රැඳවුම් ධාරිතාව අඩුවීම සහ (අනෙකුත් බලපෑම් සිදුවන) පාරිසරික සේවාවන්ට සිදුවන බලපෑමට විකල්ප ස්ථාන සුදුසු ලෙස ස්ථාපනය කල යුතුය. ඒ සඳහා පහත උපලේඛනයේ සඳහන් අදාළ ආයතනවල අනුමැතිය ලබාගත යුතුය.

x. තෙත්බිම් පිරවීම සඳහා නිර්දේශ වන උපලේඛනයේ අංක 01 හි සඳහන් ආයතනයට අයත් ප්‍රදේශවල තිරසාර වැසි ජල බැස යාමේ ක්‍රම භාවිතා කල යුතුයි. තෙත්බිම් පිරවීම සඳහා යොදා ගන්නා ද්‍රව්‍ය පිළිබඳ මධ්‍යම පරිසර අධිකාරියෙන් අනුමැතිය ලබා ගත යුතුය.

xi. පැහැදිලිව හඳුනාගත හැකි භූ දර්ශන / සංස්කෘතික / පුරා විද්‍යාත්මක / ජෛව විවිධත්වය ඉහළ අගයන් ඇති ප්‍රදේශ සංරක්ෂණය කල යුතුය.

xii. තෙත් බිම්වල අනුමත කාර්යයන්වලදී නීත්‍යානුකූල වූ පොදු අඩි පාරවල්, පොදු නාන ස්ථාන සංරක්ෂණය කිරීම හෝ ඒවා සුදුසු ළඟම ස්ථානයක ස්ථාන ගත කල යුතුයි.

xiii. සංවර්ධනකරුවන් විසින් සැලසුම් සකස් කිරීම හා නිර්මාණ සහ අධීක්ෂණ කටයුතු කිරීම සඳහා වෘත්තීය සුදුසුකම්ලත් වෘත්තීයවේදීන්ගේ සේවය ලබා ගත යුතුය.

xiv. තෙත් බිම්වලට කසළ බැහැර කිරීම සඳහා අවසර නොදිය යුතුය.(ගෘහස්ථ, ආයතනික, කාර්මික, වෙළඳ, විද්‍යුත්, සහ සායනික අපද්‍රව්‍ය)

xv. තෙත්බිම්වලට අපජලය බැහැර නොකළ යුතුය. නමුත් මධ්‍යම පරිසර අධිකාරියේ නිර්දේශයට යටත්ව පිරිපහදු කළ ජලය පමණක් මුදාහැරිය හැකිය.

**තෙත්බිම් කලාපය සම්බන්ධයෙන් සංවර්ධන කටයුතු සිදුකිරීමේදී උපලේඛනයේ සඳහන් ආයතනයන්හි බලපත්‍ර නිකුත් කිරීමේදී මෙම මාර්ගෝපදේශයන් එම බලපත්‍රයට කොන්දේසි ලෙස ඇතුලත් කල යුතු අතර එකී කොන්දේසි කඩකිරීම එකී බලපත්‍රය අවලංගු කිරීමට හෝ දඩුවම් නියම කිරීමට හේතුවනු ඇත.**

## 01. උපලේඛනය

01. ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව
02. වාරිමාර්ග දෙපාර්තමේන්තුව
03. මධ්‍යම පරිසර අධිකාරිය
04. නාගරික සංවර්ධන අධිකාරිය
05. අදාළ පළාත් පාලන ආයතනය/ආයතන
06. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව
07. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව
08. ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය
09. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
10. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
11. භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශය
12. දකුණු පළාත් සභාව
13. ජල සම්පත් මණ්ඩලය
14. ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලය
15. ශ්‍රී ලංකා ගොඩනැගිලි දෙපාර්තමේන්තුව
16. මාර්ග සංවර්ධන අධිකාරිය
17. දිස්ත්‍රික් ලේකම් සහ ප්‍රාදේශීය ලේකම්
18. ශ්‍රී ලංකා නාවික හමුදාව

## ඇමුණුම අංක 04

හක්මන නාගරික බල ප්‍රදේශය සඳහා යෝජිත පොදු එළිමහන් අවකාශීය සැලැස්ම

| අනු අංකය | උද්‍යාන වර්ගය | වර්තමාන භාවිතය | ප්‍රමාණය (හෙක්ටයාර්) | යෝජිත භාවිතය | ප්‍රමාණය (හෙක්ටයාර්) | ග්‍රාම නිළධාරී කොට්ඨාශය |
|---|---|---|---|---|---|---|
| **01.** | **යෝජිත අසල උද්‍යාන (Proposed Local Park)** | | | | | |
| | PLP 01 | මිශ්‍ර කෘෂිකර්මය | 1.27 | අසල උද්‍යාන | 1.27 | කෝංගල නැගෙනහිර |
| | PLP 02 | පොල් වගාව | 2.47 | අසල උද්‍යාන | 1.13 | ගම්මැදපිටය |
| | | | | | | |
| 02. | **යෝජිත කුඩා උද්‍යාන (Proposed Mini Park)** | | | | | |
| | PMP 01 | මුඩු බිම් | 0.32 | කුඩා උද්‍යාන | 0.32 | මුරුතමුරය බටහිර, වේපතඉර දකුණ |
| | PMP 02 | ගෙවතු | 6.30 | කුඩා උද්‍යාන | 0.20 | මුරුතමුරය බටහිර |
| | | | | | | |
| 03. | **යෝජිත ඉතා කුඩා උද්‍යාන (Proposed Pocket Park)** | | | | | |
| | PPP 01 | මුඩු බිම් | 0.16 | ඉතා කුඩා උද්‍යාන | 0.16 | මුරුතමුරය නැගෙනහිර |
| | PPP 02 | මුඩු බිම් | 0.15 | ඉතා කුඩා උද්‍යාන | 0.15 | වේපතඉර දකුණ |
| | | | | | **එකතුව : හෙක්ටයාර් 3.23** | |